
මෛත්‍රී
පාලනයක්...
ස්ථාවර රටක්



අතිගරු ජනාධිපතිතුමාගේ පණිවුඩය

2015 ජනවාරි 08 වන දින ශ්‍රී ලාංකික ජනතාව මා වෙත පැවරූ ජනවරම ඓතිහාසික එකක් වන්නේ, එය ජනතාව මා සමඟ ගිවිසගත් කොන්දේසි මත පැවරූ ජනවරමක්ද වන නිසාය. එය වැඩවසම් අන්තයක පැවති රජය, නූතන දියුණු ප්‍රජාතන්ත්‍රවාදය වෙත කැඳවාගෙන ඒම වෙනුවෙන් පැවරූ ජනවරමක්ද විය. මා එම වගකීම නිසි ලෙස ඉටු කරන්නේදැයි ජනතාව ඉහළම අවධානයෙන් පසුවන බව ඔවුන්ගේ ප්‍රතිචාර මඟින් තහවුරු වන අතර, උපරිම වගකීමකින් හා විනයකින් යුතුව එය මෙහෙයවීමට මට එය උත්තේජනයක් වන බව ද සඳහන් කරනු කැමැත්තෙමි.

ජනාධිපති කාර්යාලය මඟින් ඉටු කරන කාර්යභාරය විධිමත් සැලසුමක් යටතේ ගොනු කර ඉලක්ක ගත කාලසීමාවක් හා විෂය සීමාවන් යටතේ මෙහෙයවීමට අප කටයුතු කරන්නේ එම ජනවරමට උපරිම සාධාරණය ඉටු කළ යුතු බැවිනි.

මෙම කාර්ය සාධන වාර්තාව, ඉකුත් වසරේ ජනාධිපති කාර්යාලය මඟින් මෙහෙයවීමට සැලසුම් කළ සහ වසර අවසානය වෙද්දී සාක්ෂාත් කර ගන්නා ලද මෙහෙවර පිළිබඳ දළ සටහනකි. එය මෙරට මහජනයා වෙත විවෘත කෙරෙනුයේ, ඔවුන්ගේ ප්‍රතිචාර මඟින් ප්‍රතිපෝෂණය ලැබීමේ අපේක්ෂාවෙන් ද යුතුවය.

අප රජය, රට තුළ ගොඩනැගීමට ගිවිසගත් ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ව්‍යුහයේ කේන්ද්‍රස්ථානය වන්නේ ජනාධිපති කාර්යාලයයි. මෙම කාර්යාලයේ සේවය කරන ලොකු කුඩා සෑම සියලු නිලයකටම අයත් සේවක සමූහයා වෙතද ඒ වෙනුවෙන් පැවරෙන වගකීම අතිමහත්ය. පැවති ක්‍රමයේ තිබූ සියලු අඩුපාඩු මහඟරවා ගනිමින් කාර්යක්ෂම ඵලදායී සේවාවක් ඉටු කිරීමට අප වෙත ඇති වගකීම සිහිකැඳවා ගැනීමටද මෙම කාර්ය සාධන වාර්තාව පිටුබලයක් වනු ඇත.

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය



ජනාධිපති ලේකම්තුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන "ජනතාවගේ පරමාධිපත්‍ය" සුරක්ෂිත කිරීමේ මහා වගකීමේ ප්‍රමුඛ කොටස්කරුවන් ලෙස ශ්‍රී ලංකාවේ උත්තරීතර නීතියෙන් සපයනු ලබන සුවිශේෂී ව්‍යවස්ථානුකූල ප්‍රතිපාදන මත පත්වීම් ලද ජනපති කාර්යාලයීය කාර්ය මණ්ඩලය සැබැවින්ම භාග්‍යවන්තයෝය. සාමාන්‍ය කාර්යාල කළමනාකරණයෙන් ඔබ්බට විහිදුණු ජනතා අපේක්ෂාවන් වෙනම ඉලක්ක ගත අභිශය වැදගත් මෙන්ම අත්හළ නොහැකි සේවා බන්ධනයක් එනයින්ම ජනිත වූ භාරදූර වගකීම් සම්භාරයක් අප සතුවේ.

සුපැහැදිලිවූත්, සුපිරිසිදුවූත්, නියමාර්ථයෙන් වූ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ ඒකායන ජනතා අරගලයේ ප්‍රතිඵල ලෙස වත්මන් ජනපතිතුමන් වෙත සකල ශ්‍රී ලංකාවාසීන් තම පරම අයිතිය විදහාලමින් ලබාදුන් ජනවරමෙහි ගැබ්වූ අනේක විධ ජනතා අපේක්ෂාවන් යථාර්ථයක් කරලීමේ අභියෝගාත්මක, එහෙත් යුගයේ කාර්යභාරය ඉටුකිරීමෙහි ලා වූ සාමූහික පරිපාලනමය වගකීමට ජනාධිපති කාර්යාලයේ අපි බැඳී සිටිමු.

ජනපති කාර්යාලයේ සියලු කාර්ය මණ්ඩලය ඒ සියල්ල නොපිරිහෙලා ඉටු කරනු වස්, අත්‍යන්තයෙන්ම කැපවන බවට මම විශ්වාස කරමි.

අපි සියල්ලෝම එක් එක් අංශ වශයෙන් කාණ්ඩ ගත වෙමින් මෙසේ සංග්‍රහ කොට ඉදිරිපත් කරනු ලබන්නේ ඒ සියලු යුතුකම්, වගකීම් ඉටුකිරීම සඳහා නූතන කළමනාකරණ ක්‍රමවේදයන්හි ප්‍රශස්ත යෙදවුමෙන් ජනපති කාර්යාලය විසින් අත් කර ගනු ලැබූ ප්‍රගතියයි. ජනාධිපති ලේකම් වශයෙන් 2016 වසරේ අත් කර ගැනීම් සම්බන්ධයෙන්, ඒ සඳහා උරදුන් කාර්යාලයේ සැම වෙත මගේ කෘතඥතාවය මෙහි සටහන් කරන්නේද හද පිරි සතුටිනි. එසේම අපේ ඉලක්ක අවසන් ව නොමැති බව ද සිහිපත් කරමින්, ඉදිරියටත් නිදහස්, නිවහල් හා සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් සඳහා වූ ගමනේ අපේ කාර්යභාරය නොපිරිහෙලා ඉටු කිරීමට ජනාධිපති කාර්යාලයීය කාර්ය මණ්ඩලයේ අපි ස්ථිර අධිෂ්ඨානයෙන් යුක්තව කටයුතු කරන බවට ප්‍රතිඥා දෙමු.

ඔස්ටින් ප්‍රනාන්දු
ජනාධිපති ලේකම්

පටුන

		පිටු අංක
1.	හැඳින්වීම	1
2.	ලේකම් කාර්යාංශය	3
3.	පෞද්ගලික ලේකම් අංශය	12
4.	කාර්ය මණ්ඩල ප්‍රධානී අංශය	13
5.	ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ ව්‍යවස්ථාපිත කටයුතු අංශය ...	18
6.	අභ්‍යන්තර පාලන අංශය	21
7.	මානව සම්පත් සංවර්ධන අංශය	26
8.	ආයතන සම්බන්ධීකරණ අංශය	29
9.	ප්‍රතිපත්ති සම්බන්ධීකරණ හා ප්‍රගති සමාලෝචන අංශය ...	34
10.	මූල්‍ය කළමනාකරණ අංශය	38
11.	අභ්‍යන්තර විගණන අංශය	40
12.	ජනාධිපති අරමුදල	42
13.	සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය	45
14.	මහජන සම්බන්ධතා අංශය	116
15.	මාධ්‍ය අංශය	119
16.	ප්‍රතිසන්ධාන අංශය	125
17.	තොරතුරු තාක්ෂණ ඒකකය	126
18.	ප්‍රවාහන ඒකකය	131
19.	නීති අංශය	135
20.	වෛද්‍ය සේවා ඒකකය	139
21.	ජාතික සමගිය හා සංහිඳියා කාර්යාංශය	141
22.	ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව	156

හැඳින්වීම.....

නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ මුල් බිම ලෙස සැලකෙන ග්‍රීසියේ ඇතැන්ස් නුවර පිහිටි ඇතීනා දෙවඟන වෙනුවෙන් ඉදිකළ පාතීනන් දෙව්මැදුරේ ගෘහ නිර්මාණ ආකෘතියෙන් ඉදි වූ වර්තමාන ජනාධිපති කාර්යාලය, ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ඉතිහාසයේ හැරවුම් ගණනාවක කේන්ද්‍රය වූ මන්දිරයකි. ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ගණනාවක් යටතේ විවිධ නම් වලින් හැඳින් වූ මෙම ආයතනය, ඉංග්‍රීසි පාලනයෙන් අපට උරුම වූ සංස්කෘතික දායාදයක් ලෙසද සැලකිය හැකිය.

වර්තමානයේ රටේ රාජ්‍ය නායකයාගේ සියලු වගකීම් සහ කාර්යභාරයන් මෙහෙයවන, සම්බන්ධීකරණය සහ කළමනාකරණය කරන රාජ්‍ය ආයතනය වන්නේ ජනාධිපති කාර්යාලයයි. රටේ සියලු රාජ්‍ය ආයතන මෙන්ම ජනාධිපති කාර්යාලයද පොදු ජන අවශ්‍යතා ඉටු කිරීමට බැඳී සිටිනවා මෙන්ම සියලු වගකීම් හා කාර්යභාරයන් පිළිබඳ පොදු ජනයාට වගවීමට ද බැඳී සිටියි.

යහපාලනය ශ්‍රී ලංකාවේ දේශපාලන ව්‍යුහය තුළ ස්ථාපනය කිරීම වෙනුවෙන් පත්කෙරුණු වර්තමාන ජනාධිපතිවරයා යටතේ එම වගකීම වඩා බැරෑරුම්වනවා සේම රාජ්‍ය තොරතුරු පොදු ජන අයිතියක් බවට පත් වත්මන තුළ, ජනාධිපති කාර්යාලය ඉටු කරන කටයුතු සම්බන්ධ තොරතුරු ද විවෘත තොරතුරු බවට පත්ව තිබේ.

ශ්‍රී ලංකාවේ සිවිල් සේවයේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියෙකු හා රාජ්‍ය සේවයේ ප්‍රධානියා ලෙස නිල බලයෙන් පත්වන ජනාධිපති ලේකම්වරයා යටතේ ජනාධිපති කාර්යාලය සැලසුම්කොට මෙහෙයවූ වැඩසටහන් ඉකුත් වසරේදී අත්කරගත් ප්‍රගතිය මෙම කාර්ය සාධන වාර්තාවට ඇතුළත්ය.

ජනාධිපති කාර්යාලය පහත දැක්වෙන අංශ වලින් සමන්විත වේ.

- *ලේකම් කාර්යාංශය*
- *පෞද්ගලික ලේකම් අංශය*
- *කාර්ය මණ්ඩල ප්‍රධානී අංශය*
- *ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ ව්‍යවස්ථාපිත කටයුතු අංශය*
- *අභ්‍යන්තර පාලන අංශය*
- *මානව සම්පත් සංවර්ධන ඒකකය*
- *ආයතන සම්බන්ධීකරණ ඒකකය*
- *ප්‍රතිපත්ති සම්බන්ධීකරණ හා ප්‍රගති සමාලෝචන අංශය*
- *මූල්‍ය කළමනාකරණ අංශය*
- *අභ්‍යන්තර විගණන අංශය*
- *ජනාධිපති අරමුදල් අංශය*
- *සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය*
- *මහජන සම්බන්ධතා අංශය*
- *මාධ්‍ය අංශය*
- *ප්‍රතිසන්ධාන කාර්යාලය*
- *ප්‍රවාහන ඒකකය*
- *තොරතුරු තාක්ෂණ ඒකකය*
- *නීති අංශය*
- *වෛද්‍ය සේවා ඒකකය*
- *ජාතික සමගිය හා සංහිඳියා කාර්යාංශය*
- *ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව*

ලේකම් කාර්යාංශය

හැඳින්වීම

අතිගරු ජනාධිපතිතුමා වෙනුවෙන් ජනාධිපති ලේකම්තුමා විසින් ඉටු කරනු ලබන කාර්යයන් වඩාත් පහසු කරලීම හා ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම මෙම අංශය මඟින් සිදුවේ. ඒ අනුව, අංශය මඟින් සිදු කෙරෙන ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

ප්‍රධාන කාර්යයන් / අරමුණු

- උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාවට අදාළ කාර්යයන් ඉටු කිරීම.
- විදේශීය රාජ්‍ය නායකයන් පැමිණෙන අවස්ථාවලදී අතිගරු ජනාධිපතිතුමාගේ/ජනාධිපති ලේකම්තුමාගේ උපදෙස් පරිදි උත්සව සංවිධානය හා සම්බන්ධීකරණ කටයුතු ඉටු කිරීම.
- විදේශ කටයුතු අමාත්‍යාංශය හා සිදු කෙරෙන ලිපි සම්බන්ධ කටයුතු.
- ජනාධිපති ලේකම් කාර්යාංශය විසින් කැඳවන රැස්වීම් සඳහා ආරාධනා සැකසීම, රැස්වීමේ පහසුකම් විමසා බලා අවශ්‍ය කටයුතු කිරීම, රැස්වීම් සටහන් පවත්වාගෙන යාම, පසුවිපරම් කිරීම ඇතුළු සියලු සංවිධාන කටයුතුවලට සහායවීම.
- අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ රැස්වීම් සම්බන්ධීකරණය.
- අතිගරු ජනාධිපතිතුමාගේ/ජනාධිපති ලේකම්තුමාගේ උපදෙස් පරිදි චක්‍රලේඛ නිකුත් කිරීම.
- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු පත්වීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- සර්ව පාක්ෂික සමුළුව හා සර්ව ආගමික සමුළුවට අදාළ සංවිධාන කටයුතු හා සම්බන්ධීකරණ කටයුතු.
- අතිගරු ජනාධිපතිතුමා වෙත වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළයුතු පුද්ගලයන්ගෙන් එම වත්කම් බැරකම් ප්‍රකාශ ලබාගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- ජනාධිපති පරිසර නියමු රන් පදක්කම්ලාභීන්ගේ සම්මුඛ පරීක්ෂණවල විනිශ්චය මණ්ඩල සභාපති ධුර කටයුතු කිරීම.
- අතිගරු ජනාධිපතිතුමා හා ජනාධිපති ලේකම් වෙත ඉදිරිපත් වන පැමිණිලි/ඉල්ලීම් ආදී විවිධ කටයුතු සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ /ජනාධිපති ලේකම්තුමාගේ උපදෙස් පරිදි ක්‍රියා කිරීම.

- ජනාධිපති කාර්යාලය හා ඒ යටතේ ඇති ආයතනවල නිලධාරීන්ට අදාළව සහනදායී මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධ කටයුතු.

- අතිගරු ජනාධිපතිතුමා විසින් සහ ජනාධිපති කාර්යාලය මඟින් එදිනෙදා සිදුකරනු ලබන සුවිශේෂී කාර්යයන් පිළිබඳ මාසික වාර්තාවක් පිළියෙල කිරීම.

- අතිගරු ජනාධිපතිතුමා විසින් විවිධ අවස්ථාවල දෙනු ලබන උපදෙස් පරිදි සියලුම අමාත්‍යාංශයන්හි නිල වාහන සම්බන්ධ කටයුතු කිරීම.

- ජනාධිපති කාර්යාලයේ සියලුම චක්‍රලේඛ/අභ්‍යන්තර ලිපි, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛ/මුදල් චක්‍රලේඛ හා වෙනත් වැදගත් සුවිශේෂී චක්‍රලේඛ/ලිපි සම්බන්ධ ගොනු යාවත්කාලීනව පවත්වාගෙන යාම.

2016 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම්

- **පකිස්ථානු අග්‍රාමාත්‍ය නවාස් ෂරීෆ් මැතිතුමාගේ ශ්‍රී ලංකා නිල සංචාරය**



2016 ජනවාරි මස 04 වන දින සිට 06 වන දින දක්වා ශ්‍රී ලංකාවේ තෙදින නිල සංචාරයක යෙදුනු පකිස්ථානු අග්‍රාමාත්‍යතුමා ජනවාරි මස 05 වන දින ශ්‍රී ලංකාවට පැමිණීම නිමිත්තෙන් පැවැත් වූ නිල පිළිගැනීමේ උත්සවයේ සම්බන්ධීකරණ කටයුතු හා සංවිධාන කටයුතු මෙම අංශය මඟින් සිදු වූ අතර, එතුමා වෙනුවෙන් පැවති රාත්‍රී භෝජන සංග්‍රහය වෙනුවෙන් ආරාධනා පත්‍ර සැකසීම, ආරාධිතයන්ගේ සහභාගිත්වය තහවුරු කර ගැනීම ඇතුළු කටයුතු ද මෙම අංශය මඟින් සිදු කරන ලදී.

➢ නවසීලන්ත අග්‍රාමාත්‍යතුමාගේ ශ්‍රී ලංකා නිල සංචාරය



පස් දින නිල සංචාරයක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණි නවසීලන්ත අග්‍රාමාත්‍යතුමා ජනාධිපති කාර්යාලයට පැමිණීම වෙනුවෙන් 2016 පෙබරවාරි මස 24 වන දින පැවති උත්සවයේ පිළිගැනීමේ කටයුතු, ද්විපාර්ශවික සාකච්ඡාව, ගිවිසුම් අත්සන් කිරීම සහ නවසීලන්ත අග්‍රාමාත්‍යතුමා වෙනුවෙන් පැවති විශේෂ රාත්‍රී භෝජන සංග්‍රහයේ සම්බන්ධීකරණ කටයුතු ලේකම් කාර්යාංශය මඟින් සිදු කරන ලදී.

➢ එක්සත් ජාතීන්ගේ මහලේකම්, බෑන් කී මූන් මහතාගේ ශ්‍රී ලංකා නිල සංචාරය

එක්සත් ජාතීන්ගේ මහලේකම්, බෑන් කී මූන් මහතා ශ්‍රී ලංකාවට පැමිණීම නිමිත්තෙන් 2016 අගෝස්තු මස 01 වන දින පැවති රාත්‍රී භෝජන සංග්‍රහයේ සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය මඟින් සිදු කරන ලදී.

➢ යාපනය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ගැටුම් පිළිබඳ සාකච්ඡාව



2016 අගෝස්තු මස 04 වන දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති යාපනය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ගැටුම් පිළිබඳ සාකච්ඡාවේ සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය මඟින් සිදු විය.

➢ නෝර්වේ අග්‍රාමාත්‍යතුමියගේ ශ්‍රී ලංකා නිල සංචාරය



දෙදින නිල සංචාරයක් සඳහා නෝර්වේ අග්‍රාමාත්‍යතුමිය ශ්‍රී ලංකාවට පැමිණීම නිමිත්තෙන් 2016 අගෝස්තු මස 12 වන දින ජනාධිපති කාර්යාලයේ පැවති උත්සවයේ පිළිගැනීමේ කටයුතු, ද්විපාර්ශවික සාකච්ඡාව සහ ගිවිසුම් අත්සන් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම ලේකම් කාර්යාංශය මඟින් සිදු විය.

- **චීනයේ සිචුවාන් ප්‍රදේශයෙන් පැමිණි ආයෝජකයන් සමඟ පැවති සාකච්ඡාව**

2016 නොවැම්බර් මස 22 වන දින අමාත්‍යාංශ ලේකම්වරුන් කිහිප දෙනෙකු, චීන නිලධාරීන් හා චීනයේ සිචුවාන් ප්‍රදේශයේ ආයෝජකයන් සමඟ සාකච්ඡාවක් පැවති අතර, එම සාකච්ඡාව සංවිධානය කිරීම හා සම්බන්ධීකරණය කිරීම මෙම අංශය මඟින් සිදු විය.

- **ෆිදෙල් කස්ත්‍රෝ ගුණ සැමරුම් උත්සවය**



කියුබානු නායක ෆිදෙල් කස්ත්‍රෝ මැතිතුමාගේ ගුණ සැමරීම නිමිත්තෙන් 2016 දෙසැම්බර් මස 02 වන දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති සැමරුම් උත්සවය වෙනුවෙන් අදාළ ආරාධිතයන් වෙත ආරාධනා පත්‍ර යොමු කිරීමේ කටයුතු ලේකම් කාර්යාංශය මඟින් සිදු කරන ලදී.

- **ටජිකිස්ථානු ජනාධිපතිතුමාගේ ශ්‍රී ලංකා නිල සංචාරය**



තෙදින නිල සංචාරයක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණි ටජිකිස්ථානු ජනාධිපතිතුමා වෙනුවෙන් 2016 දෙසැම්බර් මස 12 වන දින ජනාධිපති කාර්යාලයේ පැවති පිළිගැනීමේ උත්සවය, ද්විපාර්ශවික සාකච්ඡාව, ගිවිසුම් අත්සන් කිරීම සහ එතුමා වෙනුවෙන් ජනාධිපති මන්දිරයේ පැවති විශේෂ රාත්‍රී භෝජන සංග්‍රහයේ සංවිධාන හා සම්බන්ධීකරණ කටයුතු වෙනුවෙන් මෙම අංශයේ දායකත්වය ලබාදීම සිදු විය.

➢ අතිගරු ජනාධිපතිතුමාගේ මැලේසියානු නිල සංචාරය



2016 දෙසැම්බර් මස 15 වන දින සිට දෙසැම්බර් 17 වන දින දක්වා අතිගරු ජනාධිපතිතුමා නිරත වූ මැලේසියානු නිල සංචාරයේ සම්බන්ධීකරණ කටයුතු විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ එක්ව සිදු කරන ලදී.

➢ නත්තල් දිනය වෙනුවෙන් පැවති විශේෂ රාත්‍රී භෝජන සංග්‍රහය



නත්තල් උත්සවය නිමිත්තෙන් 2016 වර්ෂයේ දෙසැම්බර් මස 23 වන දින ජනාධිපති මන්දිරයේ පැවති විශේෂ නත්තල් රාත්‍රී භෝජන සංග්‍රහයෙහි සංවිධාන කටයුතු හා සම්බන්ධීකරණ කටයුතු ලේකම් කාර්යාංශය මඟින් සිදු විය.

➢ අමාත්‍යාංශ ලේකම්වරුන් සමඟ පැවති සාකච්ඡා

ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2016.02.19, 2016.09.20 හා 2016.11.11 යන දිනයන්හි රැස්වීම් 03 ක් පවත්වන ලද අතර, එම රැස්වීම්වල සංවිධාන කටයුතු සිදු කරන ලදී.

➢ ප්‍රවාහන ක්ෂේත්‍රයේ ගැටලු සම්බන්ධයෙන් පැවති සාකච්ඡා

- ඒකාබද්ධ කාල සටහන ක්‍රියාත්මක කිරීම, කොළඹ නගරය තුළ බස් රථ ගාල් කිරීමේ ස්ථානවල පවතින අවභිරතා, බැස්ටියන් මාවතේ අන්තර් පළාත් මගී පර්යන්තය සම්බන්ධව හා ඉලෙක්ට්‍රොනික් බස් ගාස්තු ගෙවීමේ ක්‍රමය ප්‍රවලිත කිරීම ආදී ප්‍රවාහන ක්ෂේත්‍රයේ පවතින විවිධ ගැටලු පිළිබඳ 2016.02.29 වන දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවේ සම්බන්ධීකරණ කටයුතු හා සංවිධාන කටයුතු මෙම අංශය මඟින් සිදු කෙරිණි.

- ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය, ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2016.03.28 දින පවත්වන ලද ප්‍රවාහන ක්ෂේත්‍රයේ ගැටළු නිරාකරණය කිරීම පිළිබඳ කමිටු සාකච්ඡාවේ සංවිධාන කටයුතු ලේකම් කාර්යාංශය මඟින් සිදු කරන ලදී.

- අතිගරු ජනාධිපතිතුමාගේ හා ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2016.07.22 දින පැවති ශ්‍රී ලංගම ප්‍රතිව්‍යුහගත කිරීම හා ඒකාබද්ධ කාලසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ ගැටලු පිළිබඳව ශ්‍රී ලංගම වෘත්තීය සමිති නියෝජිතයින් සමඟ පවත්වන ලද සාකච්ඡාවේ සංවිධාන හා සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය මඟින් සිදු කරන ලදී.

➢ **අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති වෙනත් වැඩසටහන්/උත්සව හා සාකච්ඡා**



- 2016 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් වාර්ෂිකව පවත්වන ක්‍රීඩා හා ශරීර සුවතා ප්‍රවර්ධන ජාතික වැඩසටහනේ අන්තර් අමාත්‍යාංශ මෙහෙයුම් කමිටුව සම්බන්ධීකරණය කිරීම මෙම අංශය මඟින් සිදුවිය. අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2016 ජනවාරි මස 04 වන දින රැස්වූ එම කමිටුවෙහි සම්බන්ධීකරණ හා සංවිධාන කටයුතු සිදු කරන ලද අතර, එහි සමාරම්භක උත්සවය 2016.01.25 වන දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති කාර්යාලයේදී පැවැත්විණි.

- කොස්ගම සාලාව අවි ගබඩා සංකීර්ණයෙහි සිදුවූ හදිසි පිපිරීම් තත්ත්වය සම්බන්ධයෙන් 2016.06.17 දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවේ සම්බන්ධීකරණ කටයුතු හා සංවිධාන කටයුතු මෙම අංශය මඟින් සිදු විය.

- 2016.07.22 දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහි පැවති රාජ්‍ය නිලධාරීන්ගේ හමුවෙහි සම්බන්ධීකරණ හා සංවිධාන කටයුතු සම්බන්ධයෙන් ලේකම් කාර්යාංශයේ දායකත්වය ලබා දෙන ලදී.

- අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2016.08.23 දින පැවති සමෘද්ධි කළමනාකරුවන්ගේ වෘත්තීයම ගැටලු පිළිබඳ සාකච්ඡාව සංවිධානය කිරීම හා සම්බන්ධීකරණය කිරීම මෙම අංශය මඟින් සිදු කරන ලදී.

➢ ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡා

- ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් නගර හා මංසන්ධි ආශ්‍රිතව ලොතරැයි කුට්ටි ඉවත් කිරීම පිළිබඳ 2016.02.08 දින පැවති සාකච්ඡාවේ සංවිධාන කටයුතු හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2016.07.14 හා 2016.07.18 යන දිනයන්හිදී පවත්වන ලද මොරගහකන්ද ජලාශය විවෘත කිරීමේ ජාතික උළෙල හා එයට සමගාමී අනෙකුත් වැඩසටහන් පිළිබඳ සාකච්ඡාවන්හි සංවිධාන කටයුතු සිදු කිරීම.

➢ වෙනත් උත්සව

- බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2016.04.08 වන දින පැවති රතුපස්වල ප්‍රදේශයේ සිදුවූ ගැටුම්කාරී සිද්ධිය හේතුවෙන් තුවාල ලැබූවන් සඳහා වන්දි මුදල් ප්‍රදානය කිරීමේ උත්සවයේ සංවිධාන හා සම්බන්ධීකරණ කටයුතු ලේකම් කාර්යාංශය මඟින් සිදු කරන ලදී.
- අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017.01.02 වන දින පැවති "තිරසර යුගයක්" සංවර්ධන දැක්ම ප්‍රකාශයට පත් කිරීමේ උත්සවය හා 2017.01.08 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවෙහි පැවති "තිරසර යුගයක - තෙවසරක ඇරඹුම" ජාතික සභාව වෙනුවෙන් පූර්ව සූදානම් කටයුතු සිදු කිරීම ද 2016 වර්ෂයේ දෙසැම්බර් මස අවසානයේදී මෙම අංශය මඟින් සිදු කරන ලදී.

➢ මාසික වැඩසටහන් පිළිබඳ වාර්තාව

අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන්, ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් හා ජනාධිපති කාර්යාලය මඟින් සංවිධානය කරනු ලබන විවිධ වැඩසටහන්, රැස්වීම් සහ උත්සව අවස්ථාවන්ට අදාළව සාරාංශගත තොරතුරු 2016 දෙසැම්බර් දක්වා මාසිකව සකස් කර ජනාධිපති ලේකම්තුමා වෙත ඉදිරිපත් කිරීම

➢ චක්‍රලේඛ නිකුත් කිරීම

පහත අංක දරන චක්‍රලේඛ නිකුත් කිරීම මෙම අංශය මඟින් සිදු කෙරිණි.

අනු. අංකය	චක්‍රලේඛයේ නම	චක්‍රලේඛ අංකය	දිනය
01.	දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන් රාජකාරී කටයුතු සඳහා සහභාගී කරවා ගැනීම. (ජනාධිපති ලේකම්තුමාගේ අත්සනින් නිකුත් කරන ලද චක්‍රලේඛය)	SP/SB/02/16	2016.01.12
02.	දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන් රාජකාරී කටයුතු සඳහා සහභාගී කරවා ගැනීම. (අතිගරු ජනාධිපතිතුමාගේ අත්සනින් නිකුත් කරන ලද චක්‍රලේඛය)	SP/SB/02/17	2016.01.18

- **ජනාධිපති පරිසර නියමු රන්පදක්කම්ලාභීන්ගේ සම්මුඛ පරීක්ෂණවල විනිශ්චය මණ්ඩලවල කටයුතු**

2016 වර්ෂයේදී පහත සඳහන් ස්ථානයන්හි පැවති පරිසර නියමු පදක්කම් පිරිනැමීම සඳහා වන සම්මුඛ පරීක්ෂණන්හි විනිශ්චය මණ්ඩල කටයුතුවල නිරත විය.

	ස්ථානය
2016 මැයි 24 සහ 27	කු/කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලය
2016 ජූනි 23 සහ 24	හම්බන්තොට, හකුරුවෙල කණිටු විදුහල
2016 ජූනි 30	ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
2016 ජූලි 25 සහ 26	කු/උඩබදලව සුදර්ශන මහා විද්‍යාලය
2016 අගෝස්තු 02	කු/උඩබදලව සුදර්ශන මහා විද්‍යාලය
2016 අගෝස්තු 16	මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
2016 අගෝස්තු 19	කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
2016 අගෝස්තු 29	කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
2016 සැප්තැම්බර් 13 සහ 14	පො/දිඹු/අලවාකුඹුර මහා විද්‍යාලය

- **දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සම-සභාපතිවරුන් පත් කිරීම**

1. දිස්ත්‍රික්ක 06 ක් සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සම සභාපතිවරුන් 05 දෙනෙකු ද, එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සම සභාපතිවරුන් 02 දෙදෙනෙකු ද පත් කිරීමට කටයුතු කර ඇත.
2. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සඳහා ඉලංකෙයි තමිල් අරසු කච්චි පක්ෂය වෙනුවෙන් සම සභාපතිවරුන් 14 දෙනෙකු ද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් සම සභාපතිවරුන් 25 දෙනෙකු ද, එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් සම සභාපතිවරයෙකු ද පත් කිරීමට කටයුතු කර ඇත.

- **ජනාධිපති කාර්යාලය මඟින් සංවිධානය කරනු ලබන උත්සව අවස්ථාවන්හි ආරාධිත අමුත්තන් පිළිගැනීම හා ආසන පැනවීමේ නිලධාරීන් පත් කිරීම**



අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති කාර්යාලය මඟින් සංවිධානය කරනු ලබන උත්සව අවස්ථාවන්හි ආරාධිත අමුත්තන් පිළිගැනීම හා ඔවුන් සඳහා ආසන පැනවීමේ කටයුතු වෙනුවෙන් පත්කර ඇති කණ්ඩායමෙහි පත්කිරීමේ කටයුතු, සම්බන්ධීකරණ කටයුතු හා පුහුණු කිරීම් හා එහි අධීක්ෂණ කටයුතු ලේකම් කාර්යාංශය මඟින් සිදු කරන ලදී.

පෞද්ගලික ලේකම් අංශය

හැඳින්වීම

අතිගරු ජනාධිපතිතුමාගේ දෛනික වැඩසටහන්/උපදෙස් හා නියෝග /ලිපි හා වාර්තා සම්බන්ධයෙන් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව ක්‍රියා කිරීම

ප්‍රධාන කාර්යයන් / අරමුණු

	ක්‍රියාකාරකම්	**අරමුණු සාක්ෂාත් කර ගැනීම**
1	අතිගරු ජනාධිපතිතුමාගේ දෛනික වැඩසටහන්, උපදෙස් හා නියෝග, ලිපි හා වාර්තා සම්බන්ධයෙන් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව කටයුතු කිරීම.	නියෝග ලද වහාම අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන ඇත.
2	අතිගරු ජනාධිපතිතුමා සම්බන්ධ වන උත්සව, රැස්වීම් හා හමුවීම් අවස්ථා සටහන් තබමින් දිනපොත සැකසීම. ඒ අනුව දෛනික වැඩසටහන් පෙළගැස්වීම, සම්බන්ධීකරණය හා අදාළ අංශ හා නිලධාරීන් දැනුවත් කිරීම.	එම
3	අතිගරු ජනාධිපතිතුමාගේ නියෝග අනුව එතුමාගේ අත්සනට ලිපි සැකසීම.	එම
4	අතිගරු ජනාධිපතිතුමාගේ අවධානයට යොමුවිය යුතු ලිපි/ වාර්තා, උත්සව ආරාධනා ආදිය සටහන් සහිතව එතුමාට ඉදිරිපත් කිරීම හා ඒ සඳහා ලබා දෙන නියෝග අනුව කටයුතු කිරීම.	එම
5	අතිගරු ජනාධිපතිතුමා වෙත මහජන නියෝජිතයින් හා ජනතාව විසින් එවනු ලබන ලිපි සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම.	එම
6	ලැබෙන තැපෑල හා සම්බන්ධ තොරතුරු යාවත්කාලීන කිරීම/ ලිපිගොනු සැකසීම හා පවත්වාගෙන යාම.	එම

කාර්ය මණ්ඩල ප්‍රධානී අංශය

හැඳින්වීම

ජනාධිපති කාර්ය මණ්ඩලය කළමනාකරණය කිරීම, ගරු ජනාධිපතිතුමාගේ ආරක්ෂක කටයුතු සම්බන්ධීකරණය කිරීම, කොළඹ හා පිට පළාත්වල උත්සව හා රැස්වීම් සම්බන්ධීකරණය කිරීම හා ගරු ජනාධිපතිතුමාට ලැබෙන ලිපි, ව්‍යාපෘති යෝජනා හා අනෙකුත් පණිවුඩ එතුමාගේ උපදෙස් අනුව ක්‍රියාමාර්ග ගැනීම, ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී කාර්යාලයේ ප්‍රධාන වගකීම් වේ.

ප්‍රධාන අරමුණු

1. ජනාධිපති කාර්ය මණ්ඩලය විධිමත්ව කළමනාකරණය කිරීම.
2. ගරු ජනාධිපතිතුමාගේ ආරක්ෂාව තහවුරු කිරීම.
3. ගරු ජනාධිපතිතුමාගේ කොළඹ හා පිට පළාත්වල රැස්වීම් හා උත්සව සම්බන්ධීකරණය.
4. ගරු ජනාධිපතිතුමාගේ රැස්වීම් හා සාකච්ඡා ඵලදායී ලෙස පැවැත්වීම තහවුරු කිරීම සඳහා සම්බන්ධීකරණය.
5. ගරු ජනාධිපතිතුමාට ලැබෙන ලිපි, ව්‍යාපෘති යෝජනා හා අනෙකුත් පණිවුඩ සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනීම.
6. "පිබිදෙමු පොළොන්නරුව" දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන හා පාරිසරික හා බලශක්ති ක්ෂේත්‍රයන්හී ව්‍යාපෘති සම්බන්ධීකරණය.

2016 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම

1. ජනාධිපති කාර්ය මණ්ඩලය විධිමත්ව කළමනාකරණය කිරීම.

ජනාධිපති කාර්යාලයට අනුයුක්ත සියලු කාර්ය මණ්ඩල සඳහා විෂයානුබද්ධ දැනුම, කාර්යාලීය ක්‍රම හා විනය හා ආකල්ප වර්ධනය සඳහා වැඩමුළු පැවැත්වීම සහ පසු විපරම.

2. ගරු ජනාධිපතිතුමාගේ ආරක්ෂාව තහවුරු කර තිබීම.

කාර්යාලයේ සහ නිල නිවසේ, ක්ෂේත්‍ර රාජකාරීවලදී ආරක්ෂක ප්‍රධානීන් සමඟ සාකච්ඡා කර සම්බන්ධීකරණ වැඩපිළිවෙලක් සකස් කිරීම. ගරු ජනාධිපතිතුමාගේ හා කාර්යාලයේ තොරතුරු අනවශ්‍ය පාර්ශ්වයන් වෙත යොමුවීම වැළැක්වීම සඳහා ක්‍රියාපිළිවෙලක් සකස් කිරීම.

ජංගම දුරකථන හා ඉලෙක්ට්‍රොනික උපකරණ කාර්යාලය තුළට රැගෙන ඒම පාලනය කිරීම. කාර්යාලයට පැමිණෙන අමුත්තන් පැමිණීම හා පිටවීම අධීක්ෂණය කිරීමේ වැඩපිළිවෙලක් ස්ථාපනය කිරීම.

3. ගරු ජනාධිපතිතුමාගේ කොළඹ හා පිට පළාත්වල රැස්වීම් හා උත්සව සම්බන්ධීකරණය.

ගරු ජනාධිපතිතුමා කොළඹ හා පිට පළාත්වල සහභාගී වන රැස්වීම්වල සූදානම, එයට සහභාගී වීමේ යෝග්‍යතාවය හා එහි දී කථාවක් පැවැත්වීමේ යෝග්‍යතාව, ආරාධනා කර ඇති හා සහභාගී වීම තහවුරු කර ඇති ආරාධිතයින් පිළිබඳ තොරතුරු, රැස්වීමේ අරමුණ, රැස්වීම හෝ උත්සව භූමියට ප්‍රවේශවන මාර්ග විස්තරය, මාධ්‍ය ආවරණය හා ආරක්ෂක විධිවිධාන පිළිබඳව පූර්ණ අවබෝධය ලබා ගනිමින් ඒ පිළිබඳ ගරු ජනාධිපතිතුමා දැනුවත් කිරීම.

මෙම අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා ජනාධිපති සම්බන්ධීකරණ ලේකම්වරුන්ට දිස්ත්‍රික්කවල වගකීම් පවරා ඇති අතර එම නිලධාරීන්ගෙන් ද ජනාධිපති ආරක්ෂක අංශ නිලධාරීන්ගෙන් ද තොරතුරු ලබාගැනීමට වැඩපිළිවෙලක් සකස් කර තිබේ. ලබාගන්නා තොරතුරු දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් තහවුරු කර ගැනීමේ වැඩපිළිවෙලක් ද ක්‍රියාත්මක වේ.

4. ගරු ජනාධිපතිතුමාගේ රැස්වීම් හා සාකච්ඡා ඵලදායී ලෙස පැවැත්වීම තහවුරු කිරීම.

ගරු ජනාධිපතිතුමා සහභාගී වන ජනාධිපති කාර්යාලයේ පැවැත්වෙන රැස්වීම්, අරමුණු, ඉදිරිපත් විය හැකි ගැටලු හා ඉල්ලීම්, සහභාගී වන පාර්ශ්වයන්, රැස්වීමේ අරමුණු අනුව සෘජුවම සම්බන්ධවන ආයතන පිළිබඳව පූර්ව අවබෝධයක් ලබාගෙන ගරු ජනාධිපතිතුමා දැනුවත්කිරීම.

රැස්වීමට ගරු ජනාධිපතිතුමා ප්‍රවේශවීමට පෙර න්‍යාය පත්‍රය, සහභාගී වන්නන් පිළිබඳ තොරතුරු, රැස්වීමේ අරමුණට අදාළ පසුබිම් තොරතුරු සහිත ගොනුවක් සහ සටහනක් සටහන් තබා ගැනීමේ ලිපිද්‍රව්‍ය මේසය මත සූදානම්ව ඇති බව තහවුරු කර ගැනීම. අවස්ථාවෝචිත පරිදි මාධ්‍ය ආවරණ සූදානම තහවුරු කිරීම.

5. ගරු ජනාධිපතිතුමාට පෞද්ගලික ලැබෙන ලිපි, ව්‍යාපෘති යෝජනා හා අනෙකුත් පණිවුඩ සම්බන්ධව ප්‍රතිචාර දැක්වීම.

ගරු ජනාධිපතිතුමා වෙත ලැබෙන මහජන ඉල්ලීම් හඳුනාගෙන වර්ගීකරණය කර අදාළ අංශ වෙත යොමු කිරීම. යොමුකල ලිපි සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග පසුවිපරම් කිරීම. මහජන අවශ්‍යතා ඉටුකිරීමට ඇති බාධා හඳුනාගෙන ඒවා ඉවත් කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක වීම පිළිබඳව පසු විපරම් කිරීම. මහජන අවශ්‍යතා ඉටුවීම තහවුරු කරගැනීම.

6. "පිබිදෙමු පොළොන්නරුව" දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන හා වෙනත් පාරිසරික හා බලශක්ති ඇතුළු ව්‍යාපෘති සම්බන්ධීකරණය.

I. "පිබිදෙමු පොළොන්නරුව" දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන (සාරාංශය)

සංවර්ධන ක්ෂේත්‍රය	2016 වර්ෂයේ අනුමත කළ ව්‍යාපෘති ගණන	2016 වර්ෂයේ අවසන් කළ ව්‍යාපෘති ගණන
අධ්‍යාපන - පාසල් සංවර්ධනය	107	13
පිරිවෙන් සංවර්ධනය	8	0
සෞඛ්‍ය -2015 වර්ෂයේ ආරම්භ කළ	3	2
සෞඛ්‍ය - පොළොන්නරුව මහ රෝහලේ සංවර්ධන කටයුතු	20	2
සෞඛ්‍ය - ප්‍රාදේශීය රෝහල් සංවර්ධනය	15	0
පානීය ජල සම්පාදනය	85	74
නාගරික මාර්ග සංවර්ධනය	10	1
ප්‍රාදේශීය මාර්ග සංවර්ධනය	27	0
ග්‍රාමීය මාර්ග සංවර්ධනය	441	376
වාරිමාර්ග ප්‍රතිසංස්කරණය	9	9
මහවැලි සංවර්ධනය	9	8
කෘෂිකර්මය	1	1
ගොවිජන සේවා	4	4
පශු සම්පත් සංවර්ධනය	5	5
සමූපකාර සංවර්ධනය	1	1
වනජීවී සංරක්ෂණ	1	1
වන සංරක්ෂණ	1	1
ග්‍රාමීය ආර්ථික සංවර්ධනය	1	1
ක්‍රීඩා හා සංස්කෘතික කටයුතු	4	0
පුරාවිද්‍යා ස්ථාන සංරක්ෂණය	2	1
ආගමික ස්ථාන සංවර්ධනය	27	0
නාගරික සංවර්ධනය	6	0
මාණික්කම්පට්ටිය ඇළ ප්‍රතිසංස්කරණය	1	1
ජාතික ජලජීවී සංවර්ධනය	1	0
රංගශාලා	4	0
පොදු පහසුකම්	12	10
කෞතුකාගාරය හා තොරතුරු මධ්‍යස්ථානය	1	0
ආපදා කළමනාකරණය	101	101
පල්ලෙගම වැව ප්‍රතිසංස්කරණය	1	0
එකතුව	**908**	**612**











ලංකාපුර ගල්අමුණ ප්‍රදේශයේ ඉදිකරන ලද වී ගබඩාව

II. ගම්පහ පහළ යාගොඩ සංවර්ධන වැඩසටහන

1. ගම්/ ස්වර්ණපාලි මහා විද්‍යාලය වැඩිදියුණු කිරීම.
2. පහළ යාගොඩ කේන්ද්‍ර කරගත් මාර්ග පද්ධතිය පුළුල් කිරීම හා ව්‍යාප්ත කිරීම.
3. පහළ යාගොඩ දුම්රිය ස්ථානය නවීකරණය කිරීම.
4. පහළ යාගොඩ හා අවට නගර යා කෙරෙන ප්‍රවාහන පද්ධතිය වැඩිදියුණු කිරීම.
5. යාගොඩ - ඔරුතොට වෙල්යායට අදාළ වාරි ගැටලු විසඳීම හා කෘෂිකාර්මික ඵලදායීතාවය ඉහළ නැංවීම.
6. පහළ යාගොඩ පානීය ජල පහසුකම් ව්‍යාප්ත කිරීම.
7. පහළ යාගොඩ ප්‍රදේශයේ තරුණ තරුණියන්ගේ වෘත්තීය පුහුණුව හා කුසලතා ප්‍රවර්ධනය.







ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ ව්‍යවස්ථාපිත කටයුතු අංශය

හැඳින්වීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හා විවිධ අණපනත් මඟින් අතිගරු ජනාධිපතිතුමා විසින් ක්‍රියාත්මක කළ යුතු බවට සඳහන් කාර්යයන් ඉටුකිරීම සඳහා අවශ්‍ය සහය ලබාදීම.

ප්‍රධාන කාර්යයන් / අරමුණු

ඉහත කී බලතල හා වගකීම් ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන වලට අනුකූලව කාර්යක්ෂමව හා අනලස්ව ඉටු කිරීම.

2016 වර්ෂයේ සාක්ෂාත් කරගැනීම්

1.	**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් හා වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව අතිගරු ජනාධිපතිතුමන් විසින් සිදුකරනු ලබන විවිධ තනතුරු සඳහා පත්කිරීම්**	
•	අමාත්‍ය මණ්ඩල අමාත්‍යවරුන්	01
•	රාජ්‍ය අමාත්‍යවරුන්	01
•	නියෝජ්‍ය අමාත්‍යවරුන්	02
•	පළාත් ආණ්ඩුකාරවරුන්	02
•	ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්	02
•	අභියාචනාධිකරණ විනිසුරුවරුන්	03
•	නීතිපති	01
•	මහාධිකරණ විනිසුරුවරුන්	08
•	අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්	01
•	මහාධිකරණ කොමසාරිස්වරුන්	01
•	ජනාධිපති නීතිඥවරුන්	05
•	ශ්‍රී ලංකා විනිශ්චය ආයතනයේ සාමාජිකයන්	01
•	ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ සාමාජිකයන්	23
•	ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සාමාජිකයන්	03
•	සමථ මණ්ඩල කොමිෂන් සභාවේ සාමාජිකයන්	05
•	ස්වාධීන කොමිෂන් සභා සාමාජිකයන්	
	➢ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව	01
	➢ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්	01
	➢ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව	05
	➢ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව	01
•	අමාත්‍යාංශ ලේකම්වරුන්	09
•	පළාත් ප්‍රධාන ලේකම්වරුන්	02

• ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වන ව්‍යවස්ථාව අනුව ජනාධිපති සමාව ලබාදීම	154
➢ නත්තල් උත්සවය වෙනුවෙන් ජනාධිපති සමාව ලබාදීම	
➢ ජාතික නිදහස් දිනය වෙනුවෙන් ජනාධිපති සමාව ලබාදීම	
• සන්නද්ධ හමුදා ප්‍රධානීන්	
➢ ගුවන් හමුදාපති	01
• පොලිස්පති	01
• විශ්වවිද්‍යාල කුලපතිවරුන්	05
• විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්	03
• කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කුලපති	01
• වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ කුලපති	01
• වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ උපකුලපති	01
• ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සාමාජිකයන්	01
• ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සාමාජිකයන්	01
• පොදු කොන්ත්‍රාත් ගිවිසුම් රෙජිස්ට්‍රාර්	01
• සහකාර පොදු කොන්ත්‍රාත් ගිවිසුම් රෙජිස්ට්‍රාර්	01
• බාලදක්ෂ මූලස්ථාන කොමසාරිස්වරුන්	02
• බාලදක්ෂ දිස්ත්‍රික් කොමසාරිස්වරුන්	05
• ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සාමාජිකයන්	02
• ජාතික මූලික අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සභාවේ සාමාජිකයන්	01
• වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සාමාජිකයන්	05
• ආබාධ සහිත තැනැත්තන්ගේ ජාතික සභාවේ සාමාජිකයන්	01
• අපරාධයක විත්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරියේ සාමාජිකයන්	05
II. ඉඩම් ඔප්පු, දීර්ඝ කාලීන බදුකර	
• දීර්ඝ කාලීන බදුකර නිකුත් කිරීම	220
• සංවර්ධනය කළ ඉඩම් සඳහා දීමනාපත්‍ර නිකුත් කිරීම	290
• රණවිරු ඔප්පු නිකුත් කිරීම	41
• සුනාමි දීමනාපත්‍ර නිකුත් කිරීම	623
• විහාරස්ථාන සඳහා දීමනාපත්‍ර	52
• ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත ඉඩම් ලබාදීම	01
• නාගරික සංවර්ධන අධිකාරිය වෙත ඉඩම් පැවරීම	04
• නිවාස සංවර්ධන අධිකාරිය වෙත ඉඩම් පැවරීම	05
• විකල්ප ඉඩම් ලබාදීම	72
• මහවැලි බදුකර	48
• මහවැලි දීමනාපත්‍ර ලබාදීම (සංවර්ධනය කළ ඉඩම් සඳහා)	51
• මහවැලි දීමනාපත්‍ර ලබාදීම (ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ)	15284
• මහවැලි විහාරස්ථාන	15
• ගංඟා නිම්න සංවර්ධන මණ්ඩලය ඈවර කිරීම මත සේවය අහිමි සේවකයින්ට දීමනාපත්‍ර මත ඉඩම් ලබාදීම	12

• නව රන්බිම දීමනාපත්‍ර	9092
• රජයේ ඉඩම් ආඥා පනතේ 3 වගන්තියෙන් අවලංගු කිරීම	175
• රජයේ ඉඩම් ආඥා පනතේ 4(1) වගන්තියෙන් අවලංගු කර, 4(3) වගන්තියෙන් නව දීමනාපත්‍ර ලබාදීම	1886
• මධ්‍යම පාන්තික ඉඩම්	36
• රජයේ ඉඩම් ආඥා පනතේ 104 වගන්තියෙන් අවලංගු කිරීම	53
III. ප්‍රසම්පාදන අභියාචන මණ්ඩල	
• ප්‍රසම්පාදන අභියාචන මණ්ඩල රැස්වීම්	68
IV. සන්නද්ධ හමුදා සාමාජිකයන්ට වීර පදක්කම් ප්‍රදානය කිරීම	1357
V. ත්‍රිවිධ හමුදා අධිකාරීපත්‍ර ප්‍රදානය කිරීම	672
VI. ADC කැඳවීම	29
VII. අතිගරු ජනාධිපතිතුමා විසින් පත්කරනු ලබන මහජන නියෝජිතයින්ගේ සහ නිලධාරීන්ගේ විදේශ නිවාඩු සඳහා අනුමැතිය ලබාදීම	468
VIII. පනත් කෙටුම්පත් පිළිබඳව පළාත් සභා මතය විමසීම	02
IX. අමාත්‍ය මණ්ඩල සටහන්, පත්‍රිකා සහ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම	
➢ අමාත්‍ය මණ්ඩල සටහන්	07
➢ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා	13
➢ අමාත්‍ය මණ්ඩල නිරීක්ෂණ	02
X. චක්‍රලේඛ හා උපදෙස් ලිපි නිකුත් කිරීම	14

අභ්‍යන්තර පාලන අංශය

හැඳින්වීම

ජනාධිපති කාර්යාලයේ සියළුම අංශ හා ඒකක වෙත පැවරී ඇති කාර්යභාරයන් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය කාර්යාල ඉඩ පහසුකම් භෞතික සම්පත් හා සේවාවන් සැපයීම කළමනාකරණය කිරීම මෙම අංශය මඟින් ඉටු කරනු ලබන කාර්ය භාරය වේ.

ප්‍රධාන කාර්යයන් / අරමුණු -

- ජනාධිපති කාර්යාලයේ සියළුම අංශ හා ඒකකවලට අදාළව කාර්යාල ඉඩ පහසුකම් උපකරණ හා සේවාවන් සැපයීම
- විශේෂ/ රාජ්‍ය උත්සව සංවිධානය කිරීම හා ඊට අදාළ පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන් සම්බන්ධීකරණය කරමින් කටයුතු ඉටු කිරීම
- ජල /විදුලි /දුරකථන බිල්පත් ප්‍රමාදයකින් තොරව පියවීම
- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කිරීම, භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම, භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව අපහරණය කළයුතු භාණ්ඩ වෙන්දේසි කිරීම/ විනාශ කිරීම සිදු කර නිසි පරිදි වට්ටෝරු භාණ්ඩ ලේඛන පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම .
- සියලුම අංශ/ඒකක වලින් ලේඛනාගාරය වෙත එවනු ලබන ලිපිගොනු විධිමත්ව අසුරා තැබීම / නඩත්තු කිරීමට අවශ්‍ය කටයුතු ඉටු කිරීම.
- කාර්යාලයේ තැපැල් ඒකකය මඟින් ලැබෙන හා පිටතට යැවෙන තැපෑල විධිමත්ව, අප්‍රමාදව හා වගකීමෙන් යුතුව අදාළ අංශ/ඒකක වෙත යොමු කිරීමට කටයුතු කිරීම.
- ජනාධිපති කාර්යාලයට අනුබද්ධ සියලුම ගොඩනැගිලි වල නඩත්තු හා අලුත්වැඩියා කටයුතු, ඉංජිනේරු අංශයේ නාවික හමුදා නඩත්තු ඒකකයේ සහයෝගයෙන් ප්‍රමුඛතාවය අනුව ඉටු කිරීම.
- වාර්ෂික ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ වසරට අදාළ ඇස්තමේන්තු සකස් කිරීම, සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම, ඊට අනුකූලව භාණ්ඩ ඇණවුම් කිරීම, භාණ්ඩ නිකුත් කිරීම.
- ජනාධිපති කාර්යාලය විසින් සකස් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සන්දේශ, අමාත්‍ය මණ්ඩල පත්‍රිකා, අමාත්‍ය මණ්ඩල සන්දේශ පිළිබඳ නිරීක්ෂණ, ගැසට් නිවේදන, වක්‍රලේඛ, පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු, විවිධ ආයතන, හා පුද්ගලයින් වෙත යොමු කෙරෙන ලිපිලේඛන හා ලැබෙන ලිපිලේඛන සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාත්‍රයට පරිවර්තනය කිරීම හා කථන පරිවර්තන සේවා සැපයීම.
- අතිගරු ජනාධිපතිතුමා නියෝජනය කරමින් ප්‍රභූන්ගේ අවමංගල්‍ය අවස්ථාවන් සඳහා ශෝකය පළ කිරීම සහ ලැබෙන උපදෙස් පරිදි කටයුතු කිරීම හා අදාළ වියදම් පියවීම.

2016 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම්

1. රාජ්‍ය තාන්ත්‍රික උත්සව

රාජ්‍ය තාන්ත්‍රික උත්සව කටයුතු සංවිධානය කිරීම හා එහි සියලු කාර්යයන් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම මෙම අංශය මඟින් ඉටු කරනු ලබන සුවිශේෂී කාර්යයක් වේ. රාජ්‍ය තාන්ත්‍රික උත්සවයන්හි පහත කාර්යයන් කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින් කටයුතු කරන ලදී.

- විදේශීය රාජ්‍ය නායකයන්ගේ පැමිණීම/අක්තපත්‍ර ප්‍රදාන / වැනි උත්සව හා සාකච්ඡා සම්බන්ධව විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම.
- ඊට සමගාමීව සම්බන්ධ කර ගත යුතු රාජ්‍ය ආයතනවල නිලධාරීන් කැඳවා ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් මූලික සාකච්ඡා පවත්වා අභිමානවත් ලෙස උත්සව/ රැස්වීම් සාර්ථකව පවත්වාගෙන යාමට පහසුකම් සැලසීම සම්බන්ධීකරණය කිරීම
- හමුදා ආචාර පෙළපාලිය සඳහා විශේෂ පීයිකාව සැකසීම, රතු පලස් එලීම, හමුදා සම්මාන මුර ආචාර පෙළපාලිය හා කාලතුවක්කු සම්මාන මුර ආචාර පිරිනැමීම සඳහා කටයුතු සංවිධානය කිරීම
- රාජ්‍ය නායක හමුව, ද්විපාර්ශ්වික සාකච්ඡා හා ද්විපාර්ශ්වික ගිවිසුම් අත්සන් කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම
    - සංග්‍රහ, සැරසිලි කටයුතු සංවිධානය කිරීම
    - අවශ්‍ය අවස්ථාවලදී විවිධ ආයතන අතර සියළුම සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම

2016 වර්ෂයේ ජනාධිපති කාර්යාලයේ පැවති රාජ්‍ය තාන්ත්‍රික උත්සව අවස්ථාවන්

- 2016.01.05 - පාකිස්ථානු අග්‍රාමාත්‍යවරයාගේ ශ්‍රී ලංකා නිල සංචාරය
- 2016.02.24 - නවසීලන්ත අග්‍රාමාත්‍යවරයාගේ ශ්‍රී ලංකා නිල සංචාරය
- 2016.08.12 - නෝර්වේ අග්‍රාමාත්‍යතුමියගේ ශ්‍රී ලංකා නිල සංචාරය



- 2016.09.01 - බැන් කී මූන් මහතා පිළිගැනීම
- 2016.09.05 - ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිලධාරීන් සඳහා වූ රාත්‍රී භෝජන සංග්‍රහය
- 2016.12.13 - ටජිකිස්ථාන් ජනාධිපතිතුමාගේ ශ්‍රී ලංකා නිල සංචාරය



2. වෙනත් උත්සව අවස්ථාවන්

පහත උත්සව අවස්ථාවලදී විවිධ ආයතන අතර සියළුම සම්බන්ධීකරණ කටයුතුද, සංග්‍රහ, සැරසිලි කටයුතු හා අනෙකුත් පහසුකම් සැපයීම ද සිදු කිරීම

- 2016.01.08 දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පැවති ජනාධිපති පදවි ප්‍රාප්ති උත්සවය
- 2016.01.08,09 දින වලදී ජනාධිපති පදවි ප්‍රාප්තිය වෙනුවෙන් ජනාධිපති කාර්යාලයේදී පැවැති සර්ව රාත්‍රික පිරිත් සජ්ජායනය හා සංඝගත දක්ෂිණාව පිරිනැමීමේ කටයුතු සංවිධානය
- 2016.02.08 වන දින ජනාධිපති කාර්යාලයේදී පැවැත්වූ නව නිපැයුම්කරුවන් සඳහා වන ජනාධිපති සම්මාන ප්‍රදානෝත්සවය
- 2016.06.08 වන දින කොටුව ජනාධිපති මන්දිරය මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කිරීම
- 2016.06.13 වන දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පැවති 2015 ජනවාරි මස සිට ගමන් මග ගෝලීය සබඳතා තුළ ශ්‍රී ලංකා සමුළුව
- 2016.06.19,20 පොළොන්නරුවේ පැවති රාජ්‍ය පොසොන් උත්සවය
- 2016.07.22 දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පැවති ශ්‍රී ලංකා සංවර්ධන අභියෝග පිළිබඳ විශේෂ සම්මන්ත්‍රණය
- 2016.08.16 වන දින ජනාධිපති කාර්යාලයේදී පැවති ආබාධිත රණවිරුවන් සඳහා නිවාස ඔප්පු පිරිනැමීම
- 2016.08.18 වන දින මහනුවර ජනාධිපති මන්දිරයේදී දළදා පෙරහැරේ නිමාව සනිටුහන් කරමින් දිය කැපීමේ උත්සවය



- 2016.10.06 කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති වකුගඩු රෝග නිවාරණ ජාතික වැඩසටහන සඳහා පහසුකම් සැපයීම
- 2016.10.11 වන දින ජනාධිපති කාර්යාලයේදී ආරක්ෂක අමාත්‍යාංශයේ තාක්ෂණික නිලධාරීන් සඳහා පත්වීම් ප්‍රදානෝත්සවය
- 2016.10.18 වන දින ජනාධිපති කාර්යාලයේදී 2016 හොඳම ගොවි සංවිධානයට තායිලන්තයේ වැඩමුළුවකට ගුවන් ටිකට්පත් ප්‍රදානය

3. අක්තපත්‍ර ප්‍රදානය කිරීමේ උත්සව අවස්ථාවන්

- 2016.01.11 වන දින කොටුව මන්දිරයේදී අක්තපත්‍ර ප්‍රදානය කරන ලද රටවල්

  - ෆිලී රාජ්‍යය
  - සයිප්‍රස්
  - චෙක්
  - කාම්බෝජය
  - ඉරානය
  - ඩෙන්මාර්ක් රාජධානිය

- 2016.02.26 වන දින ජනාධිපති කාර්යාලයේදී අක්තපත්‍ර ප්‍රදානය කරන ලද රටවල්

  - ඕස්ට්‍රේලියාව
  - බ්‍රසීලය

  2016.04.22 වන දින කොටුව ජනාධිපති මන්දිරයේදී අක්තපත්‍ර ප්‍රදානය කරන ලද රටවල්

  - මැලේසියාව
  - උරුගුවේ
  - හංගේරියාව
  - සොල්වීනියාව
  - මාලි
  - මුරුසිය
  - තුර්කිය

- 2016.07.21 වන දින කොටුව ජනාධිපති මන්දිරයේදී අක්තපත්‍ර ප්‍රදානය කරන ලද රටවල්

  - මෙක්සිකෝව
  - පෘතුගාලය
  - ග්‍රීසිය
  - අයර්ලන්තය

- 2016.10.05 වන දින මහගමසේකර මාවත ජනාධිපති නිල නිවසේදී අක්තපත්‍ර ප්‍රදානය කරන ලද රටවල්

  - බංග්ලාදේශය
  - ජර්මනිය

- 2016.12.01 වන දින ජනාධිපති කාර්යාලයේදී අක්තපත්‍ර ප්‍රදානය කරන ලද රටවල්
  - කියුබාව






4. මීට අමතරව 2016 වසර තුලදී කාර්යාලයේ විවිධ කටයුතු සඳහා පවත්වන ලද රැස්වීම් 1155 ක් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම
5. වෙනත්
    - ජනාධිපති ලේකම් කාර්යාලය හා ඒ යටතේ ඇති සියළුම ආයතනවල භාණ්ඩ සමීක්ෂණ කටයුතු පවත්වා අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම
    - ජනාධිපති කාර්යාලයට අයත් සියළු කටයුතු සඳහා වියදම් බිල්පත් ප්‍රමාදයකින් තොරව පියවීම
    - අතිගරු ජනාධිපතිතුමා විසින් පරිහරණය කරනු ලබන මන්දිරවල හා ජනාධිපති කාර්යාලය යටතේ ඇති ආයතන පරිශ්‍රවල නඩත්තුව හා මනා පැවැත්මකින් යුතුව පවත්වාගෙන යාම.
    - ජනාධිපති කාර්යාලය විසින් නිකුත් කරනු ලබන සියළුම ලේඛන කඩිනමින් භාෂාත්‍රයට පරිවර්තනය කිරීම හා කථන පරිවර්තන සේවා සැපයීම
    - භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කරගැනීම හා මිලදී ගැනීමට අදාළ වාර්ෂික ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසියාකාරව සිදු කිරීම

මානව සම්පත් සංවර්ධන අංශය

හැඳින්වීම

ජනාධිපති කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ බඳවා ගැනීම් /ස්ථාන මාරු /උසස් කිරීම් /විනය පාලනය සම්බන්ධ ආයතනික කටයුතු සහ කාර්ය මණ්ඩලයේ ඵලදායීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියා කිරීම.

ප්‍රධාන කාර්යයන් / අරමුණු

- ජනාධිපති කාර්යාලයේ කාර්යමණ්ඩලය බඳවා ගැනීම, ස්ථානමාරු කිරීම, උසස් කිරීම් හා විනය පාලනය සම්බන්ධ ආයතන කටයුතු
- ජනාධිපති කාර්ය මණ්ඩලය සඳහා මු.රෙ. 71 යටතේ තනතුරු ඇති කිරීමට අදාළ කටයුතු
- ජනාධිපති කාර්යාලයේ සහ අනෙකුත් කාර්ය මණ්ඩලයට බඳවා ගනු ලබන නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීනව පවත්වා ගෙන යාම
- ජනාධිපති කාර්යාලයේ කාර්යමණ්ඩලයේ නිලධාරීන්ගේ/ සේවකයින්ගේ ආරක්ෂක නිශ්කාෂණ වාර්තා ලබාගැනීම සම්බන්ධ කටයුතු
- අනුමත සේවක සංඛ්‍යා විස්තර සකස්කිරීම හා යාවත්කාලීනව පවත්වාගෙන යාම
- ජනාධිපති කාර්යාලයේ සංවිධාන ව්‍යුහය පවත්වාගෙන යාම
- ජනාධිපති කාර්යමණ්ඩලයට බඳවාගෙන ඇති රාජ්‍ය සේවයේ ස්ථීර/ තාවකාලික නිලධාරීන්ගේ කාර්ය සාධන වාර්තා ඇගැයීම් කටයුතු
- ජනාධිපති කාර්යමණ්ඩලයට බඳවාගෙන ඇති නිලධාරීන් සඳහා දේශීය/විදේශීය පුහුණු හා සංවර්ධන කටයුතු සංවිධානය කිරීම
- රජයේ නිලධාරීන් සඳහා ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය යටතේ ලබාදිය හැකි නිවාස, දේපළ ණය, ආපදා ණය ඇතුළු වෙනත් ණය මුදල් නිර්දේශ කිරීම/ අනුමත කිරීම
- ජනාධිපති කාර්යමණ්ඩලයේ නිලධාරීන්ගේ නිවාඩු දුම්රිය බලපත්‍ර, අනුග්‍රහ දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර ලබාදීමට අදාළ කටයුතු
- අග්‍රහාර රක්ෂණ වන්දි ලබාදීම නිර්දේශ කිරීම
- ජනාධිපති කාර්යමණ්ඩලයේ නිලධාරීන්ගේ නිවාඩු, අතිකාල දීමනා, ගමන් වියදම් හා අනෙකුත් දීමනා අනුමත කිරීමට අදාළ කටයුතු
- කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන්ගේ ඵලදායීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියා කිරීම
- ගුවන්තොටුපල පර්යන්ත විශේෂ පහසුකම් ලබාගැනීමට හිමිකම් ලබන ජනාධිපති කාර්යාලයේ කාර්යමණ්ඩලයේ නිලධාරීන් සඳහා එම පහසුකම් සැලසීම සම්බන්ධ කටයුතු
- විදේශ රාජකාරී ගමන් බලපත්‍ර නිකුත් කිරීමට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම සහ වීසා බලපත්‍ර ලබාගැනීමට ඉල්ලුම් කිරීමේදී සේවය සහතික කිරීම

- අතිගරු ජනාධිපතිතුමාගේ විදේශ සංචාරවලදී සහභාගී වන ජනාධිපති කාර්යමණ්ඩලයේ නිලධාරීන්ට විදේශ ගමන් සඳහා හිමි දීමනා සහ ඒ ආශ්‍රිත වියදම් ගෙවීම
- තීරු බදු රහිත වාහන බලපත්‍ර නිකුත් කිරීමට අදාළ රාජකාරී
- පුස්තකාලයට අදාළ පරිපාලන කටයුතු
- එක් භාෂාවකට වැඩි භාෂා ගණනක ප්‍රවීණතාවය ඇති රාජ්‍ය නිලධාරීන්ට දිරි දීමනා ගෙවීම සම්බන්ධ කටයුතු හා රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු
- පැමිණීමේ හා පිටවීමේ සටහන් තබා ගැනීම සහ ඇඟිලි සලකුණු යන්ත්‍ර සම්බන්ධව අධීක්ෂණය
- චක්‍රීය සේවයේ යොදවන නිලධාරීන්ගේ හා කණිෂ්ඨ සේවකයින්ගේ මාසික චක්‍රීය වැඩසටහන් පිළියෙල කිරීම

2016 වර්ෂයේ සාක්ෂාත් කරගැනීම්

බඳවා ගැනීම් අනුයුක්ත කිරීම්, ස්ථාන මාරු කිරීම්, විශ්‍රාම ගැනීම් හා විනය පියවර ගැනීම පිළිබඳ රාජකාරී අදාළ කාලය තුළ පත්වීම් හා අනුයුක්ත කිරීම් 337 ක්ද විශ්‍රාම ගැනීම් 07 ක් ද ස්ථානමාරු කිරීම් හා ආපසු මුදා හැරීම් 216 ක් හා අග්‍රහාර වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම් 77 ක්ද සිදු කර ඇත.

2016.12.31 දින දක්වා කාර්ය මණ්ඩලය

අනුමත කාර්ය මණ්ඩලය : 1496
සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය : 983

2016.12.31 දිනට කාර්ය මණ්ඩලයේ ස්වභාවය

ස්ථිර	තාවකාලික	කොන්ත්‍රාත්	අනුයුක්ත	එකතුව
642	184	49	108	983



දේශීය හා විදේශීය පුහුණු අවශ්‍යතා සැපයීම

විදේශීය පුහුණු

විදේශ පුහුණු පාඨමාලා සඳහා අනුමැතිය ලැබ එම පුහුණු පාඨමාලා සඳහා 2016.01.01 දින සිට 2016.12.31 දින දක්වා සහභාගී වූ මාණ්ඩලික නිලධාරීන් සංඛ්‍යාව 24 කි.

දේශීය පුහුණු

ජනාධිපති කාර්යාලයේ සෑම අංශයකම / ඒකකයකම සිටින ද්විතීයික හා ප්‍රාථමික මට්ටම්වල නිලධාරීන්ගේ/ සේවකයන්ගේ දැනුම කුසලතා හා ආකල්ප වර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන් / වැඩමුළු පහත පරිදි පවත්වා ඇත

අනු අංකය	2016.01.01 සිට 2016.12.31 දක්වා පවත්වන ලද දේශීය පුහුණු පාඨමාලා	පුහුණුලාභීන් කණ්ඩායම	සංඛ්‍යාව
01	සංග්‍රහ කටයුතු හා සත්කාරක විධික්‍රම භාවිතය පිළිබඳ පුහුණු වැඩමුළුව	ගුවන් හමුදා සංග්‍රහ ඒකකයේ සාමාජිකයන්	40
02	රියදුරු කුසලතා වර්ධනය පිළිබඳ විශේෂ වැඩමුළුව	රියදුරන් සඳහා	55
03	නවක රියදුරු කුසලතා සංවර්ධන දෙදින වැඩමුළුව	රියදුරන් සඳහා	40
04	මාධ්‍ය අංශයේ නිලධාරීන් සඳහා පැවැත්වෙන එක්දින වැඩමුළුව	මාධ්‍ය අංශයේ සියලුම නිලධාරීන්	132
05	ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව	රියදුරන් සඳහා	88
06	විශ්‍රාම වැටුප් විෂය පිළිබඳ වැඩමුළුව	රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන්	30
07	වාහනවල දෛනික ධාවන සටහන් පත්‍ර ලිවීම පිළිබඳ වැඩමුළුව	රියදුරන් සඳහා	68
08	ඵලදායිතා සංවර්ධන පුහුණු වැඩමුළුව	රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන්	229
09	ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු පාඨමාලාව	සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශයේ සියලුම නිලධාරීන්	74

ආයතන සම්බන්ධීකරණ අංශය

හැඳින්වීම

ආයතන සම්බන්ධීකරණ ඒකකය මඟින් අතිගරු ජනාධිපතිතුමාගේ අධීක්ෂණය යටතේ පවතින ස්වාධීන කොමිෂන් සභා/අමාත්‍යාංශ/ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා සහ ආයතනයන්හි ආයතනික හා පරිපාලන කටයුතු සම්බන්ධීකරණය කිරීම සිදු කරනු ලැබේ. එසේ සම්බන්ධීකරණය කරනු ලබන ආයතන සංඛ්‍යාව 30 ක් වන අතර, කිසියම් ආයතනයකට ඇතුළත් නොවන විවිධ කටයුතුද මෙම අංශය මඟින් සිදු කරනු ලැබේ.

ප්‍රධාන කාර්යයන් / අරමුණු

- අතිගරු ජනාධිපතිතුමාගේ අධීක්ෂණය යටතේ පවතින අමාත්‍යාංශයන්හි සම්බන්ධීකරණ කටයුතු නොපමාව සිදු කිරීම.
- 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ස්ථාපිත කරන ලද ස්වාධීන කොමිෂන් සභා වෙත පහසුකම් සැපයීම හා සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.
- ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා, කමිටු සහ කාර්යසාධක බලකායන්හි ප්‍රතිපත්තිමය, ආයතන හා පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ලැබෙන ලිපි සඳහා කඩිනමින් පිළිතුරු සැපයීම.
- අතිගරු ජනාධිපතිතුමාගේ අධීක්ෂණය යටතේ පවතින අනෙකුත් ආයතනයන්හි ආයතනික, පරිපාලන හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- අතිගරු ජනාධිපතිතුමා වෙනුවෙන් ගරු අග්‍රාමාත්‍යතුමා විසින් පිළිතුරු සැපයිය යුතු සියලුම පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා අදාළ අමාත්‍යාංශ, ආයතන හා අංශ සම්බන්ධීකරණය කොට පිළිතුරු සැපයීම.
- අතිගරු ජනාධිපතිතුමාගේ අධීක්ෂණය යටතේ පවතින අමාත්‍යාංශවල (අතිගරු ජනාධිපතිතුමන් විසින් කරනු ලැබූ පත්කිරීම් හැර) හා අමාත්‍යාංශයන් යටතට නොගැනෙන ස්වාධීන ආයතනවල විදේශ නිවාඩු හා දිවයිනෙන් බැහැර යාමට අදාළ කටයුතු සඳහා අනුමැතිය ලබාදීමට කටයුතු කිරීම.
- සුවිශේෂ තැනැත්තන් සඳහා රාජ්‍ය තාන්ත්‍රික බලපත්‍ර නිකුත් කිරීම හා ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානයට අදාළ කටයුතු.
- ඉදිරිපත්වන මහජන පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම
- වාර්ෂික විගණන කටයුතු ඉටු කිරීම

2016 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම

ආයතනය	ඉටු කරන ලද කාර්යභාරය	එකතුව
අතිගරු ජනාධිපතිතුමා අමාත්‍යාධුරය හොබවනු ලබන අමාත්‍යාංශවල අවශ්‍ය අවස්ථාවලදී සම්බන්ධීකරණ කටයුතු කිරීම		
ආරක්ෂක අමාත්‍යාංශය	-	-
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය	විවිධ කටයුතු	-
ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය	ආයතන කටයුතු	02
19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද ස්වාධීන කොමිෂන් සභාවල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම		
මැතිවරණ කොමිෂන් සභාව	විදේශ නිවාඩු සම්බන්ධ කටයුතු	19
	ආයතන කටයුතු	32
රාජ්‍ය සේවා කොමිෂන් සභාව	විදේශ නිවාඩු සම්බන්ධ කටයුතු	07
	විවිධ ඉල්ලීම්	12
ජාතික පොලිස් කොමිෂන් සභාව	වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම	2013 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
	විවිධ ඉල්ලීම්	01
	ලේකම්ගේ නිවාඩු අනුමත කිරීම	-
විගණන සේවා කොමිෂන් සභාව	ආයතන කටයුතු	01
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව	ආයතන කටයුතු	65
	මහජන පැමිණිලි	16
	විදේශ නිවාඩු සම්බන්ධ කටයුතු	25
	ගොඩනැගිල්ලක් මිලදී ගැනීම	-
	බඳවා ගැනීම් පරිපාටිය අනුමත කිරීම	33
	වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම	2013 හා 2014 වර්ෂයන්ට අදාළ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව	විදේශ නිවාඩු සම්බන්ධ කටයුතු	12
	ආයතන කටයුතු	39
	අල්ලස් කොමිෂන් සභාවට ගොඩනැගිල්ලක් ලබා ගැනීම සම්බන්ධ කටයුතු	-
	වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම	2008 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වර්ෂයන්ට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා කටයුතු කර ඇත.

ආයතනය	ඉටු කරන ලද කාර්යභාරය	එකතුව
මුදල් කොමිෂන් සභාව	ආයතන කටයුතු	17
	කාර්යාල සංකීර්ණය ඉදිකිරීම	03
	විදේශ නිවාඩු සම්බන්ධ කටයුතු	03
	වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම	2015 වර්ෂයට අදාළව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.
සීමා නිර්ණය කොමිෂන් සභාව	ආයතන කටයුතු	23
ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව	ආයතන කටයුතු	41
අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලැබ ඇති පරීක්ෂණ කොමිෂන් සභා, ජනාධිපති කාර්ය සාධක බලකායන් සහ ආයතනවල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම		
අමාත්‍ය මණ්ඩල කාර්යාලය	විදේශ නිවාඩු සම්බන්ධ කටයුතු	12
විගණකාධිපති දෙපාර්තමේන්තුව	විදේශ නිවාඩු සම්බන්ධ කටයුතු	23
	ආයතන කටයුතු	25
අධිකරණ සේවා කොමිෂන් සභාව	ආයතන කටයුතු	04
	වාර්ෂික වාර්තා	2013,2015 වර්ෂයන්ට අදාළ වාර්ෂික වාර්තා එවන මෙන් දන්වා යවා ඇත.
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව	ආයතන කටයුතු	05
	විදේශ නිවාඩු සම්බන්ධ කටයුතු	02
	මාණ්ඩලික නිලධාරීන් සඳහා වූ කාර්යසාධන ඇගයීම	2015වර්ෂයේ කාර්ය සාධනය හා 2016 වර්ෂයේ වාර මැද ඇගයීම දක්වා අනුමත කර යවා ඇත.
	වාර්ෂික වාර්තා	2014-2015 වාර්ෂික වාර්තා සකස් කරමින් පවතියි.
ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව	ආයතන කටයුතු	07
	විදේශ නිවාඩු	12
තොරතුරු දැන ගැනීමේ කොමිෂන් සභාව	ආයතන කටයුතු	18

ආයතනය	ඉටු කරන ලද කාර්යභාරය	එකතුව
බරපතල වංචා, දූෂණ, රාජ්‍ය සම්පත් වරප්‍රසාද බලය සහ අධිකාරිය අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.	බිල්පත් පියවීම්	125
	ආයතන කටයුතු	34
	විවිධ කටයුතු	10
අතුරුදහන් වූවන් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිෂන් සභාව	ආයතන කටයුතු	43
	සුළු මුදල් අග්‍රිමය	16
	බිල්පත් පියවීම	39
	වැටුප් ගෙවීම	24
	මහජන හමු පැවැත්වීම	21
රාජ්‍ය වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ විශේෂ ජනාධිපති කාර්ය සාධක බලකාය	ආයතන කටයුතු	01
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව	විදේශ නිවාඩු සම්බන්ධ කටයුතු	71
	වීසා ලබාදීම් හා අනුමත කිරීම්	91
	ආයතන කටයුතු	61
	විවිධ කටයුතු	91
ශ්‍රී ලංකා පදනම	විදේශ නිවාඩු සම්බන්ධ කටයුතු	21
	ආයතන කටයුතු	28
	වාර්ෂික වාර්තා	2012-2015 දක්වා වාර්ෂික වාර්තා එවන ලෙස දන්වා ලිපි යොමු කර ඇත.
	සහනදායී පදනම මත වාහන ආනයනය	01
පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය	ආයතන කටයුතු	09
	වාර්ෂික වාර්තා	2015 වර්ෂය දක්වා සියලුම වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.
එස්.ඩබ්ලිව්.ආර්.ඩී.බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම,	ආයතන කටයුතු	08
	විවිධ ඉල්ලීම්	03
පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය	ආයතන කටයුතු	17
	ක්‍රියාත්මක නොවූ නිර්දේශ	09
ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය	ආයතන කටයුතු	14

ආයතනය	ඉටු කරන ලද කාර්යභාරය	එකතුව
නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රහහල	නඩත්තු කටයුතු	91
	විදුලි බිල් නිරවුල් කිරීම්	27
	ජල බිල් නිරවුල් කිරීම්	23
	දුරකථන හා අන්තර්ජාල නිරවුල් කිරීම්	15
	පුවත්පත් බිල් නිරවුල් කිරීම	11
	මධ්‍යස්ථානය වෙන් කර ගැනීම	62
	පවිත්‍රතා කටයුතු සම්බන්ධ ලිපි	15
	ප්‍රසම්පාදන කමිටු පත් කිරීම	38
	සුළු මුදල් අග්‍රිමය	28
	විවිධ කටයුතු	142
	කාර්ය මණ්ඩලය සම්බන්ධ ගැටලු	08
	ගොඩනැගිලි කටයුතු	06
නෙළුම් කුළුණ	විවිධ කටයුතු	06
උපාය මාර්ගික ව්‍යවසාය කළමනාකරණ ආයතනය	ආයතන කටයුතු	17
විවිධ කටයුතු		
පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.		12
පළාත් ප්‍රධාන අමාත්‍යවරුන්ගේ විදේශ නිවාඩු අනුමැතිය ලබාදීමට කටයුතු කිරීම	විදේශ නිවාඩු සම්බන්ධ කටයුතු	13
රාජ්‍ය තාන්ත්‍රික බලපත්‍ර ලබාදීම		10
ශ්‍රී ලංකා පාර්ලිමේන්තු නිලධාරීන්ගේ විදේශ නිවාඩු		-

ප්‍රතිපත්ති, සම්බන්ධීකරණ හා ප්‍රගති සමාලෝචන අංශය

හැඳින්වීම

අතිගරු ජනාධිපතිතුමාගේ නියෝග සහ ජනාධිපති ලේකම්ගේ උපදෙස් මත ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් එම්.කිංස්ලි ප්‍රනාන්දු මහතාගේ සෘජු අධීක්ෂණය යටතේ ප්‍රතිපත්ති, සම්බන්ධීකරණ හා ප්‍රගති සමාලෝචන අංශය ක්‍රියාත්මක වේ.

ප්‍රධාන කාර්යයන් / අරමුණු

- **ප්‍රතිපත්ති සම්පාදනය පහසුකරණය හා සම්බන්ධීකරණය කිරීම**
- **දිස්ත්‍රික් සංවර්ධන කටයුතු "මෛත්‍රී පාලනයක්- ස්ථාවර රටක්" අනුව සිදුවන්නේ දැයි තහවුරු කිරීම,**
- **"දියුණු හා වගකීම් සහගත රාජ්‍ය අංශයක්""මෛත්‍රී පාලනයක්- ස්ථාවර රටක්" ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව අන්තර් අමාත්‍යාංශ හා සම්බන්ධීකරණය,**
- **සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් අධීක්ෂණය සහ ප්‍රගති සමාලෝචන කටයුතු,**
- **සමාජ, ආර්ථික හා සංස්කෘතික ගැටලු සහ සමාජ අවශ්‍යතා පිළිබඳ අධ්‍යනයන් කිරීම,**
- **ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු එක් රැස් කිරීම, විශ්ලේශණය කිරීම හා අවශ්‍යතාවය පරිදි වාර්තා සැපයීම,**
- **පෝෂණ වැඩසටහන සම්බන්ධ සියළු පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීමට සහයවීම, මෙහි ප්‍රධාන අරමුණ වනුයේ වයස අවු: 5ට අඩු දරුවන් අතර මිටිබව සහ බර අඩුතාවය 40% කින් අවම කිරීම සහ කෘෂවීම 5% කට අඩු සංඛ්‍යාවක් දක්වා අවම කිරීම මෙන්ම අධිබර දරුවන්ගේ ප්‍රතිශතය තවදුරටත් වර්ධනය නොවීම සඳහා කටයුතු කිරීම. අඩුබර දරු උපත් හා කාන්තාවන් අතර අඩුබර හා අධිබර පවතින මට්ටම්වලින් 30% දක්වා අඩුකර ගැනීම. නිරක්තිය පවතින මට්ටමෙන් 50% කින් අඩුකිරීම.**

2016 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම්

2016 වර්ෂයේදී ඉහත අරමුණු ඉටුකර ගැනීම සඳහා මෙම අංශය මඟින් සංවිධානය කරන ලද රැස්වීම් සහ වැඩසටහන් ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

කාරණය	රැස්වීම්/ක්‍රියාකාරකම්
අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන්	32
ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන්	37
ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්ගේ ප්‍රධානත්වයෙන්	30
ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ ප්‍රධානත්වයෙන්	24
වෙනත්	23
එකතුව	146

මෙහිදී,

සංවර්ධන ව්‍යාපෘති ප්‍රගති සමාලෝචනය,
(අ) අමාත්‍යාංශ 51ක සංවර්ධන කටයුතුවල ප්‍රගති සමාලෝචනය - සාමාන්‍ය

2016 වර්ෂයේ කාර්තු 04 ට අදාළව ඒ ඒ අමාත්‍යාංශ විසින් සිදුකරනු ලැබූ සංවර්ධන කටයුතුවල ප්‍රගතිය විමසන ලදී.

I. පළමු කාර්තුව

අමාත්‍යාංශ 51 ටම අදාළ සංවර්ධන ව්‍යාපෘති 714 ක භෞතික හා මූල්‍ය ප්‍රගතිය විමසන ලදී.

II. දෙවන කාර්තුව

- අමාත්‍යාංශ 51ට අදාළ සංවර්ධන ව්‍යාපෘති 1064ක භෞතික හා මූල්‍ය ප්‍රගතිය විමසන ලදී. දෙවන කාර්තුව වන විට 20%ක මූල්‍ය ප්‍රගතිය අත්කර නොගත් අමාත්‍යාංශ 18ක් ගෙන්වා උපදෙස් ලබාදෙන ලදී.
- මධ්‍ය වාර්ෂික ප්‍රගතිය අත්කර නොගත් (30% ක මූල්‍ය ප්‍රගතිය) අමාත්‍යාංශ 23ක් සඳහා "විශ්ලේෂණාත්මක අධීක්ෂණ වාර්තා" යොමුකරන ලදී.
- සමස්ත අමාත්‍යාංශවල ප්‍රගතිය දැක්වෙන ජාතික වාර්තාව ජනාධිපති ලේකම්තුමාගේ අවධානය වෙත යොමුකරන ලදී.

III. තෙවන කාර්තුව

- අමාත්‍යාංශ 51ට අදාළ සංවර්ධන ව්‍යාපෘති 1273ක භෞතික හා මූල්‍ය ප්‍රගතිය විමසන ලදී.දෙවන කාර්තුව වන විට 60%ක මූල්‍ය ප්‍රගතිය අත්කර නොගත් අමාත්‍යාංශ 12ක් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකරන ලදී.
- අපේක්ෂිත ප්‍රගතිය අත්කර නොගත් (60% ක මූල්‍ය ප්‍රගතිය) අමාත්‍යාංශ 17ක් සඳහා විශ්ලේෂණාත්මක අධීක්ෂණ වාර්තා යොමුකරන ලදී.
- සමස්ත අමාත්‍යාංශවල ප්‍රගතිය දැක්වෙන ජාතික වාර්තාව ජනාධිපති ලේකම්තුමාගේ අවධානය වෙත යොමුකරන ලදී.

IV. සිව්වන කාර්තුව

- අමාත්‍යාංශ 51ට අදාළ සංවර්ධන ව්‍යාපෘති 1243ක භෞතික හා මූල්‍ය ප්‍රගතිය විමසන ලදී.
- සමස්ත අමාත්‍යාංශවල ප්‍රගතිය දැක්වෙන 2016 ජාතික වාර්තාව සකසමින් පවතී.

(ආ) අමාත්‍යාංශ 51ක සංවර්ධන කටයුතුවල ප්‍රගති සමාලෝචනය - විශේෂ

- අමාත්‍යාංශ 51ක සංවර්ධන වියදම් ප්‍රගතිය පිළිබඳව 2016.09.26 සහ 2016.11.11 දින ජනාධිපති ලේකම්තුමා, අග්‍රාමාත්‍යතුමා හා තවත් ලේකම්වරුන්ගේ සාකච්ඡාවේදී සමස්ථ ප්‍රගතිය සමාලෝචනය කරන ලදී.

(ඇ) රජයේ සංවර්ධන මෙහෙවර සමාලෝචනය

2015.01.08 වන දින සිට 2016.11.25 වන දින දක්වා රජය විසින් අරඹන ලද සංවර්ධන ව්‍යාපෘති සියල්ල පිළිබඳව තොරතුරු එක් රැස්කර ඒ පිළිබඳව වාර්තාවක් පිළියෙල කිරීම සඳහා ජනාධිපති මාධ්‍ය අංශය වෙත යොමුකරන ලදී.

(ඇ) "තිරසර යුගයක තෙවසර ඇරඹුම" වැඩසටහන්

අතිගරු ජනාධිපතිතුමාගේ ඉදිරි තෙවර්ෂය ඇරඹීම නිමිත්තෙන් අමාත්‍යාංශ විසින් ඉටු කිරීමට නියමිත වැඩසටහන් අප වෙත ලබා ගෙන ඒවා තිරසර සංවර්ධන ඉලක්ක වලට අනුගතව සකස් කර ක්‍රියාත්මක කරන ලෙසට ඒ ඒ අමාත්‍යාංශ වලට දන්වන ලදී.

එසේම තිරසර යුගයක තෙවසර ඇරඹුමට සමගාමීව,

I. "සියලු ජාතීන්ට එක හා සමානව සලකන පාලනයක්" යන තේමාව යටතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ ද

II. "වතුකරයේ ජනතාවට ගෞරවාන්විත ජීවිතයක් ලබාදීම" යන තේමාව යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ ද

වැඩසටහන් දෙකක් සැලසුම් කරන ලදී.

(ඉ) අමාත්‍යාංශ සඳහා ප්‍රධාන කාර්ය දර්ශක සැකැසීම

මධ්‍යකාලීන හා දීර්ඝකාලීන ඉලක්ක ජයගැනීම සඳහා, අමාත්‍යාංශ වලට අදාළ ප්‍රධාන කාර්ය දර්ශක 10 ක් සකස් කර, අප වෙත ලබාදෙන ලෙස දන්වන ලද අතර, එම දර්ශක සමාලෝචනය කරමින් පවතී.

2. විශේෂ දිස්ත්‍රික් සම්බන්ධීකරණ රැස්වීම්

ජාතික සංවර්ධන සැලසුම් වලට අනුකූලව දිස්ත්‍රික් මට්ටමේදී රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලබන සියලුම සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පසු විපරම් කිරීමේ අරමුණින් පොළොන්නරුව, ගම්පහ, කෑගල්ල, මාතර යන දිස්ත්‍රික්ක වල අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් විශේෂ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වන ලදී. එම කමිටු රැස්වීම් වල පසුවිපරම් කටයුතු අඛණ්ඩව සිදුවෙමින් පවතී. එසේම මහනුවර නගර සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා විසින් විශේෂයෙන් සොයා බැලීමට දන්වනු ලැබූ හෙයින් ඒ සම්බන්ධයෙන් පසුවිපරම් රැස්වීම් 02 ක්, අතිගරු ජනාධිපති තුමාගේ ප්‍රධානත්වයෙන් 2016.03.01 දින හා ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් 2016.09.19 දින ද පවත්වන ලද අතර එමඟින් ගැටලු රාශියක් නිරාකරණය කරන ලදී.

3. අමාත්‍යාංශ ප්‍රතිපත්ති සම්බන්ධීකරණය

අමාත්‍යාංශ වල පවතින ගැටලුකාරී ප්‍රශ්න නිරාකරණය කර දීමට හා හදිසි ආපදා අවස්ථාවලදී(ගංවතුර/නියඟය) මැදිහත්වී අදාල පාර්ශවයන් ගෙන්වා අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා පවත්වා අවශ්‍ය තීන්දු තීරණ හා නියෝග ලබාදීම සිදු කරන ලදී. එසේම අමාත්‍යාංශ වල සාමාන්‍ය පරිපාලනයේදී මතුවන ගැටලු සහ ජාතික මට්ටමේ මැදිහත්වීම් වලදී පැවරෙන වගකීම් පිළිබඳව සාකච්ඡා හා පසුවිපරමද, ව්‍යවස්ථාපිත සමිති වල දුක්ගැනවිලි සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ මැදිහත්වීම අවශ්‍ය අවස්ථාවන්හි ඉටුකරන ලද රාජකාරීද ඇතුලත්වේ.

4. පෝෂණ වැඩසටහන

2016 වර්ෂයේදී ඉටුකරන ලද ක්‍රියාකාරකම්

1. පෝෂණය සඳහා වන බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම 2013-2016 යටතේ අමාත්‍යාංශ මට්ටමින් ක්‍රියාත්මක නොවූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය, පසුවිපරම් කිරීම සහ ඇගයීම.

2. පෝෂණය සඳහා වන බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම යටතේ පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමින් පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය, පසුවිපරම් කිරීම සහ ඇගයීම.

3. පෝෂණය සඳහා වන ග්‍රාමීය කමිටු දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

4. "පෝෂණය සහ ප්‍රජා සවිබලගැන්වීම" සම්බන්ධයෙන් පෙර පාසල් ගුරුවරුන් දැනුවත් කිරීම.

5. "පෝෂණය සහ ප්‍රජා සවිබලගැන්වීම" සම්බන්ධයෙන් පෙර පාසල් දරුවන්ගේ දෙමාපියන් දැනුවත් කිරීම.

6. "පෝෂණය සහ ප්‍රජා සවිබලගැන්වීම" සම්බන්ධයෙන් අමාත්‍යාංශ සහ පළාත් සභා මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති පෝෂණය විෂයයට සම්බන්ධ නිලධාරීන් දැනුවත් කිරීම.

7. අමාත්‍යාංශ සහ පළාත් සභා මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති පෝෂණය විෂයයට සම්බන්ධ නිලධාරීන් හරහා "පෝෂණය සහ ප්‍රජා සවිබලගැන්වීම" සම්බන්ධයෙන් වැඩසටහන් පැවැත්වීම.

8. පාසල් මට්ටමින් පෝෂණය විෂයය ආවරණය කිරීම සම්බන්ධයෙන් පාසල්වල සිටින සෞඛ්‍ය සහ ශාරීරික අධ්‍යාපනය විෂයය භාර ගුරුවරුන් දැනුවත් කිරීම.

9. දිවයින පුරා ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් පෝෂණ අවදානම් සහිත ගෘහ ඒකක හඳුනාගැනීම.

10. ජාතික පෝෂණ තොරතුරු පද්ධතිය (National Nutrition Information System) සංවර්ධනය කිරීම.

11. පෝෂණය සඳහා වන බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාක්මක කිරීමට අදාළව, නියමු ව්‍යාපෘති බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ නුවරඑළිය දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක කිරීම.

මූල්‍ය කළමනාකරණ අංශය

හැඳින්වීම

ජනාධිපති කාර්යාලයට අදාළ සියලුම මූල්‍ය කළමනාකරණ කටයුතු කිරීම.

ප්‍රධාන කාර්යයන් / අරමුණු

- ස්ථීර, තාවකාලික, අනියම්, කොන්ත්‍රාත් හා අනුයුක්ත නිලධාරීන්ගේ මාසික වැටුප්, දීමනා හා පාරිශ්‍රමික ගෙවීම
- නිලධාරීන්ගේ අතිකාල දීමනා හා ගමන් වියදම් දීමනා ගෙවීම
- ජනාධිපති කාර්යාලය වෙනුවෙන් වූ සේවා සහ සැපයීම් වලට අදාල ගෙවීම් කිරීම
- මාසික ගිණුම් සාරාංශ හා බැංකු සැසඳුම් පිළියෙල කිරීම හා මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම
- වාර්ෂික විසර්ජන ගිණුම පිළියෙල කිරීම හා මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම
- වාර්ෂික අයවැය පිළියෙල කිරීම හා මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම
- අයවැය කාරක සභා අවස්ථාවට අදාළ කටයුතු
- කාර්යාලයීය ගිණුම් භාණ්ඩාගාර ගිණුම් සමඟ සැසඳීම
- වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත ප්‍රතිපාදන නිදහස් කිරීම
- නිල විදේශ සංචාරයන් හා නිලධාරීන්ගේ පුහුණු සඳහා වන විදේශ සංචාරයන්ට අදාල කටයුතු

2016 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම්

2016 වර්ෂය සඳහා වන මුළු ප්‍රතිපාදන ප්‍රමාණය සහ මුළු වියදම

විස්තරය	පුනරාවර්තන	මූලධන
මුළු ප්‍රතිපාදනය	2,081	4,779
මුළු වියදම	1,985	4,178
%	4,066	8,957



2014 , 2015 හා 2016 වර්ෂවල මුළු වියදම් සැසඳීම

වර්ෂය	2014	2015	2016
පුනරාවර්තන	4,693	2,116	2,081
මූලධන	5,183	1,191	4,779



අභ්‍යන්තර විගණන අංශය

හැඳින්වීම

ජනාධිපති කාර්යාලය හා ඒ යටතේ ඇති සියලුම ආයතනවල අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සහ ජනාධිපති ලේකම්වරයා විසින් පවරනු ලබන විශේෂ අභ්‍යන්තර විගණන විමර්ශන කටයුතු සිදු කිරීම සඳහා ජනාධිපති ලේකම්වරයා යටතේ පිහිටුවා ඇති අංශයකි.

ප්‍රධාන කාර්යයන් / අරමුණු

- ජනාධිපති කාර්යාලයේ සහ ජනාධිපති කාර්යාලය යටතේ ඇති සියලුම ආයතනවල මුදල් කටයුතු පිළිබඳව පවත්වන අභ්‍යන්තර පාලන ක්‍රමයට සහභාගී වීම, එම කටයුතුවල වැරදි හා වංචා වැලැක්වීමට සහ අනාවරණය කර ගැනීමට භාවිතා කරනු ලබන අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත් බව හා ප්‍රමාණවත් බව පිළිබඳව අඛණ්ඩ සමීක්ෂණයක් හා ස්වායත්ත ඇගයීමක් පවත්වාගෙන යාම.

- වැඩ,යෝජනා ක්‍රම හා ව්‍යාපෘති යන මේවායේ ප්‍රගතිය සොයා බැලීම සම්බන්ධයෙන් ජනාධිපති ලේකම්වරයාට සහාය වීම .

වසර 2016 දී ප්‍රධාන සාක්ෂාත් කර ගැනීම.

අනු අංකය	සැලසුම	තත්ත්වය	ඵලදායීතා ප්‍රතිශතය
01	ජනාධිපති කාර්යාලයේ වේලා සටහන් යන්ත්‍ර මඟින් පැමිණීම හා පිටවීම සටහන් කිරීම	සමාප්ත	100%
02	නෙළුම් පොකුණ මඟින්ද රාජපක්ෂ රහහල	සමාප්ත	100%
03	ජනාධිපති කාර්යාලයේ තැපැල් අංශය	සමාප්ත	100%
04	ජනාධිපති කාර්යාලයේ ප්‍රවාහන අංශයේ මූල්‍ය පාලනය හා පරිපාලන කටයුතු	සමාප්ත	100%
05	2016 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ගෙවීම් වවුචර්පත් පරීක්ෂා කිරීම	ජනවාරි සිට ජූනි දක්වා	50%
06	ජනාධිපති කාර්යාලයේ ගබඩා කළමනාකරණය හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය	සමාප්ත	100%
07	ජනාධිපති අරමුදල	සමාප්ත	100%
08	සරප්ගේ මුදල් හා මුදල් පොත පරීක්ෂාව	සමාප්ත	100%
09	ජනාධිපති කාර්යාලයේ ප්‍රසම්පාදන ඒකකය මඟින් 2015 වර්ෂයේ හා 2016 ජූලි මස දක්වා මිල දී ගැනීම්	සමාප්ත	100%
10	ජනාධිපති කාර්යාලයේ මාසික වැටුප් ගෙවීම	සමාප්ත	100%

අනු අංකය	සැලසුම	තත්ත්වය	ඵලදායීතා ප්‍රතිශතය
11	2016.01.01 දින සිට 2016.10.31 දින දක්වා විද්‍යුත් මාධ්‍ය අංශය විසින් ලබා ගත් අත්තිකාරම් මුදල්	සමාප්ත	100%
12	සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය යටතේ ක්‍රියාත්මක වන ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන	සමාප්ත	100%
13	විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම (පැවැත්වීමට යෝජිත රැස්වීම් - 04)	රැස්වීම් 02 ක් පවත්වා ඇත.	50%

ජනාධිපති අරමුදල

හැඳින්වීම

අතිගරු ජනාධිපතිතුමා ඇතුළු පාලක මණ්ඩලයේ ප්‍රතිපත්තිමය තීරණ මත ජනාධිපති ලේකම් ඇතුළු ජනාධිපති අරමුදලේ කාර්ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට ජීවිත තර්ජිත රෝගාබාධයන් සඳහා වෛද්‍යාධාර ලබාදීම, සුදුසුකම් සපුරා ඇති අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට අ.පොෂ. (උසස් පෙළ) හැදෑරීම සඳහා මූල්‍යාධාර ලබාදීම හා වෙනත් ව්‍යාපෘති සඳහා ද මූල්‍යාධාර පිරිනැමීම. එමෙන්ම සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබෙන ආදායමෙන් 50% ක මුදලක් මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත ලබාදීමද ජනාධිපති අරමුදලේ කාර්යභාරයකි.

ප්‍රධාන කාර්යයන් / අරමුණු

- දරිද්‍රතාවයට සහන සැලසීම
- අධ්‍යාපනය හෝ ඥානය වර්ධනය කිරීම
- ආගම් නංවාලීම සඳහා දායකත්වය ලබාදීම
- ජාතිය වෙනුවෙන් සේවයක් කර ඇති තැනැත්තන්ට ප්‍රදානයන් කිරීම
- ජනාධිපතිවරයාගේ හා පාලක මණ්ඩලයේ මතය අනුව මහජනතාවගේ සුභ සිද්ධිය උදෙසා කාර්යයන් ඉටුකිරීම

2016 වර්ෂයේ සාක්ෂාත් කරගැනීම්

1. ජනාධිපති අරමුදලේ වෛද්‍යාධාර ලබාදීමේ ක්‍රියාවලිය ස්වයංකරණය කිරීම යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 ස්වයංකරණ පද්ධතියට ඇතුළත් කර අවසන් කිරීම හා ඒවායේ ගැටලු සම්බන්ධයෙන් විසඳුම් ලබාදීම

2. දිනෙන් දින වර්ධනය වන මූල්‍යාධාර ඉල්ලීම් ප්‍රමාණය පිළිබඳව සලකා බලා එම කටයුතු ඉටු කිරීම පිණිස ජනාධිපති අරමුදල් අංශයේ කාර්ය මණ්ඩල අවශ්‍යතාවය මානව සම්පත් සංවර්ධන අංශය වෙත දැනුම් දී ඇති අතර ඉන් ජනාධිපති සහකාර ලේකම්වරයෙකු අනුයුක්ත කර ඇත.

3. ජනාධිපති අරමුදල් කාර්යාලයේ කොටසක් රේණුකා ගොඩනැගිල්ලේ 1 වන මහලේ ස්ථාපනය කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම

4. ජනාධිපති අරමුදලේ කාර්ය මණ්ඩලයේ පුද්ගල සංවර්ධනය උදෙසා ජනාධිපති කාර්යාලයේ මානව සම්පත් සංවර්ධන අංශය මඟින් සංවිධානය කරන ලද පහත සඳහන් පුහුණු පාඨමාලා සඳහා කාර්ය මණ්ඩලය යොමු කිරීම
    - රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් සඳහා පැවැත්වූ “ඵලදායී රාජ්‍ය සේවයක් සඳහා” පුහුණු පාඨමාලාව
    - කාර්යාල සේවක සේවයේ සේවක මහත්ම / මහත්මීන් වෙනුවෙන් වූ “ධාරිතා සංවර්ධන” පුහුණු පාඨමාලාව
5. ජනාධිපති අරමුදල් අංශයේ ස්වයංකරණ ක්‍රියාවලියට ගැළපෙන ධාරිතාවයෙන් යුත් පරිගණක යන්ත්‍ර, ස්කෑන් යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර හා වෙනත් කාර්යාල උපකරණ ලබාගැනීම

6. 2016 වර්ෂයේදී ජනාධිපති අරමුදලේ ඇස්තමේන්තුගත ආදායම ලෙස සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් රුපියල් මිලියන 2000 ක් බලාපොරොත්තු විය. නමුත් අපේක්ෂිත මුදලින් රුපියල් මිලියන 1836.02 ක් ලැබුණි. (දේශීය ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මඟින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් 2001 – 2009 කාලයට අදාළව හිඟ බදු අය කිරීම හේතුවෙන් මෙම අපේක්ෂිත මුදල ලබා ගැනීමට නොහැකි විය.)

ආදායම ලැබුණු ආකාරය	මුදල (රුපියල් මිලියන)
සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන්	1836.02
පොලී ආදායම හා පරිත්‍යාග	53.24
ස්ථාවර තැන්පතු ඉවත් කරගැනීම් හා වෙනත් ලැබීම්	98.45
ජනාධිපති අරමුදල සතුව තිබූ මුදල්	217.63
එකතුව	2205.34



2016 වර්ෂයේදී ජනාධිපති අරමුදල වෙත ලැබුණු ආදායම පහත ආකාරයට වියදම් කර ඇත.

කාර්යය	මුදල (රු. මිලියන)
වෛද්‍යාධාර සඳහා	1288.49
මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල සඳහා	647.83
අධ්‍යාපන හා ශිෂ්‍යත්ව සඳහා	127.94
සුභසාධන කටයුතු සඳහා	9.63
ආගමික කටයුතු සඳහා	5.01
සංස්කෘතික කටයුතු සඳහා	4.81
කලා කටයුතු සඳහා	1.97
එකතුව	2085.68



ජනාධිපති අරමුදල සතු ආයෝජන ලෙස රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බැඳුම්කර ලෙස රුපියල් මිලියන 2004.45 ක් ආයෝජනය කර ඇත.

සටහන: ඉහත දක්වා ඇති සංඛ්‍යාත්මක තොරතුරු දැනට විගණනය කරමින් පවතී.

සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය

හැඳින්වීම

අතිගරු ජනාධිපතිතුමන්ගේ "මෛත්‍රී පාලනයක් ස්ථාවර රටක් -" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ "යහපත් ආර්ථික ශක්තියකින් හෙබි යහගුණයෙන් සපිරි සදාචාර සම්පන්න සමාජයක් හා යහපාලනයට පරමාදර්ශයක් වන රටක්" නිර්මාණය කර ගැනීම පිළිබඳව සංකල්ප ගණනාවක් අන්තර්ගතය. එම සංකල්ප ක්‍රියාවට නංවමින් ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණ දී සිටින සංවේදී ගැටලුවලට පිලියම් යොදනු පිණිස අතිගරු ජනාධිපතිතුමාගේ සුවිශේෂී අවධානය මත විශේෂ ජාතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය පිහිටුවන ලදි.

මෙම අංශය යටතේ පහත සඳහන් ප්‍රධාන ජාතික වැඩසටහන් හා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

I. ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන
II. පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන
III. මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන
IV. වකුගඩු රෝග නිවාරණ ජාතික වැඩසටහන
V. 'දරුවන් සුරකිමු' ජාතික වැඩසටහන
VI. තිරසර පාසල් වැඩසටහන
VII. දරිද්‍රතාවය පිටු දැකීම පිළිබඳ ජාතික වැඩසටහන

ඉහත සඳහන් විෂයයන් ක්‍රියාවට නංවන අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධ වෙමින් ජනාධිපති කාර්යාලයේ සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය යටතේ පිහිටුවා ඇති කාර්යය සාධන බලකායන් සහ අංශය මෙම වැඩසටහන් මෙහෙයවීම සිදු කරනු ලබයි.

ප්‍රධාන කාර්යයන් / අරමුණු

- එක් එක් ජාතික වැඩසටහන් පිළිබඳව නිශ්චිත කාල වකවානුවක් සහිතව ජාතික වැඩසටහන් සැලසුම් කිරීම
- අන්තර් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන අතර මනා සම්බන්ධීකරණය
- නීතිමය හා ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධව මැදිහත් වීම
- නිලධාරීන්ගේ හා රටේ සමස්ත ප්‍රජාවගේ ආකල්පමය පරිවර්තනයක් ඇති කිරීම
- සියලුදෙනාම ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කිරීම
  නිරන්තර පසු විපරම
- අධීක්ෂණය හා ප්‍රගති සමාලෝචනය

මීට අමතරව සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය විසින් කාලානුරූපීව යෙදෙන විශේෂ වැඩසටහන් හා ක්‍රියාකාරකම් සිදු කරනු ලබන අතර අංශය යටතේ ඇති ආගමික ඒකකය විසින් සර්වාගමික කටයුතු සම්බන්ධයෙන් සුවිශේෂී මෙහෙවරක් සිදු කරනු ලැබේ.

01. ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන(2016/2018)

ශ්‍රී ලංකාවේ ආහාර නිෂ්පාදනය සහ ආනයනය දෙස සුපරීක්ෂාකාරීව බැලීමේදී කාලයක් තිස්සේ අප ආනයනය කරන බොහෝමයක් ආහාර වර්ග දේශීයව නිපදවා ස්වයංපෝෂිත මට්ටම වෙත ළඟාවීමට හැකි බව පසක් වී ඇත. එමෙන්ම ආහාර සඳහා වැය වන විශාල විදේශ විනිමය රට තුල ඉතිරිකර ගැනීමට මෙන්ම, සෞඛ්‍ය සම්පන්න ජාතියක් හා ආර්ථිකයක් ගොඩනඟා ගැනීමේ විභවතාවයක්ද පවතී. මෙම මූලික අරමුණු පෙරදැරි කොට ගනිමින් ජනාධිපති ලේකම් කාර්යාලයේ සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය යටතේ ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන ක්‍රියාත්මක වේ. කෘෂිකර්ම, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන, මහවැලි සංවර්ධන හා පරිසර, ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ හා වැවිලි කර්මාන්ත යන අමාත්‍යාංශ සහ සියලු පළාත් සභා ඇතුළු තවත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මෙන්ම, පෞද්ගලික අංශයද සමඟ එක්ව ආහාර නිෂ්පාදන ජනාධිපති කාර්යසාධන බලකාය විසින් මෙම ජාතික වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරනු ලබයි.

මෙම වැඩසටහන කිළිනොච්චි දිස්ත්‍රික්කයේ වඩඩකච්චිහි දී 2015 වර්ෂයේ ඔක්තෝබර් මස 05 වන දින උත්කර්ෂවත් අයුරින් ආරම්භ විය. එදින සිට 2016 වසර පුරා ජනාධිපති කාර්යාලයේ ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන මඟින් සිදුකල ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් පහත පරිදි ප්‍රධාන අංශ කිහිපයක් යටතේ දැක්විය හැක.

i. විශේෂ ප්‍රවර්ධන වැඩසටහන්
ii. ක්ෂේත්‍ර බෝග වගාව ඉහළ නැංවීම
iii. වස විස නැති ගොවිතැන ප්‍රවර්ධනය
iv. ගොවිපල යාන්ත්‍රීකරණය
v. වස විස නැති ආහාර අලෙවි වැඩසටහන
vi. හඳුනාගත් විශේෂ ව්‍යාපෘතීන්

ඉහත අංශ ඔස්සේ දීප ව්‍යාප්තව සිදු කළ ව්‍යාපෘතිවල ප්‍රතිඵල ලෙස කෘෂිකාර්මික කටයුතු සඳහා වස විස සහිත කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතය ශීඝ්‍ර ලෙස පහළ යෑම, කෘෂිකාර්මික කටයුතු සඳහා කාබනික පොහොර භාවිතා කිරීමට ගොවීන් උනන්දු වීම, කාබනික පොහොර නිෂ්පාදනාගාර රට තුල ස්ථාපිතවීම, ගුණාත්මක බවින් ඉහළ ආහාර පරිභෝජනය සඳහා ප්‍රජාව පෙළඹීම, පාරම්පරික වී හා අනෙකුත් අතිරේක බෝග වගාවන් ඉහළ යාම, වස විස නැති කාබනික ආහාර අලෙවි සැල් ආරම්භ වීම, වගා නොකළ ඉඩම් අලුතින් වගා කටයුතු සඳහා එකතු වීම, තල හා මුං නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත වීම,ගෙවතු වගා සිදුකිරීම සඳහා ප්‍රජාවගේ පවතින ස්වයං උනන්දුව ඉහළ යාම වර්තමානයේ සිදුවෙමින් පවතින බව දැකිය හැක.

2016 වසරේ මැයි, ජුනි මාසවල පැවති අධික වර්ෂාව හේතුවෙන් ඇති වූ ගංවතුර තත්ත්වයන්ටද, අගෝස්තු සිට දෙසැම්බර් දක්වා ඇති වූ දැඩි නියඟය නිසා ජල හිඟයකටද මුහුණ පෑමට ගොවීන් හට සිදුවිය. මෙවැනි තත්ත්වයන් යටතේ වුව ද ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන අඛණ්ඩව රටපුරා ක්‍රියාත්මක කිරීමට හැකිවිය.

1.1. විශේෂ ප්‍රවර්ධන වැඩසටහන්

ශ්‍රී ලාංකික ගොවි ප්‍රජාව හා පාරිභෝගික ජනතාව ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන පිළිබඳව දැනුවත් කිරීමත් ආහාර නිෂ්පාදනය හා පරිභෝජනය පිළිබඳ ඔවුන්ගේ පවතින ආකල්ප සංවර්ධනය කිරීමත් අරමුණු කරගනිමින් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

	වැඩසටහන	දිනය	ස්ථානය
1.	වස විස නැති රටක් කෘෂිකර්ම, අධ්‍යාපනික හා වෙළඳ ප්‍රදර්ශනය	2016 මාර්තු 6,7,8	BMICH කොළඹ
2.	විශේෂ ගොවි සමුළුව හා අධ්‍යාපනික හා වෙළඳ ප්‍රදර්ශනය, අම්පාර	2016 අගෝස්තු 29,30	අම්පාර, වීරසිංහ ක්‍රීඩාංගණය







ආහාර නිෂ්පාදන විශේෂ ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම

1.2. ක්ෂේත්‍ර බෝග වගාව ඉහළ නැංවීම

රට තුල නිෂ්පාදනය කළ හැකි එහෙත් ආනයනය කරන ආහාර බෝග සඳහා විශාල විදේශ විනිමයක් වැය කරනු ලබයි. එබැවින් එම ආහාර බෝග වගාව ඉහළ නැංවීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය ඇතුළු ආයතන සිදුකරන ක්‍රියාකාරකම්වලට අමතරව ජනාධිපති කාර්යාලයේ සෘජු මැදිහත්වීමෙන් 2016 වර්ෂය තුල විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. එක් එක් බෝගය අනුව ප්‍රගතිය පහත දැක්වේ.

1.2.1. මුං වගාව

ශ්‍රී ලංකාවේ වාර්ෂික මුං ඇට අවශ්‍යතාවය මෙ.ටො. 30,000 කි. එම ඉලක්කය සපුරා ගැනීම සඳහා අදාළ අමාත්‍යාංශ මඟින් ක්‍රියාත්මක වැඩසටහනට අමතරව ජනාධිපති කාර්යාලයේ මැදිහත්වීමෙන් අක්කර 21, 272 ක ඉපනැල්ලේ මුං වගාව පහත දිස්ත්‍රික්කයන් හි සිදුකර ඇත. ඇස්තමේන්තුගත ආදායම රු.මි. 1,067 කි.

	දිස්ත්‍රික්කය	වගා වපසරිය (අක්කර)	ගොවීන් සංඛ්‍යාව	බෙදා දුන් බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.)	වියදම (රු.මි.)	දළ අස්වැන්න (මෙ.ටො.)
01	හම්බන්තොට	12,625	4,754	109,860	13.35	4,000
02	ත්‍රිකුණාමලය	6,500	3,510	64,824	15.00	2,000
03	කුරුණෑගල	625	704	5,952	1.52	200
04	අනුරාධපුරය	213	420	1,004	0.45	70
05	මහනුවර	275	575	2,750	0.77	85
06	පොළොන්නරුව	984	2,700	300	0.08	300
07	වව්නියාව	50	96	480	0.13	15
එකතුව		**21,272**	**12,759**	**185,170**	**31.30**	**6,670**





හම්බන්තොට හා කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි මුං වගා වැඩසටහන්

1.2.2. මිරිස් වගාව

ශ්‍රී ලංකාවේ වාර්ෂික මිරිස් අවශ්‍යතාවය මෙ.ටො. 60,000 කි. එම ඉලක්කය සපුරා ගැනීම සඳහා අදාළ අමාත්‍යාංශ මඟින් ක්‍රියාත්මක වැඩසටහනට අමතරව ජනාධිපති කාර්යාලයේ මැදිහත්වීමෙන් වස විසෙන් තොර කාබනික මිරිස් අක්කර 1,855.5ක වගා ව්‍යාපෘති පහත දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කර ඇත. එමඟින් රු.මි. 1,750 ක දළ ආදායමක් ගොවීන්ට ලබාගත හැකි වෙතැයි ගණන් බලා ඇත.

	දිස්ත්‍රික්කය	වගා වපසරිය (අක්කර)	ගොවීන් සංඛ්‍යාව	බෙදා දුන් බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.)	වියදම (රු.මි.)	දළ අස්වැන්න (මෙ.ටො.)
01	පොළොන්නරුව	983.0	1,954	393.5	2.60	8,000
02	අනුරාධපුරය	590.0	1,125	236.0	0.71	5,000
03	මහනුවර	155.0	340	62.0	0.05	1,300
04	පුත්තලම	127.5	374	50.0	0.23	1,050
එකතුව		**1,855.5**	**3,793**	**741.5**	**3.59**	**15,350**




පොළොන්නරුව හා අනුරාධපුරය දිස්ත්‍රික්කයන්හි මිරිස් වගා වැඩසටහන්

1.2.3. ලොකු ඵෑණු වගාව/ සත්‍ය බීජ නිෂ්පාදනය

ශ්‍රී ලංකාවේ වාර්ෂික ලොකු ඵෑණු අවශ්‍යතාවය මෙ.ටො. 240,000 කි. එම ඉලක්කය සපුරා ගැනීම සඳහා අදාළ අමාත්‍යාංශ මඟින් ක්‍රියාත්මක වැඩසටහනට අමතරව ජනාධිපති කාර්යාලයේ මැදිහත්වීමෙන් අක්කර 260 ක වස විසෙන් තොර කාබනික ලොකු ඵෑණුබීජ නිෂ්පාදන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර ඇත. එමඟින් රු.මි. 1,500 ක දළ ආදායමක් ගොවීන්ට ලබාගත හැකි වෙතැයි ගණන් බලා ඇත.

	දිස්ත්‍රික්කය	වගා වපසරිය (අක්කර)	ගොවීන් සංඛ්‍යාව	බෙදා දුන් බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.)	වියදම (රු.මි.)	දළ අස්වැන්න (මෙ.ටො.)
01	පොළොන්නරුව	05	32	10	0.13	1.8
02	අනුරාධපුරය	250	310	630	1.89	90.0
03	ත්‍රිකුණාමලය	05	21	12	0.12	1.8
	එකතුව	**260**	**363**	**652**	**2.14**	**93.6**
04	අනුරාධපුරය (සත්‍ය බීජ නිෂ්පාදන)	02	08	9000(බීජ බල්බ)	1.03	0.72





පොළොන්නරුව, අනුරාධපුරය හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයන්හි ලොකු ඵෑණු වගා වැඩසටහන්

1.2.3.1. රතුළූණු වගාව

මොණරාගල දිස්ත්‍රික්කය තුළ තෝරාගත් ප්‍රතිලාභී ගොවි පවුල් 35ක් යොදා ගනිමින් අක්කර 4.4 ක රතුළූණු වගා ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. මේ සඳහා රුපියල් 420,000 ක වියදමක් දරා ඇත. දළ අස්වැන්න කි.ග්‍රෑ 24,600 කි. ඇස්තමේන්තුගත ආදායම රු.මි. 1.6 කි.

1.2.4.බඩඉරිඟු වගාව

ශ්‍රී ලංකාවේ වාර්ෂික බඩඉරිඟු අවශ්‍යතාවය මෙ.ටො. 400,000කි. එම ඉලක්කය සපුරා ගැනීම සඳහා බඩඉරිඟු වගා වපසරිය ඉහළ නැංවීමට ප්‍රමාණවත් බීජ නොමැති වීම ගැටලුවක්ව ඇත. එබැවින් ජනාධිපති කාර්යාලයේ මැදිහත්වීමෙන් අක්කර 1,560ක වස විසෙන් තොර කාබනික බඩඉරිඟු බීජ නිෂ්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. ඇස්තමේන්තුගත ආදායම රු.මි. 311 කි.

	දිස්ත්‍රික්කය	වගා වපසරිය (අක්කර)	ගොවීන් සංඛ්‍යාව	බෙදා දුන් බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.)	වියදම (රු.මි)	දළ අස්වැන්න (මෙ.ටො.)
01.	අනුරාධපුරය	335	400	335	0.040	1,340
02	පොළොන්නරුව	1,000	840	1000	0.344	4,000
03	කුරුණෑගල	35	13	212	0.013	140
04	වව්නියාව	34	149	270	0.031	132
05	මහනුවර	156	258	1250	0.480	624
එකතුව		**1,560**	**1,660**	**3,067**	**0.908**	**6,236**

බඩඉරිඟු, මිරිස් හා ලොකු ළූණු වගාවන් වස විසෙන් තොරව සාර්ථකව වගා කර අපේක්ෂිත අස්වනු ලබාගැනීමට හැකි විය. එමඟින් එවැනි බෝග රසායනික පොහොර භාවිතයෙන් තොරව කාබනික පොහොර පමණක් යොදා ගෙන සාර්ථකව වගා කළ හැකි බව තහවුරු විය.





1.2.5. තල වගාව

ශ්‍රී ලංකාවේ වාර්ෂික තල අවශ්‍යතාවය මෙ.ටො.20,000 කි. එම ඉලක්කය සපුරා ගැනීම සඳහා අදාළ අමාත්‍යාංශ මඟින් ක්‍රියාත්මක වැඩසටහනට අමතරව ජනාධිපති කාර්යාලයේ මැදිහත්වීමෙන් තල බීජ නිෂ්පාදන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර ඇත.

	දිස්ත්‍රික්කය	වගා වපසරිය (අක්කර)	ගොවීන් සංඛ්‍යාව	බෙදා දුන් බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.)	අපේක්ෂිත වියදම(රු.මි)	දළ අස්වැන්න (මෙ.ටො.)
01	අනුරාධපුරය	2,576	1,175	7,729	1.90	450
02	කුරුණෑගල	64	108	180	0.04	11
03	පොළොන්නරුව	700	950	250	0.08	122
එකතුව		**3,340**	**2,233**	**8,159**	**2.02**	**583**

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී වියළි කලාපය තුල ඇති වූ අනපේක්ෂිත නියං තත්ත්වය හේතුවෙන් 30% පමණ වගාව විනාශයට පත්විය. ඇස්තමේන්තුගත ආදායම රු.මි.117 කි.



අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි තල වගා වැඩසටහන්

1.2.6. සෝයා වගාව

ශ්‍රී ලංකාවේ වාර්ෂික සෝයා අවශ්‍යතාවය මෙ.ටො. 200,000 කි. එම ඉලක්කය සපුරා ගැනීම සඳහා අදාල අමාත්‍යාංශ හා ජනාධිපති කාර්යාලයේ මැදිහත්වීමෙන් අක්කර 489 ක සෝයා බීජ නිෂ්පාදන වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත. එමඟින් රු.මි. 42 ක දළ ආදායමක් ඇස්තමේන්තුගත කර ඇත.

	දිස්ත්‍රික්කය	වගා වපසරිය (අක්කර)	ගොවීන් සංඛ්‍යාව	බෙදා දුන් බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.)	වියදම (රු.මි)	දළ අස්වැන්න (මෙ.ටො.)
01	අනුරාධපුරය	489	450	9,779	1.68	490

1.2.7. රටකජු වගාව

ශ්‍රී ලංකාවේ වාර්ෂික රටකජු අවශ්‍යතාවය මෙ.ටො. 30,000 කි. එම ඉලක්කය සපුරා ගැනීම සඳහා රටකජු වගා වපසරිය ඉහළ නැංවීමට ප්‍රමාණවත් බීජ නොමැති වීම ගැටලුවක්ව ඇත. එබැවින් ජනාධිපති කාර්යාලයේ මැදිහත් වීමෙන් අක්කර 290 ක රටකජු බීජ නිෂ්පාදන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර ඇත. ඇස්තමේන්තුගත ආදායම රු.මි. 28 කි.

	දිස්ත්‍රික්කය	වගා වපසරිය (අක්කර)	ගොවීන් සංඛ්‍යාව	බෙදා දුන් බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.)	වියදම (රු.මි)	දළ අස්වැන්න (මෙ.ටො.)
01	කිළිනොච්චිය	10	150	480	0.12	6
02	අනුරාධපුරය	75	80	3,000	0.77	45
03	පුත්තලම	21	41	480	0.40	12
04	කුරුණෑගල	159	464	6,356	0.89	95
05	වව්නියාව	25	79	950	0.25	15
එකතුව		**290**	**814**	**11,266**	**2.43**	**173**



අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි රටකජු වගා වැඩසටහන්

1.2.8. කව්පි වගාව

ශ්‍රී ලංකාවේ වාර්ෂික කව්පි අවශ්‍යතාවය මෙ.ටො. 16,800 කි. එම ඉලක්කය සපුරා ගැනීම සඳහා ජනාධිපති කාර්යාලයේ මැදිහත්වීමෙන් අක්කර 141 ක කව්පි බීජ නිෂ්පාදන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර ඇත. ඇස්තමේන්තුගත ආදායම රු.මි. 8.5කි.

	දිස්ත්‍රික්කය	වගා වපසරිය (අක්කර)	ගොවීන් සංඛ්‍යාව	බෙදා දුන් බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.)	වියදම (රු.මි.)	දළ අස්වැන්න (මෙ.ටො.)
01	හම්බන්තොට	16	40	400	0.06	5.6
02	අනුරාධපුරය	125	210	1,250	0.32	44.0
එකතුව		**141**	**250**	**1,650**	**0.38**	**49.6**

1.2.9. කුරක්කන් වගාව

ශ්‍රී ලංකාවේ වාර්ෂික කුරක්කන් අවශ්‍යතාවය මෙ.ටො. 8,750 කි. එම ඉලක්කය සපුරා ගැනීම සඳහා ජනාධිපති කාර්යාලයේ මැදිහත් වීමෙන් අක්කර 250 ක කව්පි නිෂ්පාදන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර ඇත. ඇස්තමේන්තුගත ආදායම රු.මි.18 කි.

	දිස්ත්‍රික්කය	වගා වපසරිය (අක්කර)	ගොවීන් සංඛ්‍යාව	බෙදා දුන් බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.)	වියදම (රු.මි.)	දළ අස්වැන්න (මෙ.ටො.)
01	හම්බන්තොට	16	40	400	0.06	6.4
02	අනුරාධපුර	125	50	1,250	0.03	50.0
03	කුරුණෑගල	20	27	64	0.01	8.0
04	මහනුවර	89	178	250	0.01	35.0
එකතුව		**250**	**295**	**1,964**	**0.11**	**99.4**

1.2.10. උඳු වගාව

ශ්‍රී ලංකාවේ වාර්ෂික උඳු අවශ්‍යතාවය මෙ.ටො. 10,000 කි. එම ඉලක්කය සපුරා ගැනීම සඳහා ජනාධිපති කාර්යාලයේ මැදිහත් වීමෙන් අක්කර 407 ක උඳු නිෂ්පාදන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර ඇත.ඇස්තමේන්තුගත ආදායම රු.මි. 24 කි.

	දිස්ත්‍රික්කය	වගා වපසරිය (අක්කර)	ගොවීන් සංඛ්‍යාව	බෙදා දුන් බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.)	වියදම (රු.මි.)	දළ අස්වැන්න (මෙ.ටො.)
01	පුත්තලම	59	56	274	0.16	20
02	අනුරාධපුරය	220	347	2,200	0.76	77
03	කුරුණෑගල	16	23	187	0.04	5
04	වව්නියාව	50	53	400	1.40	17
05	පොළොන්නරුව	62	70	620	0.22	21
එකතුව		**407**	**549**	**3,681**	**2.58**	**140**

1.3. වස විස නැති ගොවිතැන ප්‍රවර්ධනය

වස විස නැති ගොවිතැන ප්‍රවර්ධනය සඳහා 2016 යල කන්නයේදී සහ 2016/17 මහ කන්නයේදී පාරම්පරික වී වගාවට අලුතින් යොමුවන ගොවීන් 7,719 දෙනෙකු සඳහා අක්කර 6,736ක වගා කිරීමට නොමිලේ බිත්තර වී බෙදා හරින ලදී. දළ අස්වැන්න මෙ.ටො. 8,649 ක් වන අතර ඇස්තමේන්තුගත ආදායම රු.මි. 519 කි.





කළුතර, අනුරාධපුර හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයන්හි පාරම්පරික වී වගා වැඩසටහන්

දේශීය පාරම්පරික වී වගාව ප්‍රවර්ධනය 2016 යල කන්නයේ ප්‍රගතිය

	දිස්ත්‍රික්කය	බෙදා දී ඇති බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ)	වගා භූමිය (අක්කර)	ගොවීන් සංඛ්‍යාව	වියදම (රු.මි)	ලබාගත් අස්වැන්න (මෙ.ටො.)	දළ ආදායම (රු.මි.)
1	පොළොන්නරුව	24,000	800	480	1.83	984	59.0
2	කිළිනොච්චිය	4,410	147	278	0.31	181	11.0
3	මහනුවර	1,235	60	234	0.12	74	4.4
4	රත්නපුර	6,765	229	452	0.47	282	17.0
5	අම්පාර	750	25	32	0.05	31	2.0
6	ගාල්ල	1,573	53	69	0.14	64	4.0
7	ත්‍රිකුණාමලය	210	7	10	0.01	8	0.4
8	ගම්පහ	1,650	45	70	0.12	55	3.2
9	මාතර	390	13	18	0.03	16	0.9
10	නුවරඑළිය	1,209	41	260	0.10	50	3.0
11	හම්බන්තොට	1,762	62	63	0.15	76	4.5
එකතුව		**43,954**	**1,482**	**1,966**	**3.33**	**1,821**	**109.4**





රත්නපුරය, ත්‍රිකුණාමලය හා පොළොන්නරුව දිස්ත්‍රික්කයන්හි පාරම්පරික වී වගා වැඩසටහන්

දේශීය පාරම්පරික වී වගාව ප්‍රවර්ධනය 2016/17 මහ කන්නය

	දිස්ත්‍රික්කය	බෙදා දී ඇති බිත්තර වී ප්‍රමාණය (කි.ග්‍රෑ)	වගා භූමිය (අක්කර)	ගොවීන් සංඛ්‍යාව	වියදම් (රු.මි.)	අපේක්ෂිත අස්වැන්න (මෙ.ටො.)	දළ ආදායම (රු.මි.)
1	කළුතර	10,520.0	350.0	480	0.88	430	21.50
2	ගාල්ල	2,897.0	103.0	246	0.13	126	6.30
3	මාතර	2,500.0	84.0	137	0.03	103	6.10
4	යාපනය	2,045.0	69.7	89	0.15	86	5.16
5	කිළිනොච්චිය	6,950.0	232.0	124	0.89	285	17.10
6	පොළොන්නරුව	13,980.0	465.3	678	0.89	572	34.32
7	අම්පාර	5,157.0	172.5	265	0.67	212	12.72
8	මහනුවර	6,300.0	158.0	402	2.75	194	11.64
9	පුත්තලම	9,787.5	326.2	518	0.84	770	46.20
10	කොළඹ	1,000.0	35.0	122	0.13	43	2.58
11	ගම්පහ	7,202.5	240.0	360	0.11	295	17.70
12	ත්‍රිකුණාමලය	105,612.0	3,018.0	2,332	11.03	3,712	222.72
එකතුව		**173,951.0**	**5,253.7**	**5753**	**18.50**	**6,828**	**404.04**

1.4. ගොවිපල යාන්ත්‍රීකරණය

අධික රසායනික ද්‍රව්‍ය භාවිතය අවම කිරීමත්, ඒකක ඵලදායිතාවය ඉහළ නැංවීමත් අරමුණු කරගනිමින් ගොවිපල යාන්ත්‍රීකරණය හඳුන්වා දෙනු ලැබේ. මීට අමතරව වෙගයෙන් කෘෂිකර්මයෙන් ඈත්වන තරුණ ප්‍රජාව කෘෂිකර්මාන්තයට ආකර්ෂණය කර ගැනීමේ වැඩසටහනක් ලෙස 2017 වර්ෂයේදී කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ නොමිලේ බෙදා දීමට සැලසුම් කර ඇත. ඒ සඳහා 2016 වර්ෂයේදී පහත පරිදි යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම් සිදුකර ඇත.

	යන්ත්‍ර වර්ගය	තෝරාගෙන ඇති කණ්ඩායම්	ප්‍රමාණය	වියදම (රු.මි)
	ගොයම් පැළ සිටුවීමේ යන්ත්‍ර	තරුණ කෘෂි ව්‍යවසායකයින්	150	74.85
	ස්වයංක්‍රීය වීඩර් යන්ත්‍ර	වස විස භාවිතයෙන් තොරව වගා කරන ගොවීන්	690	62.03
එකතුව			**840**	**136.88**

1.5. වස විස නැති ආහාර අලෙවි වැඩසටහන

	කාරණය	වියදම (රු.මි.)
1	සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමෙන් පාරම්පරික වී අස්වනු ඇතුළු වස විස නැති ආහාර බෝග මිලදී ගැනීමේ හා අලෙවි කිරීමේ වැඩසටහන (ඒ අනුව ජංගම අලෙවි රථ 06 ක් මඟින් නගරාශ්‍රිතව අලෙවි ක්‍රියාකාරකම් සිදු කරනු ලබන අතර, තෝරාගත් නගර කිහිපයක ස්ථිර අලෙවිසැල් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.)	27.430
2	විදාතා සම්පත් මධ්‍යස්ථාන මඟින් වස විස නැති ආහාර අලෙවි කුටි 06 ක් ස්ථාපනය කිරීම.	0.298
3	ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වස විස නැති ආහාර ද්‍රව්‍ය වෙළඳ සංකීර්ණ 02 ක අලෙවිසැල් 30 ක් ආරම්භ කිරීම.	1.356

1.6. හඳුනාගත් විශේෂ ව්‍යාපෘතීන්

1.6.1. කාබනික තුඹ කරවිල වගාව

	දිස්ත්‍රික්කය	වගා වපසරිය (අක්කර)	ගොවීන් සංඛ්‍යාව	බෙදා දුන් බීජ / රෝපණ ද්‍රව්‍ය ප්‍රමාණය (කි.ග්‍රෑ.)	වියදම (රු.මි.)	දළ අස්වැන්න (මෙ.ටො.)
1	හම්බන්තොට	11	127	11,000	0.97	93.8
2	මොණරාගල	01	20	2,000	0.16	8.5
3	පොළොන්නරුව	25	150	15,000	1.13	213.0
එකතුව		**37**	**297**	**28,000**	**2.26**	**315.3**



හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි කාබනික තුඹ කරවිල වගා වැඩසටහන්

1.6.2. කොල්ලු වගාව

ඖෂධීය වශයෙන් වටිනාකමක් ඇති කොල්ලු වගාකිරීම පිළිබඳව අවධානය යොමු කර නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 250 ක් තෝරා ගෙන අක්කර 60 ක වගා කටයුතු සිදුකර ඇත. ඒ සඳහා රු.මි. 0.31 ක වියදමක් දරා ඇත.




නුවරඑළිය දිස්ත්‍රික්කයෙහි කොල්ලු වගා වැඩසටහන්

1.6.3. සබරගමු පළාත් සභාව සමඟ ක්‍රියාත්මක වන විශේෂ ව්‍යාපෘති

ව්‍යාපෘතිය	වගා වපසරිය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	වියදම (රු.මි.)
අපනයනය සඳහා, පහතරට තෙත් කලාපයේ රත්කෙසෙල් වගා ව්‍යාපෘතිය සඳහා පටක රෝපණ විද්‍යාගාරය වැඩි දියුණු කිරීම	කෑගල්ල දිස්ත්‍රික්කය හා ඉන් පිටත වගාකරුවන්	800	2.18
අපනයන වෙළඳපොළ සඳහා මඤ්ඤොක්කා වගා ව්‍යාපෘතිය	අක්කර 20	200	0.95
අපනයන වෙළඳපොළ සඳහා අන්නාසි වගා ගොවිපලවල් පිහිටුවීම	අක්කර 20	200	0.95
එකතුව		**1,200**	**4.08**

මෙම ව්‍යාපෘතීන් සාර්ථක කර ගැනීම මඟින් විශාල විදේශ විනිමයක් උපයාගැනීමට හැකියාව ලැබේ.





සබරගමු පළාත් සභාව සමඟ ක්‍රියාත්මක වන විශේෂ ව්‍යාපෘති

1.6.4. "වැදියවර" සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ වැඩසටහන

සුළු වාරිමාර්ගයන්ට අයත් වැව් හා වාරි පද්ධති විශාල ප්‍රමාණයක් අබලන්ව පවතී. එබැවින් ශ්‍රී ලංකා යුධ හමුදාවේ යන්ත්‍රෝපකරණ හා ශ්‍රම දායකත්වයෙන් සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට අවධානය යොමුකර ඇත.
එහි නියමු ව්‍යාපෘතිය ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා යුධ හමුදාවට රු.මි. 09 ක ප්‍රතිපාදන ලබා දී ඇත. ඒ අනුව 2016 වර්ෂයේදී වැව් 10 ක ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කර ඇත.





සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු

1.6.5. වයඹ පළාත් සභාව සමඟ ක්‍රියාත්මක වන විශේෂ ව්‍යාපෘති

	ඛෝගය/ වැඩසටහන	වගා වපසරිය (අක්කර)	ගොවීන් සංඛ්‍යාව	බෙදා දුන් බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.)	දැනට දරා ඇති වියදම (රු.මි.)	දළ අස්වැන්න (මෙ.ටො.)
01	මිරිස් (බීජ, බිම් සැකසීම 50%, ටාපොලින්, පොළිතින් බඳුන්)	204.0	1,352	80	2.31	408
02	බඩඉරිඟු	309.0	300	1,614	1.38	761.5
03	රටකජු	792.0	1,753	31,668	5.92	712.8
04	මුං	1,262.0	1,195	12,627	1.80	441.7
05	කව්පි	91.0	211	730	0.16	27.3
06	උඳු	134.0	181	1,071	0.15	46.9
07	තල	29.0	16	73	0.02	0.02
08	කුරක්කන්	19.5	56	58	0.01	0.01
09	ලොකු එෑණු (බීජ නිෂ්පාදන)	1.5	71	6,740	0.82	0.81
10	අතිරේක බෝග සඳහා බිම් සැකසීම් දිරි දීමනාව 50%					0.88
එකතුව		**2,842.0**	**5135**	**54,661**	**12.57**	**2,399.92**

ඉහත බෝග වැඩසටහන් මඟින් රු.මි. 488 ක දළ ආදායමක් ගොවීන්ට ලබාගත හැකි වෙතැයි ගණන් බලා ඇත.






වයඹ පළාත් සභාව සමඟ ක්‍රියාත්මක වන විශේෂ ව්‍යාපෘති

1.6.6. දේශීය පාරම්පරික ආහාර නිෂ්පාදනවල පෝෂණ ගුණ විශ්ලේෂණය

ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යටතේ දේශීය පාරම්පරික ආහාර පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම සිදු කෙරේ. මේ සඳහා එම ආහාරවල පෝෂණ ගුණාංග පිළිබඳ තොරතුරු ජනතාව වෙත ලබාදීම ජාතික කර්තව්‍යකි. 2016 වර්ෂයේ දී දේශීය ආහාර නිෂ්පාදන කීපයක පෝෂණ ගුණාංග කාර්මික තාක්ෂණ ආයතනය මඟින් විශ්ලේෂණය කිරීම සඳහා රු. 940,000 ක වියදමක් දරා ඇත.

1.6.7. කාබනික පොහොර නිෂ්පාදනය

වස විස නැති ගොවිතැන ප්‍රවර්ධනය කිරීම සඳහා රට තුළ කාබනික පොහොර සුලභ කිරීම අත්‍යවශ්‍ය කරුණකි. මේ සඳහා ශ්‍රී ලංකා යුද හමුදාවට රු.මි. 12.9 ක ප්‍රතිපාදනයක් ලබාදී ඇති අතර එමඟින් කාබනික පොහොර මෙ.ටො 1,881ක් පමණ නිෂ්පාදනය කර ඇත. එයින් මේ වන විට මෙ.ටො 45 ක් ඇසුරුම් කර බෙදාහැර ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහනේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දායකත්වය ලබාදී ඇත.

6 - CM 25284

02. පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන

හැඳින්වීම

ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය වේගවත්වීම, ජනතාවගේ ජීවන ක්‍රමය වෙනස් වීම, ජනගහනය හා මානව අවශ්‍යතා ඉහළ යාම වැනි කරුණු හේතුවෙන් ඇතිවන පාරිසරික ගැටළු අවම කරමින් ස්වභාවික සම්පත් ආරක්ෂා කර තිරසර පරිසරයක් ස්ථාපිත කිරීමේ අරමුණින් 'පුනරුදය' පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන (2016-2018) හඳුන්වා දෙන ලදි. ජනාධිපති කාර්යාලය යටතේ පිහිටුවා ඇති ජනාධිපති කාර්ය සාධන බලකාය විසින් පාර්ශවකාරී ආයතන හා ඒකාබද්ධව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.මෙහිදී මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, ඉඩම් අමාත්‍යාංශය, තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශ මෙන්ම එම අමාත්‍යාංශ යටතේ ඇති විවිධ දෙපාර්තමේන්තු හා ආයතන මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී සක්‍රීය දායකත්වය සපයයි. මෙහිදී පහත සඳහන් ප්‍රධාන විෂය ක්ෂේත්‍ර 6 යටතේ ජාතික වැඩසටහන් 21ක් හඳුනාගෙන ඇත.

i. පරිසර දූෂණ පාලනය
ii. වන සංරක්ෂණය හා සංවර්ධනය
iii. තිරසර ඉඩම් කළමනාකරණය
iv. වන සත්ව මිනිස් සහජීවනය
v. ජෛව සම්පත් සංරක්ෂණය
vi. ආයතනික ප්‍රතිව්‍යුහගත කිරීම හා ප්‍රවර්ධනය

පාර්ශවකාරී ආයතන විසින් ඒ ඒ ක්ෂේත්‍ර යටතේ හඳුනාගන්නා ලද වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර පරිසර සංරක්ෂණ ජනාධිපති කාර්යය සාධන බලකාය මේ සඳහා අවශ්‍ය මෙහෙයවීම, සම්බන්ධීකරණය, පසුවිපරම, අධීක්ෂණය හා ප්‍රගති සමාලෝචනය සිදු කරනු ලබයි.

පරිසර දූෂණ පාලනය

පරිසර දූෂණය පාලනය කිරීම සඳහා 'පුනරුදය' යටතේ හඳුනාගත් උපාය මාර්ග පහත සඳහන් වැඩසටහන් යටතේ ක්‍රියාත්මකයි.

- නිකසළ ලංකා
- නිකසළ පුරවර
- හරිත වෙරළ
- සුනිල සයුර
- පිරිසිදු වායු - දීසායු
- ජනදිවි රකින - ජල රැකවරණය
- සාර නගර

<u>ජනාධිපති කාර්ය සාධන බලකාය විසින් පරිසර දූෂණය පාලනය සඳහා ක්‍රියාත්මක කරන ලද විශේෂ කාර්යයන් - 2016</u>

- පළාත් පාලන ආයතනවල කසළ කළමනාකරණය විධිමත් කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය සිදුකිරීම.
  - දිවයිනේ සියලු මහනගර සභාවල සහභාගිත්වයෙන් ජනාධිපති කාර්යාලයේදී ද, මධ්‍යම පළාතේ සියලු පළාත් පාලන ආයතනවල සහභාගිත්වයෙන් මහනුවරදී ද වැඩමුළු 2ක් පැවැත්වීම.

- පළාත් පාලන ආයතනවල කසළ කළමනාකරණය සඳහා පස් අවුරුදු සැලසුම් සකස් කරලීමට අවශ්‍ය සහයෝගය ලබාදීම.

- ජනාධිපති කාර්යාලය තුළ කසළ කළමනාකරණය විධිමත් කිරීම.
- 2016 කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ දී පවත්වන ලද ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේදී ජනනය වූ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා නියමිත වර්ණ කේත සහිත කසළ බඳුන් 50 ක් ලබා දී ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කිරීම.
- මාතලේ,රත්නපුර, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවල පැවැත්වූ පරිසර සමුළුවලට සමගාමීව පාසල් හා රාජ්‍ය ආයතනවලට අපද්‍රව්‍ය බැහැර කිරීමේ බඳුන් බෙදා දීම.





2016 කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේ කසළ කළමනාකරණ වැඩසටහන

වගුව 2.1 : ජනාධිපති කාර්යාලයෙන් පරිසර දූෂණය පාලනය සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීම

ක්‍රියාකාරකම	ප්‍රතිපාදන ලබා දුන් ආයතනය	ප්‍රතිපාදන රු.මි.	ප්‍රගතිය (2016)
පොලිතින් භාවිතය අවම කිරීම.	මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය	37.05	- දිවයිනම ආවරණය වන පරිදි පොලිතීන් වැටලීම් සිදුකර නීතිමය පියවර ගැනීම හා වැටලීම් සිදු කරන නිළධාරීන් පුහුණු කිරීම. - පොලිතින් හා ප්ලාස්ටික්, විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය නිවාරණ සතියක් ප්‍රකාශයට පත් කිරීම (2016.10.24 – 2016.10.30) - සියලුම පොලිතීන් හා ප්ලාස්ටික් අපද්‍රව්‍ය එකතුකරන්නන් හා ප්‍රතිචක්‍රීකරණය කරන්නන් 105 දෙනෙකු ලියාපදිංචි කිරීම. - 3R සංකල්පය පදනම් කර ගනිමින් ආයතන වෙත කසළ බඳුන් ලබාදීම.

ක්‍රියාකාරකම	ප්‍රතිපාදන ලබා දුන් ආයතනය	ප්‍රතිපාදන රු.මි.	ප්‍රගතිය (2016)
			- පරිසර හිතකාමී ද්‍රව්‍ය සහ ජෛව හායනය මඟින් දිරාපත්වන ද්‍රව්‍ය, පොලිතීන් හා ප්ලාස්ටික් සඳහා ආදේශකයක් ලෙස යොදා ගනිමින් ජාතික ශිල්ප සභාව හා එක්ව ප්‍රදර්ශන දෙකක් පවත්වන ලදී.(2016/10/20 - ම.ප.අ. පරිශ්‍රයේදී හා 2016/11/17-19 දක්වා BMICH හිදී) - පොලිතීන් හා ප්ලාස්ටික් අපද්‍රව්‍ය එකතු කරන්නන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම. - නව නීති හා රෙගුලාසි හඳුන්වාදීම, ● පොලිතීන් ආහාර දවටන හා පොලිතීන් මළු තහනම් කිරීම ● පොදු කටයුතු වලදී පොලිතීන් මඟින් සැරසිලි සිදු කිරීම තහනම් කිරීම ● පොලිස්ටයරින් කෑම පෙට්ටි තහනම් කිරීම
ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය	මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය	4.00	තාක්ෂණික විද්වත් උපදෙස් ලබා ගැනීම සඳහා වැඩමුළු පැවැත්වීම. අවිධිමත් එකතු කරන්නන් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම. ජාතික ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය පොලිතීන් ප්ලාස්ටික් නිවාරණ සතිය වැඩසටහන් දීපව්‍යාප්තව පොලිතීන් ප්ලාස්ටික් කළමනාකරණ වැඩසටහන හා ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම. (ඒ අනුව ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ටොන් 427 ක් එක්රැස් කොට පරිසර හිතකාමී අපහරණයට යොමු කරනලදී. එම සතිය තුල එකතු කර ගන්නා ලද රසදිය අඩංගු ප්‍රතිදීප්ත විදුලි පහන් ඒකක 90,000 ක් පමණ ප්‍රතිචක්‍රීකරණය කරන ලදී.)
වියළි කලාපීය ප්‍රදේශවල කෘෂි රසායන අපද්‍රව්‍ය මඟින් සිදුවන දූෂණය අවම කිරීම.	මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය	3.70	- සෑම දිස්ත්‍රික්කයකම ගම්මාන 400 බැගින් ගම්මාන 10000 ක් “නීල හරිත” ගම්මාන ලෙස සංවර්ධනය කිරීම ආරම්භ කිරීම. (මූල්‍ය ප්‍රගතිය 81%කි) - කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සියඹලන්ගමුව ගම්මානය නියමු ගම්මානයක් වශයෙන් සංවර්ධනය කිරීම.

ක්‍රියාකාරකම	ප්‍රතිපාදන ලබා දුන් ආයතනය	ප්‍රතිපාදන රු.මි.	ප්‍රගතිය (2016)
			- ප්‍රති ආශ්‍රැත ජල පෙරන (RO PLANTS) වලින් බැහැර වන අප ජලයේ අඩංගු බැර ලෝහ ඇතුලු අතිරේක රසායන ද්‍රව්‍ය නැවත පරිසරයට බැහැරලීම වැළැක්වීම සඳහා පරිසර හිතකාමී, අඩු වියදම් සහ පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි ක්‍රමෝපායක් වශයෙන් phytoremediation ක්‍රමවේදය හඳුන්වා දීම.
ගෘහස්ථ වායු තත්ත්ව කළමනාකරණය	මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය	7.59	- මූල්‍ය ප්‍රගතිය 91.2% කි. අදාල ගොඩනැගිලි තෝරාගෙන (උදා :- පාසල්, රජයේ කාර්යාල, රෝහල් පරිශ්‍ර) අදාල මූලික මිනුම් කටයුතු සිදුකිරීම. මෙම ව්‍යාපෘතිය සඳහා උපදේශකවරයෙක් හා ක්ෂේත්‍ර නිලධාරීන් පත් කිරීම.
නගර හා ගොඩනැගිලි නිර්මාණයේදී හරිත සංකල්ප ආශ්‍රිත ක්‍රියාකාරකම් සිදුකිරීම	මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය	9.00	මාර්ගෝපදේශ සංග්‍රහය සකස්කර එළි දැක්වීම.
අධ්‍යාපන අමාත්‍යාංශයේ කසළ කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම	මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය	4.2	- මූල්‍ය ප්‍රගතිය 99% කි. - ක්ෂේත්‍ර අධ්‍යන මධ්‍යස්ථාන කළමනාකරුවන් සඳහා මූලික පුහුණු වැඩමුළු පැවැත්වීම හා එක් කළමනාකරුවෙකු සඳහා පාසල් 10ක් වන පරිදි හරිත බලකායන් 200ක් පිහිටුවීම.
රත්නපුර ප්‍රාදේශීය සභාවේ ප්ලාස්ටික් පොලිතින් ගබඩා කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීම.	මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය	2.575	ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත.

ක්‍රියාකාරකම	ප්‍රතිපාදන ලබා දුන් ආයතනය	ප්‍රතිපාදන රු.මි.	ප්‍රගතිය (2016)
මාතලේ මහ නගර සභා බල ප්‍රදේශයේ අර්ධ සනීපාරක්ෂක කසල රඳවනයක් ඉදිකිරීම.	මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය	0.80	වේරගම, විහාරගම වත්ත අක්කර 5ක භූමියට අදාළ ශක්‍යතා අධ්‍යන වාර්තාවක් (Feasibility Report) හා සංකල්පිත සැලසුම් නිර්මාණය (Conceptual Design)
පරිසර දූෂණය පාලනය මළ අපද්‍රව්‍ය ප්‍රතිකර්ම පද්ධති ඉදිකිරීම යාපනය - වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාව මහනුවර - නාවලපිටිය නගර සභාව කොම්පොස්ට් අංගන ඉදිකිරීම හා දීර්ඝ කිරීම ගම්පහ - ජා ඇල ප්‍රාදේශීය සභාව ගම්පහ - මීරිගම ප්‍රාදේශීය සභාව	පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	30	- යාපනය, වලිකාමම්උතුර ප්‍රාදේශීය සභාවේ මල අපද්‍රව්‍ය පද්ධති ඉදිකිරීම් කටයුතු අවසන් අදියරේ පවතී. - අනෙකුත් ව්‍යාපෘති නිම කර ඇත.
කණ්ණාදොල ඒකාබද්ධ කසළ කළමනාකරණ වැඩසටහන	මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය	4.00	පොලිතීන්, ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ හා කොම්පෝස්ට් අංගන දෙකෙහි ඉදිකිරීම් සිදුකිරීම.





පොලිතීන්, ප්ලාස්ටික්, විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය නිවාරණ සතිය ප්‍රකාශයට පත් කිරීමේ සමාරම්භක උත්සවය හා ප්‍රදර්ශනය (2016.10.20)





ජා-ඇල හා මීරිගම කොම්පෝස්ට් අංගන ඉදි කිරීම

2.2 වන සංරක්ෂණය හා සංවර්ධනය

වන හරණය හා වන හායනය හේතු කොට ගෙන, ජෛව විවිධත්වය විනාශ වීම, සතුන්ගේ වාසස්ථාන අහිමි වීම, ජල පෝෂක ප්‍රදේශවල ගුණාත්මකභාවය අඩු වීම, පාංශු බාදනය ඉහළ යාම, දේශගුණික විපර්යාස ඇති වීම වැනි අහිතකර බලපෑම් රැසක් ඇති වේ. එබැවින් වන සංරක්ෂණය හා සංවර්ධනය උදෙසා පහත වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

- වනරෝපා
- වන අරණ - රැකවරණ
- වන සරණ

ජනාධිපති කාර්ය සාධන බලකාය විසින් වන සංරක්ෂණය හා සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කරන ලද විශේෂ කාර්යයන් - 2016

- ත්‍රිකුණාමලය මොරවැව කන්තලේ රක්ෂිතයේ හෙක්ටයාර් 2ක භූමි ප්‍රදේශයක ඇහැල, කොහොඹ, කළුවර, මී, කුඹුක්, නා, වීර, පලු ඇතුළු වන පැල 2000ක් එකවර රෝපණය කරමින් 2016.10.21 දින ජාතික රුක් රෝපණ උත්සවය පවත්වන ලදි.
- ශ්‍රී ලංකාවේ වනගහණය 32% දක්වා වැඩි කිරීමේ වැඩසටහනට සමගාමීව පැල මිලියන 15 ක් නිෂ්පාදනය කිරීම ජනාධිපති කාර්යාලයේ මැදිහත් වීම මත ආරම්භ කිරීම.



ජාතික රුක් රෝපණ උත්සවය (2016.10.21)



පැල නිපදවීම

වගුව 2.2 : පැල මිලියන 15 නිෂ්පාදනය කරනු ලබන ආයතන

ආයතනය	පැල ප්‍රමාණය (මිලියන)
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	3.5
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව	5.0
රාජ්‍ය දැව සංස්ථාව	2.0
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	4.5
වනජීවී දෙපාර්තමේන්තුව	0.025

- මාතලේ දිස්ත්‍රික් පරිසර සමුළුවට සමගාමීව නකල්ස් රක්ෂිතයට අයත් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ආරම්භ කරන ලදී.
- රත්නපුර දිස්ත්‍රික් පරිසර සමුළුවට සමගාමීව මැණික් පතල් කැනීම නිසා ඉවුරු බාදනය වී ඇති කළු ගං දෑලේ උණපැල 1000 ක් හා කුඹුක් පැල 1000 ක් සිටුවන ලදී.
- පොළොන්නරුව පරිසර සතිය ප්‍රකාශයට පත් කිරීමේ සමාරම්භක උත්සවයට සමගාමීව පාසල් දරු දැරියන් සහ සහභාගී වූ අනෙකුත් සියලුදෙනා වෙත පළතුරු පැල 4000ක් ලබා දීම ද සිදු කරන ලදී.





පොළොන්නරුව පරිසර සතිය ප්‍රකාශයට පත් කිරීමේ සමාරම්භක උත්සවයේදී පැල බෙදා දීම

වගුව 2.3 : වන සංරක්ෂණ හා සංවර්ධන කටයුතු සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් ලබා දී ඇති ප්‍රතිපාදන

ක්‍රියාකාරකම	ප්‍රතිපාදන ලබා දුන් ආයතනය	ප්‍රතිපාදන රු.මි.	ප්‍රගතිය
කෘෂිකාර්මික ව්‍යාපෘති, සංවර්ධන හා යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා වන ඉඩම් භාවිතය අවම කිරීම හා අනවසරයෙන් අල්ලා ගැනීම වැලැක්වීම(මැනීම් සහ මායිම් සලකුණු කිරීම)	මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව)	25.00	මූල්‍ය ප්‍රගතිය 100% කි. වනාන්තර මැනීම - කි.මී. 10 මායිම් සලකුණු කිරීම - කි.මී. 28 මායිම් කණු නඩත්තුව - -කි.මී. 278.2 . වනාන්තරවල නෛතික තත්ත්වය පිළිබඳ දැනුවත් කිරීමේ නාම පුවරු 30 සවිකිරීම.
පාරිසරික සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම. (නකල්ස් රක්ෂිතයේ තොරතුරු මධ්‍යස්ථානයක් ඉදි කිරීම)	මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව	23.00	ඉදි කිරීම් කටයුතු අවසන් කර ඇත. (මූල්‍ය ප්‍රගතිය 81% කි)

ක්‍රියාකාරකම	ප්‍රතිපාදන ලබා දුන් ආයතනය	ප්‍රතිපාදන රු.මි.	ප්‍රගතිය
පරිහානියට පත් වනාන්තර නැවත වගා කිරීම සඳහා 2017 වර්ෂය සඳහා අවශ්‍ය පැල නිෂ්පාදනය කිරීම.	මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය	42.00	පැළ මිලියන 3ක් නිෂ්පාදනය කර ඇති අතර නඩත්තු කටයුතු සිදු කරමින් පවතී. (මූල්‍ය ප්‍රගතිය 100% කි)
දිස්ත්‍රික්ක 25 සඳහා පළතුරු පැල මිලදී ගැනීම.	අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල	5.00	ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.
වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වන වගා ව්‍යාපෘතිය.	බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	0.1584	ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.
වලව ගඟ රක්ෂිතය සංරක්ෂණය කිරීම.	හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	1.515	ව්‍යාපෘති නිම කර ඇත.
ජනාධිපතිතුමාගේ පදවි ප්‍රාප්තිය වෙනුවෙන් ක්‍රියාත්මක රුක් රෝපණ වැඩසටහන්	වව්නියාව හා මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාල පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	0.854	ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.



වනාන්තර පුනර්ජනනය වේගවත් කිරීම සහ එයට උපකාර කිරීම





පැල නිපදවීම



නකල්ස් රක්ෂිතයේ තොරතුරු මධ්‍යස්ථානයක් ඉදි කිරීම



වනාන්තර මැනීම් හා මායිම් සළකුණු කිරීම

2.3 තිරසර ඉඩම් කළමනාකරණය

හායනය වී ඇති භූමි සම්පත රැකගැනීමේ අරමුණින්, ශ්‍රී ලංකාව තුළ සිදුවන පාංශු බාදනයන් සහ විවිධ දූෂ්‍යකාරක එකතු වීම නිසා සිදුවන භූමි හායනයන් වළක්වාලීම, ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කර ජල සම්පත ආරක්ෂා කර ගැනීම, සියලු මැණික් පතල්, වැලි, ගල් සහ අනෙකුත් ඛනිජ නිධි වැඩබිම් සහ වෙරළ කලාප යථාවත් කර පරිසර පද්ධති පුනරුත්ථාපනය කිරීම, දේශගුණ විපර්යාසවලට අනුහුරු ගම්මාන ලංකාව පුරා ස්ථාපිත කිරීම, භූමි පරිහරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම, ඉලක්ක කරගනිමින් පහත සඳහන් වැඩසටහන් තිරසර ඉඩම් කළමනාකරණය යටතේ ක්‍රියාත්මකයි.

- හායන සායන
- ක්ෂේම භූමි
- කැණීම් භූමි සායන
- දේශගුණ අනුහුරු
- සාර භූමි

ජනාධිපති කාර්ය සාධන බලකාය විසින් ක්‍රියාත්මක කරන ලද විශේෂ කාර්යයන්-2016

- 2014 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍ර, ඒවායේ පෝෂක ප්‍රදේශ හා රක්ෂිත ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය පදනම් කොට ගෙන දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කිරීම උදෙසා ඒකාබද්ධ සංදේශයක් සකස් කිරීම.
- පොළොන්නරුව දිස්ත්‍රික් පරිසර සතිය ප්‍රකාශයට පත්කිරීමේ සමාරම්භක උළෙලට සමගාමීව දේශගුණ විපර්යාස අනුහුරු ගම්මාන වැඩසටහන යටතේ හඳුනාගත් ගොවි මහතුන් 200 දෙනෙකුට කෘෂි උපකරණ හා පළතුරු පැළ ලබා දීම.
- කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘති ක්‍රියාත්මක වීම නිසා ගංගාවල ස්වභාවිකව ජලය ගලා යෑමේ රටාව වෙනස්වීම මත මහජනතාව අපහසුතාවයට පත්වීම හා ඉන් සිදුවන පරිසර හානි අවම කිරීම සඳහා ජනාධිපති කාර්යාලය මැදිහත් වීම.

- මැණික් පතල් පුනරුත්ථාපනය කිරීම හා නැවත භූමි පුනරුත්ථාපනය උදෙසා මැදිහත් වීම, අනවසර කැණීම් හා කැණීම් ආශ්‍රිත භූමි හායනය අවම කිරීම හා කැණීම් කටයුතුවලින් සිදුවන පාරිසරික හානිය අවම කිරීම උදෙසා අදාළ ආයතන දැනුවත් කිරීමට කටයුතු කිරීම.
- නායයෑම් අවදානම් සහිත භූමිවල එම අවදානම් සහගත තත්ත්වය අවම කිරීම සඳහා සුදුසු පියවර ගැනීමට කටයුතු කිරීම.

වගුව 2.4 තිරසර ඉඩම් කළමනාකරණය සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් ප්‍රතිපාදන ලබාදීම -2016

ක්‍රියාකාරකම	ප්‍රතිපාදන ලබා දුන් ආයතනය	ප්‍රතිපාදන රු.මි.	ප්‍රගතිය
ස්වභාවික සම්පත් සංරක්ෂණය හා ඉහළ ජලාධාර පෝෂක ප්‍රදේශ කළමනාකරණය	මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය	10.00	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 8ක දැනුවත් කිරීමේ වැඩසටහන් සහ පැළ රෝපණ කටයුතු සිදු කරන ලදී.
තිරසර භූමි කළමනාකරණය (ස්වභාවික සම්පත් සංරක්ෂණය හා ඉහළ ජලාධාර පෝෂක ප්‍රදේශ කළමනාකරණය)	රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	5.00	බදුල්ල, හපුතලේ, වැලිමඩ, බණ්ඩාරවෙල, ඌව පරණගම, ඇල්ල, හාලිඇල ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ 7 වැඩසටහන සඳහා තෝරා ගන්නා ලදී. එම ප්‍රදේශවල පැල 60,095 ක් සිටුවා අවසන් කර ඇත. ආවරණය කරන ලද මුළු රක්ෂිත භූමි ප්‍රමාණය හෙක්ටයාර 75.7
නුවරඑළිය, මහනුවර, මාතලේ, බදුල්ල, රත්නපුර, කෑගල්ල, මාතර, ගාල්ල, පුත්තලම සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කවල ආදර්ශ ව්‍යාපෘති ලෙස අක්කර 20 බැගින් ජල පෝෂක ප්‍රදේශ ආශ්‍රිතව වන වගාව සිදු කිරීම.	නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය	10.00	දිස්ත්‍රික් ස්ථාන භාර නිලධාරීන් දැනුවත් කර, ප්‍රජාමූල සංවිධාන තෝරාගෙන, පැළ අක්කර 114ක සිටුවා අවසන් කර ඇත.
ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති දිස්ත්‍රික්ක 11 කට අයත් පරිසර සංරක්ෂණ යෝජනා ඇතුළත් ව්‍යාපෘති 44 ක්‍රියාත්මක කිරීම.	ඉඩම් අමාත්‍යාංශය	5.5	ඉඩම් හඳුනාගැනීම, පැළ මිලදී ගැනීම සහ සිටුවීම, පාංශු සංරක්ෂණ ක්‍රම අනුගමනය කිරීම, දැනුවත් කිරීම සහ දැන්වීම් පුවරු සවිකිරීම. (සියලුම වැඩසටහන් නිම කර 100%ක ප්‍රගතියක් ළඟා කරගෙන ඇත)
වේලිඔය ජලාධාර ප්‍රදේශය කළමනාකරණය සඳහා භූමි පරිහරණ සමීක්ෂණය සිදුකිරීම හා කළමනාකරණ සැලැස්ම සකස් කිරීම.	මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය	1.83	- 2016 වසරේ මූල්‍ය ප්‍රගතිය 85% කි. - පාරිසරික සංවේදී ප්‍රදේශ දැක්වෙන සිතියම් හා ස්වාභාවික විපත්වලට සමාජය ගොදුරු විය හැකි ආකාරය පිළිබඳ සිතියම් සැකසීමේ මූලික කටයුතු සිදු කර ඇත. මූලික අංකිත දත්ත (Digital Data) මිලදී ගෙන ඇත.





පාංශු සංරක්ෂණ ක්‍රම භාවිතය





ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය

2.4 ආයතනික ප්‍රතිව්‍යූහගත කිරීම හා ප්‍රවර්ධනය

පරිසර විෂය පුළුල් පරාසයකින් මෙන්ම එකිනෙක විෂයයන් සහ සම්බන්ධ වන නිසා ද සෑම ක්ෂේත්‍රයකම අඩු වැඩි වශයෙන් පරිසර සංරචක පවතින නිසාවෙන් ද, පරිසර සංරක්ෂණ වැඩසටහනකදී ආයතනික සම්බන්ධීකරණය හා ප්‍රවර්ධනය සඳහා ඉහළ අවධානයක් ලබා දිය යුතුය. මේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පහත වැඩසටහන් ක්‍රියාත්මක වේ.

- පරිසර බලමුළු
- පද්ධති ප්‍රතිනිර්මාණය
- ජන අඩහැරය

ජනාධිපති කාර්ය සාධන බලකාය විසින් ක්‍රියාත්මක කරන ලද විශේෂ කාර්යයන්- 2016

- පරිසර සංරක්ෂණය සඳහා විද්වත් කවීකාවතක් ඇති කිරීමත්, විද්වතුන් හා විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය ලබා ගැනීමත් අරමුණු කොට ගෙන විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සහ විද්වතුන් සමඟ 2015.12.29 වන දින හා 2016.03.23 දින වැඩමුළු පවත්වන ලද අතර පරිසර සංරක්ෂණ වැඩසටහන්වල උන්නතිය සඳහා මෙම කමිටු යෝජනා යොදා ගනු ලැබේ.

- පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන සමාජගත කිරීමටත් ජනතාව දැනුවත් කිරීමටත් පරිසර සමුළුව හා ජාතික උත්සව පැවැත්වේ. ඒ ඒ දිස්ත්‍රික්කයට සුවිශේෂී වූ පරිසර ගැටලු හඳුනා ගැනීම, ඒ සඳහා විසඳුම් ලබා දීම හා පසු විපරම් කටයුතු සිදුකිරීම පරිසර සමුළුවලට සමගාමීව ක්‍රියාත්මක වේ.

වගුව 2.5: පරිසර සමුළු හා ජාතික උත්සව පැවැත්වීම -2016

දිස්ත්‍රික්කය	පැවැත්වූ දිනය	ක්‍රියාත්මක කෙරෙන සමගාමී වැඩසටහන් ප්‍රමාණය සහ ප්‍රගතිය
රත්නපුර පරිසර සමුළුව - සිවලී ක්‍රීඩාංගණය	2016.03.07	සමගාමී වැඩසටහන් - 15 (ප්‍රගති සමාලෝචන රැස්වීම් 02ක් පවත්වා ඇත.)
පොළොන්නරුව - පළඟස්දමන සේවා මුක්ත කඳවුර ම.වි.	2016.05.30	ජගත් පරිසර දිනයට සමගාමීව ක්‍රියාත්මක වූ පරිසර සතිය ප්‍රකාශයට පත් කිරීමේ සමාරම්භක උළෙල
මාතලේ පරිසර සමුළුව - එඩ්වඩ් ක්‍රීඩාංගණය	2016.06.05	සමගාමී වැඩසටහන් - 34 (ප්‍රගති සමාලෝචන රැස්වීමක් පවත්වා ඇත.)
ත්‍රිකුණාමලය පරිසර සමුළුව - මැකේසර් ක්‍රීඩාංගණය	2016.10.21	සමගාමී වැඩසටහන් - 17







රත්නපුර දිස්ත්‍රික් පරිසර සමුළුව (2016.03.07)





මාතලේ දිස්ත්‍රික් පරිසර සමුළුව (2016.06.05)







ත්‍රිකුණාමලය දිස්ත්‍රික් පරිසර සමුළුව (2016.10.21)

- පාසල්වල පරිසර සංගම් පිහිටුවීම හා පරිසර හිතකාමී පාසල්පරිශ්‍රයක් ඇති කිරීමට කටයුතු කිරීම සඳහා ජනාධිපති කාර්යාලය මගින් රු.මි.4.2 ක ප්‍රතිපාදන ලබා දී ඇති අතර පරිසර සංවේදී විෂය කරුණු ඇතුළත් කරමින් සංශෝධනය කළ විද්‍යා විෂය මාලාව පිළිබඳ ගුරුභවතුන් පුහුණු කිරීම සඳහා රු.මි.5 ක ප්‍රතිපාදන ලබා දී ඇත. මේ වන විට පළාත් 8 ක ගුරු භවතුන් පුහුණු කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර තෝරාගත් පාසල් 200 ක සණ අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් කොට හරිත පාසල් වැඩසටහනේ කටයුතු ආරම්භ කර ඇත.

3. මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන

මත්ද්‍රව්‍ය භාවිතය සඳහා තරුණ කොටස් විශාල වශයෙන් යොමුවීමේ ප්‍රවණතාවයක් පැවතීම ශ්‍රී ලංකාවේ ආර්ථික හා සදාචාරාත්මක පරිහානියට ප්‍රබල ලෙස බලපා ඇත. අඩු ආදායම්ලාභී පවුල්වල ආදායමෙන් 1/3 ක් පමණ මද්‍යසාර හා දුම්වැටි සඳහා වැය කරන බව, සමීක්ෂණ මඟින් හෙළිවී ඇති අතර, රටෙහි සෞඛ්‍ය වියදමින් 22% කට වඩා වැඩි ප්‍රතිශතයක් සෘජුවම මත්ද්‍රව්‍ය භාවිතා කර රෝගී වූවන් වෙනුවෙන් වැය කිරීමට සිදුවී ඇත. මෙම අභාග්‍යසම්පන්න තත්ත්වයෙන් රට මුදවා සංඛ්‍යාත්මක සංවර්ධනයක් සඳහා **"මතින් නිදහස් රටක්"** වැඩපිළිවෙළ මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්යසාධන බළකාය මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ.

මත්ද්‍රව්‍ය නිවාරණයට අදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන ඒකාබද්ධ කර ගනිමින් 2015 වසරේදී මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්යසාධන බළකාය පිහිටුවන ලද අතර මෙම කාර්යසාධන බළකාය විසින් මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහනෙහි සියලු අධීක්ෂණ හා සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලබයි.

2014 වසරට සාපේක්ෂව වසර 2020 වන විට ශ්‍රී ලංකාවේ නීති විරෝධී මත්ද්‍රව්‍ය නිෂ්පාදනය, ප්‍රවාහනය හා අලෙවිය 80% කින් අඩු කිරීම, ඒක පුද්ගල මද්‍යසාර භාවිතය 25% කින් අඩු කිරීම හා දුම්කොළ නිෂ්පාදන භාවිතය 50% කින් අඩු කිරීම මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහනේ ප්‍රධාන ඉලක්කයන් වේ.

ඒ අනුව, මත්ද්‍රව්‍ය ඉල්ලුම අවම කිරීම මෙන්ම සැපයුම අවම කිරීම පිළිබඳව ද අවධානය යොමු කරමින් පහත ප්‍රධාන අංශ 03 යටතේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

1. ප්‍රතිපත්ති හා නීති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා වැටලීම්
2. ප්‍රතිකාර හා පුනරුත්ථාපනය
3. නිවාරණය

01. ප්‍රතිපත්ති හා නීති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා වැටලීම්

මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්යසාධන බළකාය විසින් මත්ද්‍රව්‍ය සම්බන්ධ වැටලීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම හා පසු විපරම් කිරීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය, සුරාබදු දෙපාර්තමේන්තුව හා ත්‍රිවිධ හමුදාව ඒකාබද්ධව හඳුනාගන්නා ලද ගැටලු සඳහා පහත පරිදි පියවර ගෙන ඇත.

- සියලුම දේශීය ආරක්ෂක බුද්ධි අංශ, ජාත්‍යන්තර බුද්ධි අංශ හා එක්සත් ජාතීන්ගේ අපරාධ හා මත්ද්‍රව්‍ය පිළිබඳ කාර්යාලය සමඟ මත්ද්‍රව්‍ය ජාවාරම වැළැක්වීම සඳහා බුද්ධිමය ඒකකයක් පිහිටුවීම.
- කොළඹ වරාය තුළ මත්ද්‍රව්‍ය කාර්යාංශයට අනුයුක්තව ශක්තිමත් විමර්ශන ඒකකයක් ස්ථාපිත කිරීමට මූලික කටයුතු ආරම්භ කර ඇත.
- අන්තරායකාරී ඖෂධ යටතට ගැනෙන සාම්ප්‍රදායික මත්ද්‍රව්‍ය මෙන්ම මත්පෙති වැනි නවීන මත්ද්‍රව්‍ය පිළිබඳව වැටලීම් කරනු ලබන නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා වැඩසටහන් සංවිධානය කිරීම.
- සුරාබදු ආඥාපනතේ 46,47 හා 50 වගන්ති සංශෝධනය තුළින් පොලිස් නිලධාරීන්ට වැටලීම් සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සැලසීම.
- මත්ද්‍රව්‍ය සම්බන්ධ සැකකරුවන් පැය 48 ක් රඳවාගෙන ප්‍රශ්න කිරීමට හැකිවන පරිදි අදාළ නීතිමය සංශෝධන සිදුකිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

- මසකට වරක් සියලු ආරක්ෂක අංශ මුණගැසී වැටලීම් සම්බන්ධ පසු විපරම් කටයුතු සිදුකරනු ලබයි.

1.1 ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ හා සුරා බදු දෙපාර්තමේන්තුවේ වැටලීම් සහ ක්‍රියාකාරිත්වය

මත්ද්‍රව්‍ය භාවිතය සීඝ්‍ර ව්‍යාප්තියට මූලික කරුණක් වන්නේ මත්ද්‍රව්‍ය රට තුළ සුලභ වීමය. එම ව්‍යාප්තිය අවම කිරීමට නම් තහනම් මත්ද්‍රව්‍ය රට තුළට රැගෙන ඒම වැළැක්වීම සම්බන්ධව දැඩි අවධානයක් යොමු කළ යුතුව ඇත. එකී කාර්ය සම්බන්ධව නාවික හමුදාව 2016 වසර තුළ ප්‍රශස්ත මට්ටමේ ජයග්‍රහණයක් ලැබූ අතර නාවික හමුදා නිලධාරීන් මත්ද්‍රව්‍ය භාවිතයෙන් වළකාලීම සඳහා ද කටයුතු සංවිධානය කර ඇත.

නාවික හමුදා කඳවුරු තුළ පවත්වාගෙන යනු ලබන ආපනශාලා තුළ දුම්වැටි සහ මත්පැන් අලෙවිය පූර්ණ තහනමකට ලක් කර ඇති අතර නිලධාරි නිවාස සහ ජ්‍යෙෂ්ඨ නාවික නිවාස සහ නාවික ආයතනයන්හි දුම්වැටි අලවියද තහනම් කර ඇත. නාවික හමුදා කඳවුරු, නිවස්න හා අනෙකුත් පොදු ස්ථානයන්හි ප්‍රසිද්ධියේ දුම්පානය තහනම් කර ඇති අතර නාවික හමුදා කඳවුරු ප්‍රධාන දොරටු අභියස දුම්වැටි සහ මත්ද්‍රව්‍ය කඳවුරු තුළට රැගෙන ඒම වැළැක්වීම සඳහා නාවික හමුදා විනයාරක්ෂක අංශය විසින් සියලු නාවික පුද්ගලයින් දැඩි පරීක්ෂාවට ලක් කිරීම සිදු කරනු ලැබේ.

2016 වර්ෂයේ ඔක්තෝබර් මස වනවිට දී නාවික හමුදාව විසින් අත්අඩංගුවට ගන්නා ලද මත්ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය වර්ගය	ප්‍රමාණය (කි.ග්‍රෑ.)
හෙරොයින්	113.3
කේරල ගංජා	1,657.4
දේශීය ගංජා	7,235.9

තවද කොකේන්, හසීෂ්, කංසා මිශ්‍ර දුම්කොළ, මෝදක, පාන් පරාග්, හැන්ස්, බජාජ් හැන්ස්, බැසි පවුඩර් සහ මත්පෙති වැනි තහනම් මත්ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් අත්අඩංගුවට ගැනීමටද කටයුතු කර ඇත.

මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්යසාධන බළකාය සමඟ යුද හමුදාව, පොලිස් විශේෂ කාර්ය සාධන බළකාය හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ද එක්ව ජාතික මෙහෙවරක යෙදී ඇත. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය දැනුවත් කිරීම් ආදි කාර්යයන්හිදී යුද හමුදාව විසින් නිලධාරීන් ක්ෂේත්‍ර කටයුතුවල යොදවමින් දැනුවත් කිරීම් සම්බන්ධ කටයුතු සඳහා සෘජු දායකත්වයක් සපයා ඇති අතර සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ද එම දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කරමින් විවිධ ක්‍රියාකාරකම් ඔස්සේ මහත් සේවාවක් මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන සඳහා ජනාධිපති කාර්ය සාධන බළකාය වෙත සපයා ඇත.

පොලිස් විශේෂ කාර්ය බළකාය විසින් බස්නාහිර පළාත තුළ සිදුකර ඇති විෂ මත්ද්‍රව්‍ය (කොකේන්, හෙරොයින්, කේරල ගංජා, ගංජා) අත්අඩංගුවට ගත් ප්‍රමාණයේ වටිනාකම, රු. මිලියන 250.9ක් ද වන අතර රු.මිලියන 1.2 ක නීති විරෝධි මත්පැන් හා දුම්වැටි අත්අඩංගුවට ගැනීම් ද සිදු කර ඇත.

7 - CM 25284

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තු වාර්තා අනුව 2015 සහ 2016 බදු මුදල් සංසන්දනය මෙසේය.

2015 බදු මුදල	2016 බදු මුදල	2015/2016 (අඩු / වැඩි වීම) %
120,794,510,293.29	105,957,033,447.21	14%

2015 ට පෙර නීති විරෝධී ලෙස එතනෝල් ලංකාවට ආනයනය කරන ලද අතර එම නීති විරෝධී එතනෝල් භාවිත කර නිෂ්පාදනය කරන ලද මධ්‍යසාර ලේඛනගත වීමක් හෝ බදු අයවීමක් සිදු නොවීය. මත්ද්‍රව්‍ය නිවාරණ කාර්යසාධන බළකාය ක්‍රියාත්මක වීමත් සමඟ මෙසේ නීති විරෝධීව පැවති එතනෝල් නතරවීම නිසා සියලු මත්ද්‍රව්‍ය නිෂ්පාදන ලේඛනගතවීම හා එම නිෂ්පාදන සඳහා විධිමත් පරිදි බදු අයකිරීම ආරම්භ විය. මෙය නිෂ්පාදනයේ වැඩිවීමක් නොව සත්‍ය නිෂ්පාදන වාර්තා ගතවීමෙන්, නිසියාකරව බදු අය කිරීමෙන් ප්‍රතිඵලයයි.

එසේම, මත්ද්‍රව්‍ය නිවාරණ කාර්යසාධන බළකායේ ක්‍රියාකාරීත්වයත් සමඟ මද්‍යසාර නිෂ්පාදනාගාර දැඩි අධීක්ෂණයකට ලක්විය. ඒ හේතුවෙන් සත්‍ය මද්‍යසාර නිෂ්පාදනය වාර්තාගතවීම සිදුවිය. එමෙන්ම නීති විරෝධී මද්‍යසාර වැටලීම් වැඩි කෙරිණ. 2014 දී වැටලීම් ග්‍රහණ 29,176ක් වාර්තාවී ඇති අතර 2016 වන විට එය 32,783 දක්වා ඉහළ ගොස් තිබේ. ඒ සමඟ රට තුළ නීති විරෝධී මද්‍යසාරවල ප්‍රබල අඩුවීමක් දක්නට ඇත.

ආනයනික බදු නොගෙවූ විදේශ මද්‍යසාර රට තුළට ගලා ඒම වැළැක්වීමට නෛතික ප්‍රතිපාදන ගෙන තිබේ. 2016.01.01 ට පෙර ලංකාව තුළ විදේශීය මද්‍යසාර ළඟ තබා ගැනීම හෝ ප්‍රවාහනය කිරීමේ සීමාවක් නොතිබුණු අතර 2016.01.01 දින සිට විදේශීය මද්‍යසාර සඳහා එම සීමාව ලීටර් 7.5 බවට පත්විය.

මීට අමතරව 2016.09.01 දින සිට ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව මඟින් විදේශ මද්‍යසාර නියාමනය කිරීම ආරම්භ කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස විදේශීය මද්‍යසාර වැටලීම් වැඩිවීම් හා විදේශීය මද්‍යසාර සුලභ නොවීම සිදු විය.

මේ කරුණු දෙස විමසිල්ලෙන් බැලූවිට පෙනී යන්නේ රටේ නීතිය ක්‍රියාත්මක වීම තුල සිදුවූ වෙනස්කම්ය. බැලූ බැල්මට නිෂ්පාදන වැඩිවීමක් පෙනුනද සිදුවී ඇත්තේ රට තුළ නීති විරෝධී මද්‍යසාර අවම වීමත්, සියලු මද්‍යසාර ලේඛනගතවීමත්, විධිමත් බදු අය කිරීමත්ය.

වර්තමාන රජය ප්‍රායෝගිකව මතින් නිදහස් රටක් තේමාව යටතේ මත්ද්‍රව්‍ය නිවාරණ කාර්යසාධන බළකාය සම්බන්ධීකරණය කරමින් දිවයින පුරා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීම තුළින් මද්‍යසාර අවම කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය සාර්ථක කර ගැනීමට මෙසේ දායකවී ඇත.

1.2 දුම්කොළ ගොවීන් වෙනත් වගාවන් වෙත යොමු කිරීම.

දුම්කොළ වගාව අධෛර්යවත් කිරීම සඳහා දුම්කොළ ගොවීන්ට වඩා ආකර්ෂණීය වගාවන් හඳුන්වාදීමේ කටයුතු, ලංකා දුම්කොළ සමාගම හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහයෝගයෙන් මාතලේ, බදුල්ල, අනුරාධපුරය, පොළොන්නරුව, කුරුණෑගල, නුවර එළිය, මොනරාගල, හා මහනුවර දිස්ත්‍රික්කයන්හි මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්යසාධන බළකායේ මහපෙන්වීම මත ආරම්භ කර ඇත.

වර්ෂය	2016	2017	2018	2019	2020
දුම්කොළ වගාවෙන් ඉවත් කිරීමට අපේක්ෂිත ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර්)	200	400	600	400	400

ඒ අනුව, වසර 2020 වනවිට පූර්ණ වශයෙන් මෙරට දුම්කොළ වගාව අත්හිටුවීමට අපේක්ෂා කරේ.දුම්කොළ වගාවේ දැනට නිරත ගොවීන් හට වෙනත් ආර්ථික බෝග හඳුන්වා දෙන අතර රෝපණ ද්‍රව්‍ය, තාක්ෂණික මඟපෙන්වීම සහ වෙළෙඳපොළ සම්බන්ධීකරණ කටයුතු ද ප්‍රධාන වශයෙන් මෙම වැඩසටහන තුළ අන්තර්ගත වේ.

තවද, 2016 මහකන්නයේදී විකල්ප අපනයන කෘෂි බෝගයක් ලෙස අක්කර 50 ක ප්‍රමාණයක ගම්මිරිස් වගා කිරීමට යොමු කර ඇති අතර උඩුදුම්බර හා තෙල්දෙණිය යන ප්‍රදේශවල ගොවි මහතුන් 55 දෙනෙකු එම ආදර්ශ වගාවන් මේ වනවිට ආරම්භ කර ඇත. 2017 යල කන්නයේදී අක්කර 527.5 ක ප්‍රමාණයක බඩ ඉරිඟු, රටකජු, මුං ඇට, මිරිස්, දේශීය වී, කව්පි හා බතල යන විකල්ප බෝග වගා කෙරෙන අතර පොළොන්නරුව, ගලේවල, මැල්සිරිපුර හා මහියංගණය යන ප්‍රදේශවල ගොවි මහතුන් නියෝජනය වන මෙහි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 519 ක් වේ.මෙලෙස ආරම්භක පිටවර ලෙස 2016/2017 දී හෙක්ටයාර් 200 ක් දුම්කොළ වගාවෙන් ඉවත් කර වෙනත් බෝග වගාවන්ට ගොවීන් යොමු කරමින් පවතියි.

1.3 මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා දඩ මුදල් හා දඬුවම් ඉහළ නැංවීම.

ගංජා ළඟ තබා ගැනීම සම්බන්ධ දඩය රු. 5,000/- සිට රු. 50,000/- දක්වා ඉහළ නැංවීමට යෝජනා කර ඇති අතර සංශෝධනය කල යුතු අනෙක් දඬුවම් හා දඩ මුදල් සම්බන්ධව හඳුනාගැනීම් සිදුකොට අදාළ නීති ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය විධිවිධාන මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්යසාධන බළකාය විසින් ගෙන ඇත.

දිවයින පුරා පිහිටි මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපන මධ්‍යස්ථානයන් හි සිදුකරනු ලබන පුනරුත්ථාපන වැඩසටහන්වල අන්තර්ගතයන් කාලීන සමාජීය අවශ්‍යතා මත සංශෝධනය කරමින් හා සංවර්ධනය කරමින් අදාළ නිරීක්ෂණයන් ජනාධිපති කාර්යසාධන බළකාය මඟින් සිදු කරනු ලැබේ.පුනරුත්ථාපන මධ්‍යස්ථාන සඳහා, මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් ස්වේච්ඡාවෙන් ද බාහිර පාර්ශ්වකරුවෙකුගේ මඟපෙන්වීම මත ද යොමුවන අතර මත්ද්‍රව්‍ය භාවිතය හේතුකොටගෙන නීතිමය වශයෙන් වැරදිකරුවන් බවට පත්වූවන් බන්ධනාගාර තුළදී පුනරුත්ථාපන ක්‍රියාවලියට ලක්කරනු ලැබේ.

මෙම සියලු පුනරුත්ථාපන මධ්‍යස්ථානයන්හි මානව හා භෞතික සම්පත් අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අදාළ අමාත්‍යාංශයන් හා සෘජු සම්බන්ධීකරණ කටයුතු ජනාධිපති කාර්යසාධන බළකාය මඟින් සිදුකරනු ලැබේ.

2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහිවූ තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපන) පිළිබඳ පනත යටතේ මත්ද්‍රව්‍යට ඇබ්බැහි වූ තැනැත්තන් රැකබලා ගැනීම හා පුනරුත්ථාපනය සඳහා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය යටතේ කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය 2013 අගෝස්තු 20 වන දින ආරම්භ කර ඇත.

පුනරුත්ථාපනය වූ අයගේ ජීවන තත්ත්වය, සමාජීය, හා ආර්ථික පසුබිම සවිමත් කිරීම සඳහා වෘත්තීය පුහුණුවක් ලබාදීම වෙනුවෙන් 2016 අගෝස්තු 14 වන දින තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානය, සේනපුර ස්ථාපනය කර ඇත.

පුනරුත්ථාපන ක්‍රියාවලිය වසරක කාල සීමාවකි. පළමු මාස 06 ක ප්‍රතිකාර පුනරුත්ථාපන මධ්‍යස්ථානය කන්දකාඩු මඟින් මූලික පුනරුත්ථාපනය සිදුකරන අතර ඒ සඳහා අධ්‍යාත්මික, උපදේශන, අධ්‍යාපනික, යෝගා, නායකත්ව පුහුණු වැඩසටහන් හා සෞන්දර්යාත්මක වැඩසටහන් ප්‍රතිකාර ක්‍රමවේදය සඳහා අනුගමනය කෙරේ.

දෙවන මාස 06ක කාලය, වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා සේනපුර තෘතියික හා වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානය මඟින් ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය හා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු

අධිකාරියද සම්බන්ධ කර ගනිමින් වෘත්තීය නිපුණත්වය ලබාදීම සඳහා වඩුකාර්මික ගෘහ භාණ්ඩ පාඨමාලාව, වඩුකාර්මික ගොඩනැගිලි පාඨමාලාව, පෙදරේරු පාඨමාලාව, ජලනල පාඨමාලාව, විදුලි කාර්මික පාඨමාලාව, පරිගණක පාඨමාලාව හා වැද්දුම් ශිල්පීය පාඨමාලාව ක්‍රියාත්මක කර ඇත. සාර්ථකව පාඨමාලාව හදාරනු ලබන පුනරුත්ථාපනලාභීන් සඳහා NVQ III සහතිකපත් ලබාදීමට කටයුතු සලසා තිබේ.

මෙම වෘත්තීය පුහුණු පාඨමාලාවන්ට අමතරව වෘත්තිය අනුරූපිකා වැඩසටහන් කාර්මික තාක්ෂණික ආයතනය, පොල් සංවර්ධන අධිකාරිය, කාර්මික සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මණ්ඩලය, ජ්‍රීමා ආයතනය, විසිතුරු මසුන් අභිජනන පුහුණු මධ්‍යස්ථානය හා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යන ආයතන සම්බන්ධ කර ගනිමින් පුනරුත්ථාපනලාභීන් සඳහා ස්වයං රැකියා අවස්ථාවන් විවිධ වෘත්තීය ඔස්සේ ඇති කිරීම වෙනුවෙන් මෙම පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමට මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්යසාධන බළකාය විසින් කටයුතු යොදා ඇත.

පුනරුත්ථාපන ක්‍රියාවලිය ආරම්භයේ සිට මේ දක්වා අඛණ්ඩව වසර 3කට ආසන්න කාලයක් මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිකරුවන් පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා යොමු කර ඇත. ඉන් පසුව මාස 06ක වෘත්තීය පුහුණුව සඳහා යොමුකර සමාජගත කරන ලද පුනරුත්ථාපනලාභීන් ඔවුන්ගේ දිස්ත්‍රික්ක අනුව පහත සඳහන් පරිදි වේ.

වගුව 2.1 මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධව පුනරුත්ථාපනය කර 2016 දෙසැම්බර් මස 31 වන දින වන විට සමාජගත කරන ලද සහ පුනරුත්ථාපනය කරමින් සිටින මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිකරුවන් දිස්ත්‍රික්ක වශයෙන්

අ/අ	දිස්ත්‍රික්කය	පුනරුත්ථාපනය කළප්‍රමාණය	සමාජගතකළ ප්‍රමාණය	පුනරුත්ථාපනය කරමින්පවතිනප්‍රමාණය
1	අම්පාර	5	5	-
2	අනුරාධපුර	38	31	7
3	බදුල්ල	8	6	2
4	කොළඹ	1016	693	215
5	ගාල්ල	28	22	4
6	ගම්පහ	440	358	73
7	හම්බන්තොට	29	15	5
8	කළුතර	128	103	18
9	මහනුවර	32	21	10
10	කෑගල්ල	23	18	5
11	කුරුණෑගල	92	80	13
12	මාතර	8	5	3
13	මොණරාගල	1	1	-
14	මාතලේ	1	0	1
15	නුවරඑළිය	3	1	2
16	පොළොන්නරුව	8	8	-

අ/අ	දිස්ත්‍රික්කය	පුනරුත්ථාපනය කළ ප්‍රමාණය	සමාජගතකළ ප්‍රමාණය	පුනරුත්ථාපනය කරමින් පවතින ප්‍රමාණය
17	පුත්තලම	55	49	5
18	රත්නපුර	13	12	1
19	ත්‍රිකුණාමලය	7	7	-
20	මඩකලපුව	1	0	1
එකතුව		**1936**	**1435**	**363**

- මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී පුනරුත්ථාපනයෙන් පසු සමාජගත වන පුනරුත්ථාපනලාභීන් සඳහා සිදු කරනු ලබන පසුවිපරම් ක්‍රියාවලිය

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී සමාජගතවූවන්ගේ ආර්ථික හා සමාජීයමය තත්ත්වයන් හා ගැටලු පිළිබඳව ඔවුන් හා ඔවුන්ගේ පවුල් වෙතින් සොයා බැලීම හා සෘජුවම ඊට මැදිහත් වීම තුළින් ඔවුන් දේශයට ඵලදායී හා වැඩදායී පුරවැසියන් බවට පත්කිරීම කාලීන අවශ්‍යතාවයකි.

මෙම ක්‍රියාවලියේදී ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් ආර්ථික, සමාජීය හා සුභසාධන කටයුතු නංවාලීම උදෙසා ප්‍රමුඛතාවය ලබාදී කටයුතු කර ඇත. ඒ අනුව, පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය යටතේ සිටින පුනරුත්ථාපනලාභීන්හට සමාජය තුළ ජීවත්වීමේදී ඇතිවන හෝ මුහුණපෑමට සිදුවන ගැටලු මෙන්ම ආර්ථික අපහසුතා හා විරැකියාව වැනි ගැටලු පැන නගින අවස්ථාවන්හිදී සහන සැලසීම වෙනුවෙන් ද ඔවුන් හට සමාජයේ යහපත් පුද්ගලයින් වශයෙන් ජීවත්වීමට ඇති හැකියාව සොයා බැලීම සඳහා මෙම කාර්යාංශය යටතේ ක්‍රියාත්මක පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික, සමාජීය හා සුභසාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාල 02 ක් කොළඹ හා පුත්තලම ප්‍රදේශවල ස්ථාපිත කර ඇත.

ඒ යටතේ, දැනට පුනරුත්ථාපනය කොට සමාජගතවූවන් 1258ක් තුළින් නියැදියක් ලෙස පුනරුත්ථාපනලාභීන් 373 දෙනෙකු පිළිබඳ පසුවිපරම් කොට ඔවුන්ගේ අදහස් යෝජනා අනුව අවශ්‍යතා හා ගැටලු හඳුනාගැනීමේ අධීක්ෂණයක යෙදෙන අතර එහිදී හඳුනාගත් විශේෂිත කරුණු පහත සඳහන් පරිදි විශ්ලේෂණය කළ හැක.

- සමාජගත වන ලද පුනරුත්ථාපනලාභීන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ වත්මන් ස්වභාවය අනුව 26.8% ක් කිසිදු මත්ද්‍රව්‍යයක් භාවිතා නොකරන, 26.3% ක් අන්තරායකර මත්ද්‍රව්‍ය හැර මත්ද්‍රව්‍ය භාවිත කරන, 24.4% ක් නැවත මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවී ඇති, 5'9% ක් නැවත සිරගතවූවන් වශයෙන් ද හඳුනාගෙන ඇත.

- එසේ හඳුනාගත් පුනරුත්ථාපනලාභීන්ගේ ජීවන වෘත්තීන්වල ස්වභාවය හඳුනාගත් අතර, ඒ අනුව 19% ක් කුලී වැඩ 13% ක් රැකියා විරහිත 3% ක් විදේශගතව සිටින, ඉතිරි පුනරුත්ථාපනලාභීන් සුළු වශයෙන් ස්වයං රැකියාවල සහ පුද්ගලික අංශයේ රැකියාවල නිරත වන බවද හඳුනා ගැනීමට හැකි විය.

- බස්නාහිර පළාතට අයත් කොළඹ දිස්ත්‍රික්කයන්හි වැඩි වශයෙන් ගම්පහ හා කළුතර දිස්ත්‍රික්කවල මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් ව්‍යාප්ත වී සිටින බව අනාවරණය කර ගත හැකි විය.

ඒ අනුව ජනාධිපති කාර්යසාධන බළකායේ උපදෙස් මත පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය මඟින් ඉහත දිස්ත්‍රික්ක 03 ආවරණය වන පරිදි පසුවිපරම් කටයුතු දැඩි අවධානයකින් සිදු කරනු ලබයි. එම දිස්ත්‍රික්කයන්ට අදාළව පසු විපරම් සිදුකර ඇති සංඛ්‍යාමය දත්තයන් පහත පරිදි වේ.

දිස්ත්‍රික්කය	2016 සමාජගත කළ සංඛ්‍යාව	පසුවිපරම් කළ සංඛ්‍යාව		**පසුවිපරම් නොකළ සංඛ්‍යාව**	
කොළඹ	**666**	202	(30%)	**464**	**(70%)**
ගම්පහ	352	112	(32%)	**240**	**(68%)**
කළුතර	**99**	30	(30%)	**69**	**(70%)**
	1117	344	(31%)	**773**	**(69%)**

2017 වර්ෂයේ දී මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් 3000 කට අධික ප්‍රමාණයක් පුනරුත්ථාපනයට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමට හා අවශ්‍ය පුනරුත්ථාපනය කිරීමට අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය උපදෙස් දී ඇත.

03. නිවාරණය.

3.1 විශේෂ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන දිස්ත්‍රික් මට්ටමෙන් පැවැත්වීම

“මතින් නිදහස් රටක්” යන තේමාව යටතේ ජාතික වැඩසටහන් 09 ක් දිස්ත්‍රික් මට්ටමින් සහ කළුතර දිස්ත්‍රික්කයේ පමණක් සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය කරමින් වැඩසටහන් පවත්වා ඇත.මෙම මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්වලදී මත්ද්‍රව්‍ය භාවිතයේ අනිසි ප්‍රතිඵල හා ඉන් වැළකීමෙන් අත්වන යහපත පිළිබඳව දැනුවත් කිරීම සිදු කරනු ලබයි.

පැවැත්වූ දිස්ත්‍රික්කය	දිනය	ප්‍රා.ලේ. කොට්ඨාස ගණන	ප්‍රා.ලේ කොට්ඨාස මට්ටමින් දැනුවත් වූ පිරිස	දිස්ත්‍රික් උත්සවයට සහභාගි වූ පිරිස (ආසන්න වශයෙන්)
1. ගම්පහ	2015.07.09	13	3,921	3,000
2. ගාල්ල	2015.09.18	19	5,618	1,500
3. කෑගල්ල	2015.11.16	11	3,324	1,000
4. කොළඹ	2016.01.19	13	3,918	1,500
5. කුරුණෑගල	2016.04.05	30	9,027	3,000
6. නුවරඑළිය	2016.06.26	5	1,516	1,500
7. පුත්තලම	2016.07.11	16	4,848	3,000
8. කුරුණෑගල (හිරියාල)	2016.08.31	02	2,120	5,000
9. යාපනය	2016.09.09	15	4,519	3,000
10. කළුතර	2016.12.	14 (ග්‍රාමීය කමිටු = 762)	5,230	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන්.
		138	**44,041**	**22,500**



ගම්පහ දිස්ත්‍රික් වැඩසටහන



පුත්තලම දිස්ත්‍රික් වැඩසටහන



යාපනය දිස්ත්‍රික් වැඩසටහන



කෑගල්ල දිස්ත්‍රික් වැඩසටහන



කුරුණෑගල දිස්ත්‍රික් වැඩසටහන

3.3 මානසික සංවර්ධන වැඩසටහන්

පුනරුත්ථාපනලාභීන් විවිධ මනෝ හා සමාජීය හේතූන් නිසා ඇති කර ගත් චර්යාවන්වලින් මුදා ගැනීම සඳහා මනෝප්‍රතිකාරමය වැඩසටහන් තුළින් ඔවුන් නිවැරදි චර්යා, අත්දැකීම් කරා යොමු කොට ඔවුන්තුළ පූර්ණ පෞරුෂ සංවර්ධනයක් ඇති කරලීම සඳහා කටයුතු කරනු ලබයි. ඒ අනුව, අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන්, උපදේශන වැඩසටහන් සහ මනෝ මූල ධර්ම වැඩසටහන් මූලික පුනරුත්ථාපන වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කරනු ලබයි. ඒ සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, ට්‍රස්ටීස් ආයතනය, බ්‍රහ්ම කුමාරි රාජයෝගා භාවනා මධ්‍යස්ථානය, ලංකා

සෙකෙයිකෙයුසෙයි පදනම් ආයතනය, මත්ද්‍රව්‍ය හා තොරතුරු මධ්‍යස්ථානය, අනුරාධපුර ධම්ම අනුරාධ විපස්සනා භාවනා මධ්‍යස්ථානය, මානසික සෞඛ්‍ය සභාව සහ මෙම කාර්යංශ උපදේශන මණ්ඩලය වෙතින් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ යටතේ පවත්වනු ලබන වැඩසටහන් පහත පරිදි වේ.

	වැඩසටහන	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූ සංඛ්‍යාව
1.	උපදේශන වැඩසටහන්	328	45343
2.	අධ්‍යාත්මික වැඩසටහන්	64	7484

3.4 මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු පිහිටුවීම හා අධීක්ෂණය

ප්‍රාදේශීය මට්ටමේ මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු ශක්තිමත් කිරීමේ අරමුණින් මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්යසාධන බළකාය මඟින් මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු පිහිටුවා ඒවා අධීක්ෂණය සිදු කරනු ලබයි.ඒ අනුව, මේ වනවිට

- ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 තුළම මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු පිහිටුවා ඇති අතර,
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 332 හිද මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු පිහිටුවීමට කටයුතු කර ඇත.
- එමෙන්ම 2017 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ සෑම ග්‍රාම නිලධාරී වසමක් තුළම මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු පිහිටුවීමට සැලසුම් කර ඇත.

3.5 රාජ්‍ය ආයතන තුළ මත්ද්‍රව්‍ය භාවිතය තුරන් කිරීම

“මතින් නිදහස් රටක් ” සංකල්පය යථාර්ථයක් බවට පත් කිරීමේදී රාජ්‍ය ආයතන තුළ මත්ද්‍රව්‍ය භාවිතය තුරන් කිරීම ප්‍රමුඛතම කාර්යයකි.මෙම අරමුණින් චක්‍රලේඛ ගණනාවක් නිකුත් කර අවශ්‍ය උපදෙස් හා දැනුවත් කිරීම් සිදු කර ඇත.

මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධව ජනාධිපති කාර්යාලය මඟින් නිකුත් කරන ලද චක්‍රලේඛ

	ශීර්ෂය	චක්‍රලේඛ අංකය	දිනය
1.	ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දින වැඩසටහන.	PS/DP/11/02	2015.05.20
2.	ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ මාසය ප්‍රකාශයට පත්කිරීම.	PS/DP - 01	2015.06.26
3.	රාජ්‍ය ආයතන තුළ මත්ද්‍රව්‍ය භාවිතය තුරන් කිරීම හා පාසල් තුළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ)	19/2015	2015.07.29
4.	ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනය හා මත්ද්‍රව්‍ය නිවාරණ මාසය ප්‍රකාශයට පත් කිරීම - 2016	PS/DSP/04/16	2016.05.20

3.6 මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ලද වෙනත් වැඩසටහන්.

1. "මතින් නිදහස්රටක්"පාගමන හා ජාතික සරුංගල් උත්සවය

මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්ය සාධන බළකාය විසින් 2016.08.28 රොටරි ආයතනය හා Kite Sri Lanka ආයතනය සමඟ එක්ව ජාතික සරුංගල් උත්සවය හා පාගමන පවත්වන ලදී.

2. මත්ද්‍රව්‍ය නිවාරකයන් ලෙස තරුණ තරුණියන් සමාජගතකිරීමේ වැඩසටහන

මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්යයසාධන බළකායේ පූර්ණ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා පොලීසිය හා අමරිදු සංසදය එක්ව දිවයින පුරා පොලිස් ස්ථාන කේන්ද්‍රකර ගනිමින් මත්ද්‍රව්‍ය නිවාරකයන් ලෙස තරුණ ප්‍රජාව සමාජගත කිරීමේ වැඩසටහන දියත් කර ඇත. ඒ අනුව, 2016.07.10 සිට 2016.09.27 දින දක්වා බොරැල්ල පොලිස් බල ප්‍රදේශයේ තරුණ තරුණියන් 100 දෙනෙකු පුහුණු කිරීමේ වැඩසටහන පවත්වන ලද අතර එම පළමු කණ්ඩායම විසිර යාමේ උත්සවය පොලිස්පතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි.

3. විශ්වවිද්‍යාල සිසුන් දැනුවත් කිරීමේ දිස්ත්‍රික් වැඩසටහන්

මත්ද්‍රව්‍ය භාවිතය තුළින් සිදුවන ඇබ්බැහිවීම හා එහි විපාක ස්වභාවයන් පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රවේශය ලත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 6,600ක් වැඩසටහන් මාලා 18ක් තුළින් දැනුවත් කිරීමේ කටයුතු සිදුකර ඇත.

4. තිරසාර පාසල් සංවර්ධන වැඩසටහන යටතේ සෑම පාසලකම මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු පිහිටුවීම.

3.7 මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්යසාධන බළකාය මඟින් බාහිර මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය ලබාදීම.

- සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 200 දෙනෙකු පුහුණු කිරීම - 2016.09.28
- මහවැලි කලාපීය තරුණ තරුණියන් 400 ක් මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ පුහුණු කිරීමේ නේවාසික වැඩමුළු මාලාව
- ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රජා ආයුර්වේද වෛද්‍යවරුන් දැනුවත් කිරීමේ වැඩමුළුව - 2016.11.17
- වයඹ කාර්මික විද්‍යාලයේ සිසුන් 300ක් මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව - 2016.11.22
- ප්‍රජා සංවිධාන සමඟ මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු
- සිවිල් ආරක්ෂක කමිටු හරහා ග්‍රාමීය මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු
- UNODC සමඟ තොරතුරු හා පුහුණු කටයුතු හුවමාරු කර ගැනීම

04. වකුගඩු රෝග නිවාරණ ජාතික වැඩසටහන

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දැනට බහුලව ව්‍යාප්තව ඇති මූලය හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගය තුරන් කිරීමටත්, එම රෝගය නිසා පීඩා විඳින රෝගීන් ඇතුළු පවුල්වල සාමාජිකයන් සඳහා පවතින විවිධ ගැටලු ගණනාවක් විසඳීමටත් වකුගඩු රෝග නිවාරණ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

2016 වසරේ මැයි මස මූලය හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගය නිවාරණය සඳහා වූ ජාතික සැලැස්ම (2016-2018) එළිදක්වන ලදී. එම සැලැස්ම සඳහා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ඇතුළු අනෙකුත් පාර්ශ්වකාරී අමාත්‍යාංශද, පෞද්ගලික අංශයේ විවිධ ආයතනද, වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්යය සාධන බලකාය විසින් සිදුකරනු ලබන වැඩසටහන් රාශියක්ද ඇතුළත් කර ඇත.



මූලය හඳුනා නොගත් වකුගඩු රෝගය නිවාරණය සඳහා ජාතික සැලැස්මේ කෙටුම්පත (2016 - 2018) ගරු ජනාධිපතිතුමා වෙත 2016.05.30 දින ඉදිරිපත් කිරීම.

ජාතික සැලැස්ම පදනම් කර ගනිමින් වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්යය සාධන බලකාය විසින් වකුගඩු රෝග නිවාරණය සඳහා 2016 වසර තුළදී ක්‍රියාත්මක කරන ලද සුවිශේෂී වැඩසටහන් පහතින් විස්තර කර ඇත.

4.1. වකුගඩු රෝග නිවාරණය වෙනුවෙන් ජාතික වැඩසටහන් පැවැත්වීම

වකුගඩු රෝගය පවත්නා දිස්ත්‍රික්කයන් ප්‍රමුඛත්වය මත හඳුනාගෙන ඒ ඒ දිස්ත්‍රික්කවල විශේෂ ගැටලු සඳහා අවශ්‍ය කටයුතු සලසමින් ජාතික වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. 2016 වසරේ ජාතික වැඩසටහන් 03ක් පැවැත්වූ අතර එයට සමගාමීව ප්‍රාදේශීය මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, රෝගීන් පෙර හඳුනාගැනීමේ සායන පැවැත්වීම, රෝගී පවුල් සඳහා සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පිරිසිදු පානීය ජල අවශ්‍යතා සැපයීම වැනි විශේෂ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී.

වගුව 4.1. 2016 වසරේ පවත්වන ලද ප්‍රධාන ජාතික වැඩසටහන්

දිස්ත්‍රික්කය	පැවැත්වූ දිනය	පැවැත්වූ ස්ථානය
අනුරාධපුර	2016.03.10	මැදවච්චිය මෛත්‍රීපාල සේනානායක විද්‍යාලය
වවුනියාව	2016.06.12	වවුනියාව, බෝගස්වැව විද්‍යාලය
බදුල්ල	2016.06.29	ගිරාඳුරුකෝට්ටේ මහවැලි ක්‍රීඩාංගනය









අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය මෛත්‍රීපාල සේනානායක විද්‍යාලයේ පැවති ලෝක වකුගඩු දිනය සැමරීමේ ජාතික උත්සවය (2016.03.10)









වවුනියාව දිස්ත්‍රික්කයේ බෝගස්වැව විද්‍යාලයේ පැවති ජාතික උත්සවය (2016.06.12)





බදුල්ල දිස්ත්‍රික්කයේ ගිරාඳුරුකෝට්ටේ මහවැලි ක්‍රීඩාංගනයේ පැවති ජාතික උත්සවය (2016.06.29)

4.2. දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

අදාළ අමාත්‍යාංශ ඇතුලු අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ ඒකාබද්ධ වී ජනතාවට මෙන්ම පාසල් සිසුන්ද දැනුවත් කිරීමේ වැඩසටහන් විවිධ මාධ්‍ය ඔස්සේ පවත්වනු ලැබේ. එමඟින්, වසවිස නැති ආහාර පාරිභෝජනය, පිරිසිදු ජලය පානය, ක්‍රමවත් ශාරීරික ව්‍යායාම, වර්යා රටා පිළිබඳව සහ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් යනාදී කරුණු පිළිබඳව දැනුවත් කෙරේ. අත්පත්‍රිකා, පෝස්ටර්, සඟරා, බැනර්, වීඩියෝ පට හා වාර්තාමය වැඩසටහන් දැනුවත් කිරීමේ ක්‍රමවේදයන් ලෙස අනුගමනය කෙරේ.

වගුව 4.2. දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම - 2016

දිස්ත්‍රික්කය	ප්‍රදේශය	දැනුවත් කළ පුද්ගලයින් සංඛ්‍යාව
අනුරාධපුරය	මැදවච්චිය/ හොරොව්පතාන	3,500
වවුනියාව	බෝගස්වැව	3,400
බදුල්ල	ගිරාඳුරුකෝට්ටේ	40,000
කුරුණෑගල	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 10 ක	18,000
පොළොන්නරුව	මැදිරිගිරිය/ කළුකැලේ	1,450
රත්නපුර	ඇහැලියගොඩ	400
මොණරාගල	කොටවෙහෙරමංකඩ- රතඹලාගම- හම්බෙගමුව	5,400
අම්පාර	අම්පාර නගරය	3,500
කොළඹ	අවිස්සාවේල්ල සහ ජනාධිපති ලේකම් කාර්යාලය	3,400

මීට අමතරව පහත සඳහන් විශේෂ ක්‍රියාකාරකම්ද සිදු කරන ලදී.

- පාසල් පාදක කරගත් නිර්මාණාත්මක තරඟාවලි මඟින් පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. (කෙටි කතා, පද්‍ය රචනා, චිත්‍ර, දැනුම මිනුම තරඟ හා කෙටි නාට්‍ය)

- අභ්‍යාස පොත් මුද්‍රණකරුවන් සමඟ සාකච්ඡා කර පාසල් පොත් සඳහා දැනුවත් කිරීමේ පණිවුඩයක් ඇතුළත් කිරීම සඳහා කටයුතු කිරීම. මේ සඳහා සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශයේ සහයෝගයද ලබාගන්නා ලදී.

- වකුගඩු රෝගී පවුල්වල සමාජ සහ ආර්ථික පසුබිම නගාසිටුවීම සඳහා උපදේශන කටයුතු සිදුකිරීම වෙනුවෙන් දිස්ත්‍රික් 11ක ක්ෂේත්‍ර නිලධාරීන් 400ක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් 2016.10.06 වන දින පැවැත්වීම.






2016 වසරේ විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

4.3. වකුගඩු රෝගීන් පෙර හඳුනාගැනීමේ කටයුතු

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ සහාය ඇතිව අවදානම් දිස්ත්‍රික්කවල පුද්ගලයන් පරීක්ෂා කිරීම තුළින් රෝගීන් පෙර හඳුනාගනු ලැබේ. 2016 වසර තුළ ජනාධිපති කාර්යය සාධන බලකායේ මැදිහත් වීම තුළින් පෙර හඳුනාගැනීමේ කටයුතු සිදුකරන ලදී.

වගුව 4.3. 2016 වසර තුළ ජනාධිපති කාර්යය සාධන බලකායේ මැදිහත්වීම තුළින් සිදු කරන ලද පෙර හඳුනාගැනීමේ පරීක්ෂා සඳහා යොමු කළ පුද්ගලයින් සංඛ්‍යාව

දිස්ත්‍රික්කය/ ප්‍රදේශය	පරීක්ෂා කළ සංඛ්‍යාව
අනුරාධපුරය - මැදවච්චිය/ හොරොව්පතාන	2,000
බදුල්ල - මහියංගනය/ රිදීමාලියද්ද	28,000
වව්නියාව - බෝගස්වැව	1,000
බලංගොඩ - කොටවෙහෙරමංකඩ	1,500
හම්බන්තොට - ලුණුගම්වෙහෙර	2,100
පොළොන්නරුව - දිඹුලාගල/ කළුකැලේ	2,000
කුරුණෑගල - වාරියපොල	1,500

මීට අමතරව 2016 වසරේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ සායන තුළින් අවදානම් ප්‍රදේශවල මහජනතාව ලක්ෂ 03 ක් පමණ පූර්ව රෝග පරීක්ෂාවට ලක්කර ඇති අතර 2017 වර්ෂයේ ලක්ෂ 05 කට අධික ජනතාවක් පරීක්ෂා කිරීමට අපේක්ෂිතය.






2016 වසරේ රෝගීන් පෙර හඳුනාගැනීමේ කටයුතු සිදුකිරීම

4.4. පිරිසිදු පානීය ජලය ලබාදීම

මෙම රෝගයට ගොදුරු වී ඇති ජනතාව සඳහා පිරිසිදු පානීය ජලය සැපයීම තුළින් මෙම රෝගයෙන් යම් තරමකට මුදවාගත හැකි බව ලෝක සෞඛ්‍ය සංවිධානයද නිර්දේශ කර ඇත. එබැවින්, රෝගයට පිළියම් සෙවීමේ එක් ක්‍රියාමාර්ගයක් ලෙස පිරිසිදු පානීය ජලය සම්පාදනය කරනු ලැබේ. මෙම කාර්යභාරයේ දී නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා නාවික හමුදාව, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ඇතුලු අනෙකුත් පාර්ශ්වකාරී ආයතන, සේවා දිගු මඟින් ජලය සැපයීම, ප්‍රතිඅාශ්‍රැත ජල පෙරණ මඟින් ජල සම්පාදනය, බවුසර් මඟින් ජලය සැපයීම, වැසි ජල ටැංකි ඉදිකිරීම වැනි විවිධ කටයුතු සිදුකරයි. විශේෂයෙන්ම පිරිසිදු පානීය ජල සම්පාදනයේදී පෞද්ගලික දානපතීන්ගෙන්ද නොමඳ සහයක් ලැබිණි. ගාලුමුවදොර හෝටලය, ඊ.ඒ.පී. මාධ්‍ය ජාලය, සියරා ඉදිකිරීම් ආයතනය, ඇමරේෂන් ඉන්ටර්නැෂනල් හා ශාන්ති පදනම ඇතුළු පෞද්ගලික අංශයේ ආයතන රාශියක් මේ අතර වේ.





අවදානම් දිස්ත්‍රික්කයන් සඳහා පිරිසිදු පානීය ජල සම්පාදනය

වගුව 4.4. ප්‍රතිඅාශ්‍රැතිකරණ ජල පද්ධති ඉදිකිරීම - 2016

- ප්‍රතිඅාශ්‍රැතිකරණ ජල පද්ධති ඉදිකිරීම සඳහා ජනාධිපති කාර්යාලයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත රු.මී. 167 ක් නිදහස් කර ඇත. එහි මූල්‍ය ප්‍රගතිය 85% ක් වන අතර ප්‍රතිඅාශ්‍රැතිකරණ ජල පද්ධති (Ro Plant) 85 ක වැඩකටයුතු නිමකර ඇත.

මූල්‍ය ප්‍රතිපාදන	ප්‍රජා මූල ඉදිකිරීම්	පාසල් පාදක ඉදිකිරීම්	එකතුව	වටිනාකම රුපියල් මිලියන	ප්‍රතිලාභීන්
2016 අය වැය ප්‍රතිපාදන	85	31	116	165.4	204,460
දානපතීන්ගේ ආධාර	17	40	57	44.7	46,950
එකතුව	**102**	**71**	**173**	**210.1**	**251,410**

වගුව 4.5. ගෘහස්ථ ජල පෙරණ උපකරණ ලබාදීම

දිස්ත්‍රික්කය	ජල පෙරණ සංඛ්‍යාව	වටිනාකම රුපියල්	ප්‍රතිලාභීන්
අනුරාධපුරය	200	777,000	995
වවුනියාව	115	440,250	560
බදුල්ල	343	1,369,795	1,618
කුරුණෑගල	177	712,425	842
එකතුව	**835**	**3,299,470**	**4,015**

වගුව 4.6. වැසි ජල ටැංකි හා අනෙකුත් ජල සම්පාදන ව්‍යාපෘති

දිස්ත්‍රික්කය	ව්‍යාපෘතිය	මූල්‍ය දායකත්වය රු.	ප්‍රතිලාභීන්
අනුරාධපුරය	වැසි ජල ටැංකි 85ක් ලබාදීම (උතුරු මැද පළාත් සභාවේ හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ)	4,124,370.00	425
අම්පාර	සමන්බැද්ද හා අරුණපුර සඳහා නල ජල මාර්ග දීර්ඝ කිරීම	1,277,148.25	2,800
මාතලේ	විල්ගමුව, දේවගිරි ගම්මානය සඳහා ජලය සැපයීම	1,409,039.00	1,200
මොනරාගල	කොටවෙහෙර මංකඩ මහා විද්‍යාලය සඳහා ළිඳක් ඉදිකර ජලය සැපයීම	561,591.00	2,555
හම්බන්තොට	බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැසි ජල රැස්කිරීමේ ටැංකි 20 ක් ලබාදීම	840,000.00	100





වැසි ජල ටැංකි සහ ගෘහස්ථ ජල පෙරණ උපකරණ ලබාදීම - අනුරාධපුරය

4.5. සෞඛ්‍ය අංශයේ වෙනත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

වකුගඩු රෝගීන්ගේ ප්‍රතිකාර කටයුතු මනා කාර්යක්ෂම අයුරින් ඉටුකර ගැනීම සඳහා රෝහල්වල අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා අවශ්‍ය උපකරණ ලබාදීම මේ යටතේ සිදුකෙරේ.

➢ වකුගඩු රෝගීන් හා ඔවුන්ගේ භාරකරුවන්ට නවාතැන් පහසුකම් ලබාගැනීම සඳහා නේවාසිකාගාර ඉදිකිරීම.

- අනුරාධපුර මහ රෝහලේ වකුගඩු රෝගී නේවාසිකාගාර සහ රුධිර කාන්දුකරණ මධ්‍යස්ථානය ඉදිකිරීම - ඇස්තමේන්තුගත පිරිවැය රු.මි.284 කි.
  (ශ්‍රම දායකත්වය යුද්ධ හමුදාව සපයන බැවින් සැබෑ වියදම රු. මි. 141ක් වන අතර මෙහිදී රජයට රු.මි.143ක් ඉතිරි වේ.)

- මහනුවර මහ රෝහලේ වකුගඩු රෝගී නේවාසිකාගාර සහ රුධිර කාන්දුකරණ මධ්‍යස්ථානය ඉදිකිරීම - ඇස්තමේන්තුගත පිරිවැය රු.මි.382 කි.
  (ශ්‍රම දායකත්වය යුද්ධ හමුදාව සපයන බැවින් සැබෑ වියදම රු. මි. 217ක් වන අතර මෙහිදී රජයට රු.මි.165 ක් ඉතිරි වේ.)
- ගිරාඳුරුකෝට්ටේ රෝගී සහන සත්කාර ඒකකය ඉදිකිරීම - ඇස්තමේන්තුගත රු.මි.40

➢ මාලිගාවත්ත මහ රෝහලේ නවීකරණ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

➢ චීන ආධාර යටතේ පොළොන්නරුව වකුගඩු රෝහල ඉදිකිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
(මේ සඳහා රු.මි. 2963ක මුදලක් චීන රජය විසින් වෙන් කර ඇත.)

යෝජිත නේවාසිකාගාර සංකීර්ණය - අනුරාධපුරය





යෝජිත නේවාසිකාගාර සංකීර්ණය - මහනුවර

4.6. ජාතික වකුගඩු අරමුදල ශක්තිමත් කිරීම

නීරෝගා ලොතරැයිය, විවිධ ආයතන හා දානපතීන්ගේ ආධාර මත ගොඩනංවා ඇති ජාතික වකුගඩු අරමුදල මගින්ද සුභසාධනය සඳහා මුදල් යොදවයි. රු.ලක්ෂ දෙකකින් ආරම්භ කෙරුණු ජාතික වකුගඩු අරමුදල මේ වනවිට රු.මි. 490 ඉක්මවූ අරමුදලක් බවට පත්කර ඇත. එමඟින්, වකුගඩු රෝගී පවුල්වල දරුවන් සඳහා ජනාධිපති ශිෂ්‍යත්ව ප්‍රදානය, රෝහල් නේවාසිකාගාර සංකීර්ණ ඉදිකිරීම, රුධිර කාන්දුකරණ මධ්‍යස්ථාන ඉදිකිරීම හා වෙනත් සුබසාධන කටයුතු සඳහා අරමුදල් යොදවනු ලැබේ.

- **රෝගීන් හා ඔවුන්ගේ පවුල් සඳහා සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

නිදන්ගත වකුගඩු රෝගීන් සිටින පවුල්වල සමාජ හා ආර්ථික තත්ත්වය ඉමහත් පසුබෑමට ලක්වී ඇත. විශේෂයෙන්ම පවුලේ ගෘහ මූලිකයා අසනීප වීම නිසා ප්‍රධාන ජීවනෝපාය මාර්ග අවහිර වේ. මෙවැනි පවුල් නගා සිටුවීම සඳහා වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්යය සාධන බලකාය සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය හා ඒකාබද්ධව වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

- **ජනාධිපති අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රදානය - 2016**

වකුගඩු රෝගයෙන් දෙමාපියන් අහිමිවූ අ.පොෂ.ස (උ/පෙළ) හදාරණ සිසු සිසුවියන් සඳහා මාසික ශිෂ්‍යත්ව ප්‍රදානයන් සිදුකරනු ලැබ්. ඒ අනුව අනුරාධපුර, වවුනියාව හා බදුල්ල දිස්ත්‍රික්කවල සිසුන් 111 දෙනෙකුට ශිෂ්‍යත්ව ප්‍රදානය කර ඇත. 2017 වසරේදී වකුගඩු රෝගය පවතින දිස්ත්‍රික්කයන්හි ශිෂ්‍යයන් 128 දෙනෙකු සඳහා මෙම ශිෂ්‍යත්ව ප්‍රදානය සිදුකෙරෙමින් පවතින අතර ශිෂ්‍යත්ව මුදල් 2017 වර්ෂයේ සිට රු.3000.00 දක්වා ඉහළ නංවා ඇත.

වගුව 4.8. අ.පොෂ.ස (උ/පෙළ) හදාරණ සිසු සිසුවියන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය (2016 වර්ෂය)
(මාසවල අගයන් ආසන්න 000’)

දිස්ත්‍රික්කය	සිසුන් සංඛ්‍යාව	මාර්තු	අප්‍රේ.	මැයි	ජූනි	ජූලි	අගෝ.	සැප්.	ඔක්.	නොවැ.	දෙසැ.	එකතුව
අනුරාධපුරය	64	64	64	64	64	64	64	52	52	52	52	592
වවුනියාව	14					14	14	9	9	9	9	64
බදුල්ල	33					33	33	24	24	24	24	162
එකතුව	**111**	**64**	**64**	**64**	**64**	**111**	**111**	**85**	**85**	**85**	**85**	**818**

- **වකුගඩු රෝගීන් සඳහා මාසික දීමනාවක් ලබාදීම.**

සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය මඟින් මූලය අවිනිශ්චිත වකුගඩු රෝගය පැතිරී ඇතැයි තීරණය කර ඇති දිස්ත්‍රික්ක වල වකුගඩු රෝගීන් වෙනුවෙන් රු.3,000 ක දීමනාවක් ලබා දීම සිදු කරන අතර දැනට දිස්ත්‍රික්ක 11ක ක්‍රියාත්මක අතර එම මුදල රු.5,000ක් දක්වා වැඩි කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කෙරෙමින් පවතී. මේ යටතේ ප්‍රදේශ 81ක රෝගීන් 29,000 කට පමණ මූල්‍යාධාර ලබා දීමට අනුමැතිය ලැබී ඇත.

- **නිවාස ලබාදීම, අළුත්වැඩියා කිරීම සහ සෞඛ්‍ය ආරක්ෂිත කාමර ඉදිකිරීම.**

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය සහ වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකාය එක්ව නිවාස නොමැති අඩු ආදායම්ලාභී වකුගඩු රෝගී පවුල් සඳහා නිවාස ලබා දීමට කැබිනට් සංදේශයක් ඉදිරිපත් කළ අතර ඒ සඳහා අනුමැතිය ලැබී ඇත. එමඟින් නිවාස නොමැති අඩු ආදායම්ලාභී වකුගඩු රෝගී පවුල් වෙනුවෙන් නිවාස ඉදිකිරීම සඳහා රු ලක්ෂ 05ක් හා නිවාස අළුත්වැඩියාව වෙනුවෙන් ලක්ෂ 02 ක් බැගින් ලබා දීම සිදුවේ.

වගුව 4.9. නිවාස ලබාදීම, අලුත්වැඩියා කිරීම සහ සෞඛ්‍ය ආරක්ෂිත කාමර ඉදිකිරීම - 2016

දිස්ත්‍රික්කය	ව්‍යාපෘතිය	ආයෝජනය රු.	මූල්‍ය දායකත්වය
අනුරාධපුරය	මැදවච්චිය ප්‍රදේශයේ රෝගී පවුල් 10ක් සඳහා නිවාස ඉදිකිරීම	3,940,000.00	ජනාධිපති කාර්යය සාධන බලකාය හා දානපති ආයතන මඟින්
බදුල්ල	රෝගී පවුල් 7ක් සඳහා නිවසේ සිට ක්‍රියාත්මක කරනු ලබන රුධිර කාන්දුකරණ ක්‍රියාවලිය සඳහා සෞඛ්‍යාරක්ෂිත කාමර ඉදිකිරීම	630,000.00	නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ මූල්‍ය දායකත්වය යටතේ









වකුගඩු රෝගී පවුල් සඳහා නිවාස ආධාර සහ ශිෂ්‍යත්ව ප්‍රදානය

4.7. පර්යේෂණ කටයුතු සිදුකිරීම

නිදන්ගත වකුගඩු රෝගයට හේතුකාරක විද්‍යානුකූලව තහවුරු කර ගැනීම සඳහාත් ඒවාට අදාළ ප්‍රතිකාර ක්‍රම හා අනෙකුත් සේවාවන් වැඩිදියුණු කරගැනීම සඳහාත් වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්යය සාධන බලකාය වෙනත් පාර්ශවකාරී ආයතන සමඟ එක්ව දේශීය හා විදේශීය විශේෂඥ දැනුම හුවමාරු කරගනිමින් පර්යේෂණ හා සමීක්ෂණ සිදුකිරීමට අවශ්‍ය සහාය දෙනු ලැබේ.

වගුව 4.10. පර්යේෂණ කටයුතු සඳහා මැදිහත්වීම

දිනය	වැඩමුළුව	කාරණය සහ ප්‍රතිඵල
2016.03.15	චීන විශේෂඥ දැනුම හුවමාරු කර ගැනීමේ වැඩමුළුව	පේරාදෙණිය විශ්වවිද්‍යාලය සඳහා නවීන තාක්ෂණයෙන් යුත් රසායනාගාරයක් ඉදිකිරීම
2016.04.04-08	නෙදර්ලන්ත ජල විශේෂඥ වැඩමුළුව (ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ නියෝජිතයින් සමඟ)	ආසාදිත ප්‍රදේශවල ජල මූලාශ්‍ර බලා ඒ පිළිබඳ වාර්තාවක් හා නිර්දේශ ඉදිරිපත් කිරීම
2016.04.26-28	ලෝක සෞඛ්‍ය සංවිධානයේ වැඩමුළුව	නිදන්ගත වකුගඩු රෝග නිවාරණය සඳහා මාර්ගෝපදේශ හා නිර්දේශ ලබා ගැනීම
2016.07.03	රුධිර කාන්දුකරණය පිළිබඳ හෙදියන් පුහුණු කිරීමේ වැඩසටහන	රුධිර කාන්දුකරණය පිළිබඳව හෙදියන් මැලේසියාවේදී පුහුණු කිරීමට අවශ්‍ය සහාය ලබාදීම
2016.09.30	ඉන්ද්‍රියන් බද්ධ කිරීම හා ඉන්ද්‍රියන් පරිත්‍යාගය පිළිබඳව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා වැඩමුළුව	ඉන්ද්‍රියන් බද්ධකිරීම හා ඉන්ද්‍රියන් පරිත්‍යාගය පිළිබඳව දැනුවත් කිරීම
2016.09.30	වකුගඩු රෝගයේ සමාජ ආර්ථික බලපෑම පිළිබඳ වැඩමුළුව	සමාජ සේවා නිලධාරීන් 400ක් දැනුවත් කිරීම
2016.10.09-11	ලෝක සෞඛ්‍ය සමුළුව	බර්ලින් නුවර පැවැත්වූ සමුළුවට සහභාගී වීම





පර්යේෂණ කටයුතු විධිමත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම

5. "දරුවන් සුරකිමු" ජාතික වැඩසටහන

සමාජීය වශයෙන් ළමුන්ට මුහුණ දීමට ඇති ගැටලු හා ප්‍රශ්න අවම කරමින් ඔවුන්ගේ සුරක්ෂිතතාව, මූලික අයිතිවාසිකම් හා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා "දරුවන් සුරකිමු" ජාතික වැඩසටහන 2017 – 2019 සැළසුම් කර ඇත.

මෙම ජාතික වැඩසටහනට අදාල සැළැස්ම සකස් කිරීමේදී අදාල අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා ආයතන සහභාගිත්වයෙන් පවත්වන ලද සාකච්ඡා වට ගණනාවකින් අනතුරුව දැනට ක්‍රියාත්මක වන කටයුතු වලට අමතරව තවදුරටත් දරුවන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීමට අවශ්‍ය විශේෂ කරුණු සැලකිල්ලට ගන්නා ලදී.

වගුව 5.1 " දරුවන් සුරකිමු " ජාතික සැළැස්ම සකස් කිරීම සඳහා පාර්ශවකාරී ආයතන සමඟ පවත්වන ලද ප්‍රධාන සාකච්ඡා

දිනය	සාකච්ඡාකල කරුණු
2016.01.07	අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් දරුවන් සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටලු සහ දරුවන් සුරැකීම පිළිබඳව පාර්ශවකාරී ආයතන සමඟ පැවැත්වූ මූලික සාකච්ඡාව.
2016.03.18	රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අදාල ආයතන වල නිලධාරීන් සමඟ ජාතික සැලැස්ම කෙටුම්පත් කිරීමේ විශේෂ සාකච්ඡාව.
2016.04.07	පළාත්සභා නිලධාරීන් සමඟ ජාතික සැලැස්ම කෙටුම්පත් කිරීමේ විශේෂ සාකච්ඡාව.
2016.05.24	අතිගරු ජනාධිපතිතුමා වෙත සැලැස්මේ කෙටුම්පත ඉදිරිපත් කිරීම.
2016.10.13	දරුවන්ගේ ළමා පෞරුෂ සංවර්ධනය පිළිබඳ මනෝ වෛද්‍ය විශේෂඥවරුන් සමඟ සාකච්ඡාවක් පැවැත්වීම.
2016.11.03	යහපත් සමාජීය ප්‍රතිනිර්මාණයක් උදෙසා ළමා වියෙහි මානසික සංවර්ධනය හා දරුවන් හදාවඩා ගන්නා ක්‍රමවේද පිළිබඳ දේශනයක් පැවැත්වීම.
2016.11.17	"දරුවන් සුරකිමු" ජාතික වැඩසටහන 2017 – 2019 ක්‍රියාත්මක කිරීම පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා සමඟ විශේෂ සාකච්ඡාව.

ගෘහස්ථ හිංසනය, ලිංගික අපයෝජනය, පෝෂණ හා සෞඛ්‍යමය ගැටලු, මත්ද්‍රව්‍ය වලට හා විවිධ අපරාධවලට යොමුවීම, පරිවාස ගතවීම, පවුල් ප්‍රශ්න නිසා අසරණභාවයට පත්වීම හා ආබාධිත තත්ත්වයන් වැනි ගැටලු නිසා ලංකාවේ ළමා පරපුර අත් විඳින පීඩාවන් වැලැක්වීමට මෙම වැඩසටහනේ විශේෂ අවධානය යොමුකර ඇත. ඒ අනුව "දරුවන් සුරකිමු" ජාතික වැඩසටහන 2017 – 2019 ප්‍රධාන ක්ෂේත්‍ර 03 ක් යටතේ සුවිශේෂී ක්‍රියාකාරකම් රැසක් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

- අපයෝජනය / අපහරණය වැලැක්වීම හා ළමා ආරක්ෂාව තහවුරු කිරීම
- සෞඛ්‍ය, පෝෂණ හා සුභසාධනය
- පෞරුෂ සංවර්ධනය, අධ්‍යාපනය සහ ජීවන කුසලතා



“දරුවන් සුරකිමු” ජාතික වැඩසටහන යටතේ 2016.11.17 දින පැවැත්වූ විශේෂ රැස්වීම

මනා පෞරුෂයකින් යුතු දරුවෙකු සමාජයට දායාද කිරීම

වර්තමානය වන විට නූතන මනෝවිද්‍යාත්මක සංකල්ප භාවිතයෙන් වර්තමාන දරු පරපුර බලගන්වා වඩා යහපත් පුරවැසියන් අනාගතයට දායාද කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයන් සැකසීමට ජනාධිපති කාර්යාලය මැදිහත් වී කටයුතු කරයි. යහපත් සමාජීය ප්‍රතිනිර්මාණයක් උදෙසා ළමා වියෙහි මානසික සංවර්ධනය, දරුවන් හදාවඩා ගන්නා ක්‍රමවේද, දරුවන් පිළිබඳ රට තුළ ඇති සංකල්ප ක්‍රමානුකූලව, විධිමත්ව සහ විද්‍යානුකූලව වර්ධනය කිරීම ඉතා වැදගත් වන අතර, ළමා වියෙහි දී දූලක ආතතිය ඇති වීම වළක්වා ගැනීමද සිදු කළ යුතු අතර ඒ තුලින් ගුණාත්මකභාවයෙන් ඉහළ පෞරුෂයන්ගෙන් හෙබි ඵලදායී, ගුණගරුක, නීතිගරුක සහ යහපත් පුරවැසියන් නිර්මාණය කර ගැනීමට අවකාශය සැලසෙනු ඇත. නූතන මනෝ විද්‍යාව තුලින් අනාවරණය කරගෙන ඇත්තේ ළදරු වියෙහි අත්විඳීමට සිදු වන අහිතකර බලපෑම් (ACEs – Adverse Childhood Experiences) පුද්ගල ආකල්ප හා කුසලතා වර්ධනය කෙරෙහි අහිතකර ආකාරයට බලපාන බවයි. එහිදී ප්‍රධාන කරුණු දහයක් මනෝ වෛද්‍යවරුන් අනාවරණය කරගෙන ඇති අතර දරුවන් ළදරු වියේදී අත්විඳීමට සිදුවන අහිතකර බලපෑම්වලට නිරාවරණය වීම හැකිතාක් දුරට අවම කිරීමට සමාජය දැනුවත් කිරීම අත්‍යවශ්‍ය කරුණක් වන අතර එතුළින් වඩා යහපත් පුරවැසියන් අනාගතයට දායාද කිරීම සිදු කළ හැක. මේ සඳහා රජය මැදිහත් විය යුතු අවස්ථා හඳුනාගෙන ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමද අපේක්ෂා කරන අතර ඒ සඳහා ජනාධිපති කාර්යාලය මූලිකත්වය ගෙන කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ.

6. තිරසර පාසල් වැඩසටහන

ශ්‍රී ලාංකික සිසු පරපුර දැනුම, කුසලතා හා ආකල්පවලින් සපිරි නිර්මාණශීලී දරු පරපුරක් ලෙස බලගැන්වීම උදෙසා තිරසර පාසල් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදී. මෙහිදී පළමු අදියර ලෙස උසස් පෙළ සහිත සියළුම පාසල් සහ තෝරාගත් වෙනත් පාසල්ද ඇතුළුව පාසල් 3409 ක වැඩසටහන් ආරම්භ කරන ලදී. අතිගරු ජනාධිපතිතුමාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන **ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන, පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන, මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන, වකුගඩු රෝග නිවාරණ ජාතික වැඩසටහන** සහ**"දරුවන් සුරකිමු" ජාතික වැඩසටහන** යන ප්‍රධාන ජාතික වැඩසටහන් 05 ඒකාබද්ධ කොට මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

"සොඳුරු ළමා ලොවක්-තිරසර හෙටක්"යන තේමාව ඔස්සේ පාසල් දරුවන් අවදානම් චර්යාවලින් වළක්වාගනිමින් වැඩ ලෝකයට හා සමාජයට හුරු කිරීමටත්, ඔවුන් සමාජ විපර්යාකාරකයන් ලෙස බලගැන්වීමත් මෙමඟින් අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහනට අදාලව 2016 වසරේ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරන ලදී.

- අනෙකුත් සියලු අංශ ඇතුලු අමාත්‍යාංශ සමඟ 2016.11.30 දින අදාළ ආයතන සමඟ ද මෙම වැඩසටහන පිළිබඳව මූලික සාකච්ඡාව පැවැත්වීම
- තිරසර පාසල් වැඩසටහන සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහය සැකසීම
- තිරසර පාසල් වැඩසටහන යටතේ තෝරාගත් පාසල්හි විදුහල්පතිවරුන් පළාත් මට්ටමින් දැනුවත් කිරීම
- තිරසර පාසල් වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගත් පාසල්වලට යෙදවුම් මිළ දී ගැනීම සඳහා පළමු අදියරේදී එක් පාසලකට රුපියල් මිලියන 141 ක මුදලක් රු. 50,000/- ක් බැගින් ලබා දීම
- තිරසර පාසල් වැඩසටහනේ සමාරම්භක උත්සවය 2017.01.19 දින දිගන කෙන්ගල්ල මහා විද්‍යාලයේදී පැවැත්වීම සඳහා වන මූලික සාකච්ඡා හා සංවිධාන







7. දරිද්‍රතාවය පිටුදැකීම පිළිබඳ ජාතික වැඩසටහන

නිදහසින් පසු ශ්‍රී ලංකාවේ මේ දක්වා ක්‍රියාත්මක වූ දිළිඳුකම තුරන් කිරීමේ වැඩසටහන් වල ධනාත්මක අංග රැසක් පැවති අතර දුර්වලතාද බොහෝ විය. ඒවායේ ධනාත්මක අංග උකහා ගනිමින් හා තව දුරටත් වර්ධනය කරමින්, ඉදිරි වර්ෂ 14 තුළදී දිළිඳුකම තුරන්කිරීමට හා ගෝලීය තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට, අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිඳුන්, 2016.08.29 වන දින අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කරමින් “ 2017 - දිළිඳුකමින් නිදහස් කිරීමේ වර්ෂය ” ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

එම අරමුණු ඉටුකර ගැනීම සඳහා සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය විසින් 2016 වසරේ පහත සඳහන් ක්‍රියාමාර්ග ඉටුකරන ලදී.

- අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2016.11.25 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කමිටු ශාලා අංක 01 හි ප්‍රථම සාකච්ඡාව පවත්වන ලදී. මේ සඳහා ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා, ගරු කැබිනට් අමාත්‍යවරු, ගරු ආණ්ඩුකාරවරු, ගරු පළාත් ප්‍රධාන අමාත්‍යවරු, ජනාධිපති ලේකම්තුමා, අග්‍රාමාත්‍ය ලේකම්තුමා, මහ බැංකු අධිපතිතුමා, බැංකු ප්‍රධානීන්, අමාත්‍යාංශ ලේකම්වරු, පළාත් ප්‍රධාන ලේකම්වරු ඇතුළු රාජ්‍ය නිලධාරීන් රැසක් සහභාගී විය. මෙහිදී දරිද්‍රතාවය පිටුදැකීමේ නව වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමට හා ඉදිරි කටයුතු සැළසුම් කිරීම සඳහා ගරු ආචාර්ය සරත් අමුණුගම මැතිතුමාගේ සභාපතිත්වයෙන් සැදුම්ලත් ප්‍රධාන මෙහෙයුම් කමිටුවක් පත් කරන ලදී.





අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2016.11.25 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පැවති සාකච්ඡාව

- පුවත්පත් දැන්වීම් පල කිරීම තුළින් දරිද්‍රතාවය පිටුදැකීම පිළිබඳ මහජනතාවගේ අදහස් ලබා ගන්නා ලදී.

- අමාත්‍යාංශ සහ අනෙකුත් රාජ්‍ය ආයතන විසින් 2017 වර්ෂයේදී, දරිද්‍රතාවය පිටුදැකීම සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විශේෂ වැඩසටහන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම.

- ගරු ආචාර්ය සරත් අමුණුගම මැතිතුමාගේ (කමිටු සභාපති) ප්‍රධානත්වයෙන් 2016.12.20 වන දින සාකච්ඡාවක් පැවැත්වීම සහ සියලු පාර්ශ්වකාරී ආයතන සහ පුද්ගලයින්ගේ අදහස් ඒකාබද්ධ කරමින් දරිද්‍රතාවය පිටු දැකීම පිළිබඳ කෙටුම්පත සැකසීම.

- අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2016.12.22 වන දින ජනාධිපති කාර්යාලයේදී දෙවන සාකච්ඡාව පවත්වන ලදී.





අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2016.12.22 වන දින ජනාධිපති කාර්යාලයේදී පැවති සාකච්ඡාව.

8. ආගමික කටයුතු

ඒකීය දේශයක් තුළ ආගමික සහජීවනය ඇති කරවනු වස් ජනාධිපති කාර්යාලයේ සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය යටතේ **"ආගමික කටයුතු ඒකකය"** ස්ථාපිත කර ඇත. අතිගරු ජනාධිපතිතුමන් සහභාගි වන සියලු ආගම්වලට අයත් උත්සව, සාකච්ඡා, හමුවීම් හා විශේෂ වැඩසටහන් සංවිධානය කිරීම සහ පසුවිපරම් කිරීමේ කටයුතු මෙම ඒකකයෙහි ප්‍රධාන අරමුණු වේ. බෞද්ධාගමික රටක් වන ශ්‍රී ලංකාවෙහි පවතින වෙනත් ආගමික පාර්ශවයන් අතර සහජීවනය වර්ධනය කරමින් ගුණගරුක සමාජයක් බිහිකිරීම උදෙසා විවිධ තේමා එක්කොට ක්‍රියාත්මක වන ආගමික කටයුතු ඒකකය ප්‍රවේශයන් කිහිපයක් ඔස්සේ උක්ත පරමාර්ථ කරා ප්‍රවිශ්ඨව ඇත. එනම්,

1. **ජනපති සදහම් යාත්‍රා** - **කාලේන ධම්ම සවනං - මනුසත් වග වෙත පිදෙන නූතන දම් සභා මණ්ඩපය**
2. **ඓතිහාසික පෙරහැර චිත්ති** - **නිරන්තර පරිනාමයන්ට ලක්වන මහා සංස්කෘතියේ වෙනස් නොවන ආමිස පූජාවේ හරස්කඩ**
3. **පූජාව පූජනීයානං** - **අවිද්‍යාවේ තිමිර අඳුර සමාජයෙන් තුරන් කිරීමට දිවි කැප කළ ගිහි පැවිදි ගුණානුස්මරණය**
4. **අන්‍යොයෝ ද මා වැනිය** - **ඇදහීමට හා විශ්වාසයට සැමට ඇති අයිතිය තහවුරු කිරීමේ සද්ධර්ම පාරමිතාව**
5. **පතිරූප දේස වාසෝච** - **පුද්ගල සුරක්ෂිතතාව තහවුරු වන කලණ මිතුරු පරිසරයක් උදෙසා**
6. **ආලෝකයෙන් ආලෝකයට** - **වනපස මලින් පුද කළැයි පවසනු කවර වරදද? - ජනතාවට සුවසෙත සහ ආශිර්වාදය ලබා දීමේ වැඩසටහන් සංවිධානය කිරීම**

8.1 ජනපති සදහම් යාත්‍රා වැඩසටහන

"සදහම් යාත්‍රා"වැඩසටහන වූ කලී දීර්ඝ කාලයක් රාජ්‍ය අනුග්‍රහය සහිතව සෑම පුර පසළොස්වක පොහොය දිනකම රාජ්‍ය නායකයාගේ මූලිකත්වයෙන් පැවති වැඩසටහනකි. එය අගනගරයටම පමණක් සීමා නොකර පිටිසර ප්‍රදේශවල පිහිටි විහාරස්ථාන හා එම ප්‍රදේශවල ජනතාවගේ ආගමික නැඹුරුව සෘජුවම, ඉලක්ක කරගත් ආගමික වැඩසටහනකි. එමෙන්ම, සදහම් යාත්‍රා ධර්ම දේශනා පැවැත්වෙන විහාරස්ථානවල පවතින අවශ්‍යතා හඳුනාගැනීම සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම විශේෂ අරමුණක් වන අතර සුපහන් පරපුරක් සහිත යහපත් සමාජයක් බිහිකිරීම උදෙසා පවත්වනු ලබන ධාර්මික වැයමකි.

"සදහම් යාත්‍රා"යටතේ සිදුකරනු ලබන ක්‍රියාකාරකම්

1. ප්‍රාදේශීය රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කර පූර්ව සාකච්ඡා සිදු කිරීම
2. විහාර ප්‍රවේශ මාර්ග සංවර්ධනය.
3. අභ්‍යන්තර මාර්ග සංවර්ධනය කිරීම.
4. සෑ මළු, බෝ මළු හා මිදුල ප්‍රාකාර සංවර්ධනය.
5. සනීපාරක්ෂක කුටි ප්‍රතිසංස්කරණය.
6. විදුලි පද්ධති යාවත්කාලීන කිරීම හෝ අලුතින් යෙදීම.
7. විහාරස්ථානය ආශ්‍රිත පරිසර පවිත්‍රතා කටයුතු.
8. විහාරස්ථානය ආශ්‍රිත ප්‍රතිසංස්කරණ කටයුතු.

9. අෂ්ට පරිෂ්කාර සහ විශේෂ පිරිකර සැපයීම.
10. සන්නිවේදන කටයුතු සම්බන්ධීකරණය.
11. නොමිලේ බෙදාහැරීම සඳහා තත් විහාරය සහ සඟ පරපුර පිළිබඳ කෘති සම්පාදනය, මුද්‍රණය සහ ප්‍රචාරණය.
12. ඉහත සමස්ත කාර්ය අධීක්ෂණය.

8.1 වගුව - 2016 වර්ෂයේදී සඳහම් යාත්‍රා ධර්ම දේශනා වැඩසටහන් පැවති දිස්ත්‍රික්කයන් හා විහාරස්ථාන

අනු අංක	සඳහම් යාත්‍රා ධර්ම දේශනා වැඩසටහන පැවති දිනය	දිස්ත්‍රික්කය	විහාරස්ථානයේ නම
01	2016.01.23	හම්බන්තොට	අම්බලන්තොට, ගිරිහඬු සෑ රජමහා විහාරස්ථානය
02	2016.02.22	කෑගල්ල	බෙලිගල, ඓතිහාසික ශ්‍රී විජය සුන්දරාරාම විහාරස්ථානය
03	2016.03.22	නුවරඑළිය	අඹගමුව, විජයබා පිරිවෙන් විහාරස්ථානය
04	2016.04.21	ගාල්ල	ශ්‍රී ශෛලාලයාරාම පුරාණ රජමහා විහාරස්ථානය
05	2016.06.19	මාතලේ	මාදිපොල, කැඳන්ගමුව, ශ්‍රී සුනන්දාරාම පුරාණ විහාරස්ථානය
06	2016.07.19	මොණරාගල	යුදඟනාරාජමහා විහාරස්ථානය
07	2016.09.16	රත්නපුර	පැල්මඩුල්ල, ගල්පොත්තාවල ශ්‍රී පාදස්ථාන රජමහා විහාරස්ථානය
08	2016.10.15	ගම්පහ	සපුගස්කන්ද රාජමහා විහාරස්ථානය
09	2016.11.14	කොළඹ	සිරි නිකේතනාරාම පුරාණ විහාරස්ථානය
10	2016.12.13	කොළඹ	මුල්ලේරියාව නව නගරය, හිඹුටාන, ශ්‍රී අභිනවාරාම විහාරස්ථානය

8.2 ඓතිහාසික සිරි දළදා වාර්ෂික පෙරහැර සමාප්ති උළෙල - 2016 සංවිධානය කිරීම

සෙන්කඩගල වැඩ වසන ශාක්‍ය මුනීන්ද්‍රයාණන් වහන්සේගේ ශ්‍රී දළදා වහන්සේ වෙනුවෙන් වාර්ෂිකව සිදු කරනු ලබන සතර දේවාල ප්‍රමුඛ දළදා පෙරහැර 2016 වර්ෂයේදී ද පූර්ණ රාජ්‍ය අනුග්‍රහ පූර්වකව සිදු කිරීමෙන් පසු සම්ප්‍රදායික සමාප්ති මංගල්‍යය දියවඩන නිලමෙතුමන් ප්‍රධානකොට ඇති පරිවාර සතර දේවාලවල නිලමෙතුමන්ලා ගේ ආරාධනයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් මැති ඇමතිවරුන්ගේ සහභාගීත්වයෙන් 2016-08-18 දා අපරභාගයේදී මහනුවර ජනාධිපති මන්දිරයේදී උත්සව ශ්‍රීයෙන් පවත්වන ලදී. මෙම උත්සවය සාර්ථකව ඉටු කරගැනීම සඳහා මහනුවර දිසාපතිතුමන් සහ පෙරහැර කමිටුවේ සභාපති, ගඟවට කෝරළයේ ප්‍රාදේශීය ලේකම්තුමන් ප්‍රධානකොට ඇති සේවක භවතුන් නොමද සහයෝගයක් ලබාදුන්හ.





ජ්‍යෙෂ්ඨ නර්ථන ශිල්පීන්ට ජනපති සුරකින් ඇඟයුම්

8.3 ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමන්ගේ 152 වන ගුණානුස්මරණ ජාතික උත්සවය පැවැත්වීමේ කටයුතු සම්බන්ධීකරණ කිරීම

මෙම උත්සවය ආගමික කටයුතු අංශය, බුද්ධ ශාසන අමාත්‍යාංශය සහ කැළණිය විශ්වවිද්‍යාලයීය ජනසන්නිවේදන අධ්‍යයන අංශය එක්ව බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ සහ ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේදී, 2016-09-25 සහ 26 දිනයන්හි දී පවත්වන්නට යෙදුනි. ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමන්ගේ 152 වන ගුණානුස්මරණ ජාතික උත්සවය මහා සංඝරත්නය, මැති ඇමතිවරු, විද්වතුන්, අමාත්‍යාංශ ලේකම්වරු, බෞද්ධ කටයුතු සමායෝජකයින්, විද්‍යාර්ථයින්, ශ්‍රීමත් අනගාරික ධර්මපාල පදනම, විදුහල්පතිවරුන්, බෞද්ධ සංගම් නියෝජිතයන් ඇතුළු විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් උත්කර්ෂවත් ලෙස පවත්වන ලදී.

8.4 කොටුව ජනාධිපති මන්දිරයේදී 2016 වර්ෂයේ දීපවාලී උත්සවය සැමරීම සංවිධානය කිරීම

මෙම දීපවාලී උත්සවය 2016-10-29 වන දින කොටුව ජනාධිපති මන්දිරයේදී ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා අග්‍රාමාත්‍යතුමන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි. හින්දු ආගමික පූජකවරුන්, විපක්ෂ නායක ආර්. සම්බන්දන් මැතිතුමන් ඇතුළු මහජන නියෝජිතයන්ගේ ද සෙසු (සිංහල/ දමිළ) බැතිමතුන්ගේ ද සහභාගීත්වයෙන් සිදු කළ දීපවාලී උත්සවය විචිත්‍ර සංස්කෘතිකාංගාදියෙන්ද සමන්විත විය.





8.5.1 ශාසනාරක්ෂක බලමණ්ඩල සාකච්ඡා පැවැත්වීම - 2016

ශ්‍රී සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය, අභිවෘද්ධිය සාක්ෂාත් කරගැනීම උදෙසාත් ශාසනික වශයෙන් වඩා වැදගත් ජාතික ප්‍රතිපත්තිමය අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසාත් ශාසනාරක්ෂක බලමණ්ඩලවල ලේඛකාධිකාරී සහ සභාපති ස්වාමීන්ද්‍රයාණන් වහන්සේලාගේ සහභාගීත්වයෙන් ගරු ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් සහ අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ මැදිහත්වීමෙන් මෙම හමුව 2016-07-05 දින ජනාධිපති මන්දිරයේදී පවත්වන්නට යෙදුනි.



8.5.2 අන්තර් ආගමික සමුළුව පැවැත්වීම

අන්තවාදී සහ අන්තගාමී පිරිස් විසින් සමස්ත ජනයා නොමඟ යවනසුලු ප්‍රකාශන සහ පෙළඹවීම්වලට ඉඩක් නොලැබෙන පරිදි කටයුතු කිරීම උදෙසා ජනතාව අතර සංහිදියාව සහ අන්‍යොන්‍ය විශ්වාසය තහවුරු කිරීමේ අරමුණින් අන්තර් ආගමික නායක පූජක උතුමන්ලාගෙන් සැදුම් ලත් මෙම අන්තර් ආගමික මණ්ඩලය ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2016-02-25, 2016-06-14 සහ 2016-07-26 දිනයන්හිදි පවත්වන ලදී. මෙමඟින් ශ්‍රී ලංකාව තුළ ජාතික සංහිදියාව සහ වගවීම හා මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමට උපදෙස් ලබාගැනීම මෙමඟින් අපේක්ෂා කෙරේ.







8.5.3 වාර්ෂික පිච්ච මල් පූජාව අනුරාධපුර විජය ශ්‍රී ජය ශ්‍රී බෝ සමිඳු අභියසදී පැවැත්වීම සම්බන්ධීකරණය කිරීම

ශාන්ති පදනමේ අනුශාසක, පූජ්‍ය කොටපොළ අමරකිත්ති ස්වාමීන් වහන්සේගේ අනුශාසකත්වයෙන් ශාන්ති පදනම මඟින් සංවිධානය කරනු ලබන මෙම ආශීර්වාද පිච්ච මල් පූජා මහෝත්සවයේ මූලික අරමුණ, අතිගරු ජනාධිපතිතුමන් ප්‍රමුඛ ත්‍රිවිධ හමුදාව පොලිසිය සහ සමස්ත ජනතාවට ආශීර්වාද කිරීම වේ.මෙම පූජාව අනුරාධපුර විරාජමාන විජය ශ්‍රී ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභිමුව දී 2016 ජූලි 23 දින පූර්ණ රාජ්‍ය අනුග්‍රහය ඇතිව පවත්වන ලදී.

මෙම වැඩසටහනට සමගාමීව රුවන්වැලි මහා සෑ සමිඳුන්ට ගුවනින් පුෂ්පෝපහාර සිදු කළ අතර රන් ආලේපිත කරඬුවක්ද පූජා කරන ලදී.





වාර්ෂික පිච්ච මල් පූජාව පැවැත්වීම - අනුරාධපුරය

8.5.4 ජනපති පදවි ප්‍රාප්තියේ ප්‍රථම සංවත්සරය සංවිධානය කිරීම

ජනපති පදවි ප්‍රාප්තියේ ප්‍රථම සංවත්සරය 2016 ජනවාරි මස 08 දිනට යෙදිණි. එය සමරනු වස් ජනාධිපති මන්දිරයේදී සර්ව රාත්‍රික පිරිත් සජ්ජායනාවක් හා පසුදා සංඝගත දක්ෂිණාවක් පවත්වන්නට යෙදුනි. මෙම අවස්ථාවට ත්‍රෛනිකායික භික්ෂූන්වහන්සේ, අමාත්‍ය මණ්ඩල සාමාජිකයින්, විදේශ නියෝජිතයන්, ප්‍රාදේශීය ජනමත නායකයින්, ජනාධිපති ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ සෙසු රාජ්‍ය සේවා භවතුන් ඇතුළු විශාල පිරිසක් සහභාගි වූහ.





09. වෙනත් විශේෂ කාර්යයන් - 2016

9.1 ජනාධිපති මන්දිරය ජනතා ප්‍රදර්ශනයට විවෘත කිරීම

ජනාධිපති මන්දිරය ප්‍රථම වරට ජනතා ප්‍රදර්ශනය සඳහා විවෘත කිරීම අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සංකල්පයකට අනුව සිදු කෙරුණි. යටත් විජිත යුගයේ ආණ්ඩුකාර නිල නිවස ලෙසද නිදහසින් පසු පත්වූ රාජ්‍ය නායකයන්ගේ නවාතැන ලෙසට භාවිතයට ගැනුණු මෙම මන්දිරය සිය නෙතින් දැක ගැනීම සඳහා පාසල් දරුවන් ප්‍රමුඛ විශාල මහජන සමූහයක් දිවයිනේ නන් දෙසින් පැමිණියහ. සංචරණය සඳහා ශ්‍රී ලංකාවට පැමිණි විදේශිකයන් ගණනාවක් ද ඒ අතර විය.









9.2 පරිස්සමින් ගිහින් එන්න - මාර්ග ආරක්ෂණ සතිය

(2016.12.01-2016.12.07-බස්නාහිර පළාත)
මාර්ග අනතුරු ප්‍රමාණය හා එමඟින් සිදුවන මරණ සංඛ්‍යාව අඩු කිරීම ප්‍රධාන අරමුණ කර ගනිමින් ජාතික රූපවාහිනී සංස්ථාව හා අනෙකුත් ආයතන එක්ව ක්‍රියාත්මක කළ වැඩසටහනකි. මේ සඳහා වැයවන මුදලින් රුපියල් මිලියන දහයක් (10,000,000/=) ජනාධිපති කාර්යාලයෙන් ජාතික රූපවාහිනී සංස්ථාව වෙත ලබා දී ඇත.

9.3 සංස්කෘතික හා කලා ප්‍රතිපත්ති ඒකකය පිහිටුවීම

යහපාලන ක්‍රියාදාමයට පිටුබලය දෙන්නාවූ ද, නූතන ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ලෙස ඉදිරියට යාමට ආධාරකවූ ද, ප්‍රගතිශීලී ජාතික කලා- සංස්කෘතික ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වැඩසටහනකි. කලා හා සංස්කෘතික ප්‍රතිපත්ති ඒකකයේ නිලධාරීන් හා අදාල පාර්ශවකරුවන් අතර සාකච්ඡා වට ගණනාවක් පවත්වන ලද අතර පැවති කලා හා සංස්කෘතික ප්‍රතිපත්ති ඒකකය පනතක් මඟින් ස්ථාපනය කළ යුතු බව එම සභාවේදී තීරණය විය.

9.4 මිහිමඬලේ රිද්මය

කලාත්මක නිර්මාණ මුල්කර ගත් රසවින්දනාත්මක වැඩසටහන් මත පරිසර හිතකාමී ජන සමාජයක් බිහි කිරීමේ අරමුණු පෙරදැරිව " මහ පොළවේ රිද්මය " රස වින්දනාත්මක වැඩසටහන බිහි වී ඇත. මේ යටතේ තෝරා ගත් ස්ථාන 4 කදී සමාරම්භක වැඩසටහන් 4ක් පැවැත්වීම සඳහා ජනාධිපති කාර්යාලය මඟින් ප්‍රතිපාදන ලබා දෙන ලදී. මෙහි ආරම්භක වැඩසටහන 2016.11.30 ප.ව 6.30-9.00 දක්වා ප්‍රවීන සංගීතවේදී දර්ශන රුවන් දිසානායක මහතා ඇතුළු කණ්ඩායමක් විසින් මොණරාගල පුස්තකාල ශ්‍රවණාගාරයේදී පවත්වන ලදි.

9.5 ජාතික පොත් ප්‍රතිපත්තියක් සැකසීම

ශ්‍රී ලංකාවේ පොත ආශ්‍රිත ප්‍රබල සමාජ සංස්කෘතියක් ගොඩනැගීමත්, එතුළින් බුද්ධි වර්ධනය සහ සමාජ සදාචාර පෝෂණයක් ඇති කිරීම සඳහාත් පොත් කර්මාන්තයේ නියුක්ත වෘත්තිකයන්, ලේඛකයන්, සංස්කාරකවරුන්, භාෂා පරිවර්තකයන්, පර්යේෂකයන්, පොත් ප්‍රකාශකයන්, මුද්‍රණ ශිල්පීන්, සැලසුම් ශිල්පීන්, පොත් වෙළඳුන් සහ පොදු පාඨකයන් ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ සංවර්ධන ක්‍රියාවලියට සක්‍රීය ලෙස දායක කර ගනිමින් ජාතික පොත් ප්‍රතිපත්තියක් සකස් කිරීමට අපේක්ෂිතය. ඉහත සියලු පාර්ශවයන් සහභාගීත්වයෙන් 2016.10.03 දින සාකච්ඡාවක් පවත්වන ලදී. ජාතික පොත් ප්‍රතිපත්තිය පාර්ලිමේන්තු පනතක් ලෙස සම්මත කර ගැනීම සුදුසු බවට එහිදී යෝජනා වූ අතර, පනත් කෙටුම්පත සඳහා අදාල පාර්ශවයන් අතර යෝජනා හා අදහස් කැඳවීමට තීරණය විය.

සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය විසින් පවත්වන ලද සාකච්ඡා හා රැස්වීම් - 2016

අනු. අංකය	දිනය	රැස්වීම /සාකච්ඡාව
අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත් වූ රැස්වීම් හා සාකච්ඡා		
1	2016.01.07	ළමාරක්ෂක ජනාධිපති ජාතික ඒකකය පිහිටුවීම පිළිබඳ සාකච්ඡාව
2	2016.01.27	මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම
3	2016.01.25	පෞද්ගලික අංශයේ කෘෂි ව්‍යවසායකයින් සමඟ පැවැත්වූ සාකච්ඡාව
4	2016.02.23	"ශ්‍රී ලංකාවේ ආර්ථිකය" පිළිබඳව ආර්ථික විද්‍යාඥයින් සමඟ පවත්වන ලද විද්වත් හමුව
5	2016.02.05	අන්තර් ආගමික පූජකතුමන්ලාගේ සමුළුව
6		අතිගරු ජනාධිපතිතුමන් සමඟ ආර්ථික විද්‍යා වෘත්තිකයන්ගේ හමුව
7	2016.03.23	පරිසර සංරක්ෂණය පිළිබඳ අතිගරු ජනාධිපතිතුමා සමඟ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ විද්වත් කමිටු රැස්වීම
8	2016.03.31	"ශ්‍රී ලංකාවේ ආර්ථිකය හා ඉදිරි ගමන් මග" සාකච්ඡාව
9	2016.05.06	2016 අප්‍රේල් මස 27, 28 හා 29 තෙදින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ "මිහිලක මැදුරේදී" දේශීය හා විදේශීය විද්වතුන්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලද වැඩමුළුවේ ප්‍රතිඵල මත සකස් කරන ලද වාර්තාව ගරු ජනාධිපතිතුමා වෙත පිළිගැන්වීම
10	2016.05.24	"දරුවන් සුරකිමු වැඩසටහන" පිළිබඳව සාකච්ඡාව
11	2016.05.30	වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්යය සාධන බලකාය සමඟ සාකච්ඡාව
12	2016.05.31	දියවඩන නිලමේතුමා ඇතුළු නිලමේවරුන් සමඟ සාකච්ඡාව
13	2016.06.14	අන්තර් ආගමික සමුළුව
14	2016.06.23	විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රයේ ආයෝජනය කිරීම සම්බන්ධ රැස්වීම
15	2016.07.05	සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය සමඟ සාකච්ඡාව
16	2016.08.29	මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ ජනාධිපතිතුමා පැවැත් වූ ප්‍රගති සමාලෝචනය පිළිබඳ සාකච්ඡාව
17	2016.08.31	මධ්‍යම පරිසර අධිකාරිය සහ වයඹ පරිසර අධිකාරිය අතර පවතින අර්බුදකාරී තත්ත්ව පිළිබඳ අතිගරු ජනාධිපතිතුමන් සමඟ සාකච්ඡාව
18	2016.10.18	ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ උද්ගතව ඇති පාරිසරික ගැටලු සඳහා විසඳුම් ලබාදීම පිළිබඳ සාකච්ඡාව
19	2016.11.28	රිදීගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගල් වැඩපල පිළිබඳව ජනාධිපතිතුමා සමඟ සාකච්ඡාව
ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ රැස්වීම් හා සාකච්ඡා		
20	2016.01.05	ජනාධිපති මන්දිරය පාසැල් සිසුන් සඳහා විවෘත කිරීම පිළිබඳ සාකච්ඡාව
21		මහනුවර නගර සංවර්ධනය පිළිබඳ සාකච්ඡාව

අනු. අංකය	දිනය	රැස්වීම /සාකච්ඡාව
22	2016.02.17	මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා ප්‍රවාහන හා මූල්‍ය ක්ෂේත්‍රයේ සහය ලබාගැනීම පිළිබඳ සාකච්ඡාව
23	2016.03.09	මත්ද්‍රව්‍ය නිවාරණය තේමා කරගත් ටෙලිනාට්‍ය හා චේදිකා නාට්‍ය සඳහා මාධ්‍ය ප්‍රචාරණය ලබාගැනීම
24	2016.05.31	අම්පාර දිස්ත්‍රික් ගොවිජන සමුළුව පිළිබඳ සාකච්ඡාව
25	2016.06.30	ජනාධිපති කාර්යාලය මඟින් සංවිධානය කරන උත්සව අවස්ථා සඳහා ආවරණ කුටි ඉදිකර ගැනීම පිළිබඳ විශේෂ සාකච්ඡාව
26	2016.08.05	වාර්ෂික දළදා පෙරහැර ප්‍රගති සමාලෝචනය පිළිබඳ රැස්වීම
27	2016.12.22	නියං තත්වය නිසා ආහාර නිෂ්පාදනයට මුහුණ දීමට සිදුවිය හැකි ගැටලු සම්බන්ධ සාකච්ඡාව
28		ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහනේ අලෙවි වැඩසටහන පිළිබඳ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව හා හදබිම අධිකාරිය සමඟ පැවති සාකච්ඡාව
ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ රැස්වීම් හා සාකච්ඡා		
29	2016.01.04	මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහනේ කොළඹ දිස්ත්‍රික් උත්සවය පිළිබඳ සාකච්ඡාව
30	2016.01.12	"මනින් නිදහස් රටක්" සිව්වන ජාතික වැඩසටහන පිළිබඳ පූර්ව සාකච්ඡාව
31	2016.01.14	පරිසර සංරක්ෂණය පිළිබඳ විද්වත් හමුව
32	2016.01.22	කලා හා සංස්කෘතික ඒකකයේ නීතිමය රාමුව පිළිබඳ සාකච්ඡාව
33	2016.01.25	ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහනේ ප්‍රගති සමාලෝචන රැස්වීම
34	2016.02.01	සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන විශේෂ වැඩසටහන් පිළිබඳව පළාත් සහ දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන
35	2016.02.03	ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය සමඟ පවත්වන ලද සාකච්ඡාව
36	2016.02.03	ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ 70 වන උපසම්පදා මහෝත්සවය පිළිබඳ සාකච්ඡාව
37	2016.02.08	"පුනරුදය" පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහනේ 2016-2018 ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ සාකච්ඡාව
38	2016.02.15	ජාත්‍යන්තර වකුගඩු දිනය සැමරීම වෙනුවෙන් පවත්වන ලද සාකච්ඡාව
39	2016.02.15	වකුගඩු රෝග නිවාරණ ජාතික සැලැස්ම (2016-2018) සකස් කිරීම පිළිබඳ සාකච්ඡාව
40	2016.02.16	"වස විස නැති රටක්" වැඩසටහන පිළිබඳ පූර්ව සාකච්ඡාව
41	2016.02.24	පරිසර සංරක්ෂණය පිළිබඳ 2016 වාර්ෂික සැලැස්ම සකස් කිරීම පිළිබඳ සාකච්ඡාව
42	2016.02.26	වකුගඩු රෝග නිවාරණ ජාතික සැලැස්ම (2016/2018) සකස් කිරීම පිළිබඳ සාකච්ඡාව

අනු. අංකය	දිනය	රැස්වීම /සාකච්ඡාව
43	2016.03.01	ජනාධිපති මන්දිරය මහජන ප්‍රදර්ශනයට විවෘත කිරීම පිළිබඳ සාකච්ඡාව
44	2016.03.03	පොලිතීන් හා ප්ලාස්ටික් භාවිතය අවම කිරීමට ගෙන ඇති පියවර පිළිබඳ විශේෂ සාකච්ඡාව
45	2016.03.03	"මතින් නිදහස් රටක්" පස්වන ජාතික වැඩසටහන පිළිබඳ පූර්ව සාකච්ඡාව
46	2016.03.18	සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය මඟින් ක්‍රියාත්මක කරන වැඩසටහන් සම්බන්ධව පළාත් හා දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන
47	2016.03.18	ළමාරක්ෂක ජනාධිපති ජාතික ඒකකය සම්බන්ධ සාකච්ඡාව
48	2016.04.07	"වකුගඩු රෝග නිවාරණ ජාතික වැඩසටහන" ජාතික සැලැස්ම සකස්කිරීම
49	2016.04.07	ළමා රක්ෂක ජනාධිපති ජාතික ඒකකයේ ඉදිරි කටයුතු සාකච්ඡා කරගැනීම සඳහා පළාත් සභා නියෝජිතයන් සමඟ කළ සාකච්ඡාව
50	2016.04.11	"ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ ජන්ම දිනය සැමරීමේ උත්සවය" පිළිබඳ පූර්ව සාකච්ඡාව
51	2016.04.19	"ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ ජන්ම දිනය සැමරීමේ උත්සවය" පිළිබඳ පූර්ව සාකච්ඡාව
52	2016.04.20	ශ්‍රී ලාංකේය ජාතික උරුමයන් පිළිබඳ වාර්තා වැඩසටහන් මාලාව ප්‍රදර්ශනය හා විශේෂ සාකච්ඡාව
53	2016.04.26	වකුගඩු රෝගීන්ට මහනුවර/අනුරාධපුර රෝහල්වල ඉදිකිරීමට නියමිත ඒකක පිළිබඳ සාකච්ඡාව
54	2016.04.28	කොළඹ කොටුව ජනාධිපති මන්දිරය මහජන ප්‍රදර්ශනයට විවෘත කිරීම පිළිබඳ සාකච්ඡාව
55	2016.04.29	ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ 83 වන ගුණානුස්මරණය
56	2016.05.02	රත්නපුර දිස්ත්‍රික් පරිසර සමුළුව පිළිබඳ ප්‍රගති සමාලෝචන රැස්වීම
57	2016.05.02	ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන පිළිබඳ සාකච්ඡාව
58	2016.05.03	නයිගල විහාරස්ථානයේ පවත්වන ලද රාජ්‍ය වෙසක් උත්සවයේ කටයුතු සංවිධානය කිරීම පිළිබඳ පූර්ව සාකච්ඡාව
59	2016.05.04	ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් සමඟ සාකච්ඡාව (භෞතික හා මූල්‍ය ප්‍රගතිය ලබාගැනීම)
60	2016.05.05	වකුගඩු රෝග නිවාරණ ජාතික වැඩසටහන, බදුල්ල දිස්ත්‍රික්කය - මූලික සාකච්ඡාව
61	2016.05.05	බෞද්ධාලෝක වෙසක් කලාපයේ කටයුතු සංවිධානය කිරීම පිළිබඳ පූර්ව සාකච්ඡාව
62	2016.05.06	මාතලේ දිස්ත්‍රික් පරිසර සමුළුව පිළිබඳ පූර්ව සාකච්ඡාව
63	2016.05.06	අස්ගිරි පාර්ශවයේ අභිනව මහානායක හා අනුනායක හිමිවරුන්ට අක්ත පත්‍ර ප්‍රදාන උත්සවය

අනු. අංකය	දිනය	රැස්වීම /සාකච්ඡාව
64	2016.05.09	මත්ද්‍රව්‍ය නිවාරණ හයවන ජාතික වැඩසටහන පිළිබඳ පූර්ව සාකච්ඡාව-02
65	2016.05.09	ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන - ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම
66	2016.05.10	නයිගල විහාරස්ථානයේ පවත්වන ලද රාජ්‍ය වෙසක් උත්සවයේ කටයුතු සංවිධානය කිරීම පිළිබඳ ප්‍රගති සමාලෝචන රැස්වීම
67	2016.05.11	කොළඹ කොටුව ජනාධිපති මන්දිරය මහජන ප්‍රදර්ශනයට විවෘත කිරීම පිළිබඳ සාකච්ඡාව
68	2016.05.11	බෞද්ධාලෝක වෙසක් කලාපයේ කටයුතු සංවිධානය කිරීම පිළිබඳ පූර්ව සාකච්ඡාව
69	2016.05.18	ලෝක පරිසර දිනයට සමගාමීව ක්‍රියාත්මක වැඩසටහන් පිළිබඳ සාකච්ඡාව
70	2016.05.18	පරිසර සංරක්ෂණය උදෙසා පැල තවාන් ඇති කිරීම පිළිබඳ සාකච්ඡාව
71	2016.05.18	කුඩා ජලවිදුලි බලාගාර සම්බන්ධ සාකච්ඡාව
72	2016.05.18	රත්නපුර දිස්ත්‍රික්කයේ මැණික් ගරා අවසන් කොට ඇති පතල් පුනරුත්තාපනය කිරීම පිළිබඳ සාකච්ඡාව
73	2016.05.22	රාජ්‍ය වෙසක් උත්සවයේ අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන වැඩසටහන
74	2016.05.26	හොඳම ගොවියා තේරීම පිළිබඳ සාකච්ඡාව
75	2016.05.27	පරිසර සතියේ සමාරම්භය ප්‍රකාශයට පත් කිරීමේ උළෙල පිළිබඳ සාකච්ඡාව
76	2016.05.30	ලෝක පරිසර දිනයට සමගාමීව ක්‍රියාත්මක "පරිසර සතිය" ප්‍රකාශයට පත්කිරීමේ සමාරම්භක උත්සවය
77	2016.05.31	තිස්සමහාරාමය, සිතුල්පව්ව, හාතාගල හා රන්ගිරි යන රජමහා විහාරස්ථාන කේන්ද්‍ර කරගනිමින් පැවැත්වීමට නියමිත පොසොන් උත්සවයේ කටයුතු සංවිධානය කිරීම පිළිබඳ ප්‍රගති සමාලෝචන රැස්වීම
78	2016.05.31	ජගත් සාගර දිනය සැමරීමේ වැඩසටහන පිළිබඳ සාකච්ඡාව
79	2016.06.01	කොළඹ කොටුව ජනාධිපති මන්දිරය මහජන ප්‍රදර්ශනයට විවෘත කිරීම පිළිබඳ සාකච්ඡාව
80	2016.06.07	පොසොන් උත්සවයේ කටයුතු සංවිධානය කිරීම පිළිබඳ සාකච්ඡාව
81	2016.06.07	"මනින් නිදහස් රටක්" හත්වන දිස්ත්‍රික් වැඩසටහනේ පූර්ව සාකච්ඡාව
82	2016.06.10	පිච්ච මල් පූජාවේ කටයුතු සංවිධානය කිරීම පිළිබඳ සාකච්ඡාව
83	2016.06.14	පොසොන් උත්සවයේ කටයුතු සංවිධානය කිරීම පිළිබඳ සාකච්ඡාව
84	2016.06.20	පුනරුදය පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන 2016-2018 ප්‍රගති සමාලෝචන රැස්වීම
85	2016.06.22	ජාතික වැඩසටහන්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ සමාලෝචන රැස්වීම

අනු. අංකය	දිනය	රැස්වීම /සාකච්ඡාව
86	2016.06.22	රාමඤ්ඤ නිකාය උපසම්පදා උත්සවයේ කටයුතු සංවිධානය කිරීම පිළිබඳ සාකච්ඡාව
87	2016.06.27	පළාත් පාලන ආයතනවල කසල කළමනාකරණය පිළිබඳ සාකච්ඡාව
88	2016.06.30	ප්‍රතිආශ්‍රැතකරණ ජල පෙරණ නඩත්තු කටයුතු නාවික හමුදාවට පවරා දීම
89	2016.07.01	"මතින් නිදහස් රටක්" හත්වන දිස්ත්‍රික් වැඩසටහනේ පූර්ව සාකච්ඡාව
90	2016.07.05	ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන
91	2016.07.22	කොටුව ජනාධිපති මන්දිරය මඩුකන්ද ජාතික පාසලේ ගුරු සිසු පිරිසට ප්‍රදර්ශනය හා ගරු ජනාධිපතිතුමන් සමඟ සාකච්ඡාව
92	2016.07.28	ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කිරීම පිළිබඳ වැඩමුළුව
93	2016.07.28	අනගාරික ධර්මපාලතුමන්ගේ ගුණානුස්මරණ වැඩසටහන පිළිබඳ මූලික සාකච්ඡාව
94	2016.11.02	සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය යටතේ ක්‍රියාත්මක වැඩසටහන්වල ප්‍රගති සමාලෝචනය හා 2017 ජාතික සැලැස්ම සකස් කිරීම පිළිබඳ සාකච්ඡාව
අංශ ප්‍රධානීන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ රැස්වීම් හා සාකච්ඡා		
95	2016.01.06	දුම්කොළ වගාව පිළිබඳ වර්තමාන තත්ත්වය පිළිබඳව දුම්කොළ ගොවීන් සමඟ පැවැත්වූ සාකච්ඡාව
96	2016.01.13	"මතින් නිදහස් රටක්" සිව්වන ජාතික වැඩසටහන පිළිබඳ මාධ්‍ය සාකච්ඡාව
97	2016.03.02	පොලිස් දෙපාර්තමේන්තුවේ මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ මෙහෙයුම් ඒකකයක් පිහිටුවීම
98	2016.03.09	සුරාබදු ආඥා පනත සංශෝධනය කිරීම පිළිබඳ විශේෂ සාකච්ඡාව
99	2016.03.11	"ශ්‍රී ලංකාවේ ආහාර නිෂ්පාදනය හා සුරක්ෂිතතාව" පිළිබඳ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ විද්වත් කමිටු රැස්වීම
100	2016.04.04	නෙදර්ලන්තයේ පරීක්ෂණ කණ්ඩායම් සමඟ සාකච්ඡාව
101	2016.04.05	හෙළ සුවය සංවිධානය හඳුන්වා දුන් වස විස නැති ආහාර ප්‍රචලිත කිරීමේ වැඩසටහන පිළිබඳව සාකච්ඡාව
102	2016.04.25	මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීම
103	2016.04.26	වස විස නැති ආහාර ප්‍රචලිත කිරීමේ වැඩසටහනේ අන්තර් ආයතන ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ වැඩමුළුව
104	2016.04.26	සහකාර අධ්‍යක්ෂ (කෘෂිකර්ම) නිලධාරීන් සමඟ පැවැත්වූ සාකච්ඡාව
105	2016.05.02	මත්ද්‍රව්‍ය නිවාරණ මාසය ප්‍රකාශයට පත් කිරීම
106	2016.05.06	වෙසක් මස "සදහම් යාත්‍රා" වැඩසටහන පිළිබඳ මූලික සාකච්ඡාව
107	2016.05.06	වස විස නැති රටක් - සම්බන්ධීකරණ කමිටු රැස්වීම

අනු. අංකය	දිනය	රැස්වීම /සාකච්ඡාව
108	2016.05.06	මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන සම්බන්ධ සාකච්ඡාව
109	2016.05.09	නුවරඑළිය දිස්ත්‍රික් සෞඛ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම
110	2016.05.09	මත්ද්‍රව්‍ය නිවාරණ හයවන ජාතික වැඩසටහන පිළිබඳ ව්‍යාපාරික ප්‍රජාව සමඟ සාකච්ඡාව
111	2016.05.16	ශ්‍රී ලංකාවේ සෝයා වගාව ව්‍යාප්ත කිරීම සම්බන්ධ සාකච්ඡාව
112	2016.05.24	කෘෂිකර්ම සහකාර අධ්‍යක්ෂවරුන් සමඟ පැවැත්වෙන සාකච්ඡාව
113	2016.06.21	ජනාධිපති කාර්යාලය තුල කසල බැහැර කිරීම විධිමත් කිරීම
114	2016.06.24	මහවැලි සී කළාපයේ වැලි ව්‍යාපාරිකයන්ගේ සුභසාධක සංගමය සමඟ සාකච්ඡාව
115	2016.06.27	ජනාධිපති කාර්යාලය තුල කසල බැහැර කිරීම විධිමත් කිරීමේ විශේෂ දේශනය
116	2016.07.07	ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණයේදී මතුවන ගැටලු පිළිබඳ සාකච්ඡාව
117	2016.07.07	බෝගස්වැව ප්‍රතිආශ්‍රැතිකරන ජල පද්ධතිය විවෘත කිරීම - පසු විපරම්
118	2016.07.07	නායයෑම් අවධානම් සහිත භූමිවල එම අවධානම් සහගත තත්ත්වයන් අවම කිරීම පිළිබඳ සාකච්ඡාව
119	2016.07.08	නාමල් උයනේ සියළුම ආදායම් වකුගඩු අරමුදලට ලබා ගැනීම
120	2016.07.18	අක්තපත්‍ර ප්‍රධානය කිරීමේ උත්සවය පිළිබඳ මූලික සාකච්ඡාව
121	2016.07.25	මත්ද්‍රව්‍ය නිවාරණ ඉදිරි කටයුතු සැලසුම් කිරීම
122	2016.07.25	කොළඹ දිසාව තුළ පොලිස් ස්ථානාධිපතිවරු දැනුවත් කිරීම
123	2016.07.26	ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම පිළිබඳ මූලික සාකච්ඡාව
124	2016.07.26	අන්තර් ආගමික උපදේශක සභාව
125	2016.08.02	ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 37 වන සංවත්සරයට සමගාමීව වකුගඩු රෝග නිවාරණය පිළිබඳව දැනුවත් කිරීමේ හා ජාතික වකුගඩු අරමුදල සඳහා ආධාර කිරීමේ පා ගමන
126	2016.08.04	බස්නාහිර පළාත් සෞඛ්‍ය ආයතනවල කසළ කළමනාකරණය පිළිබඳ මූලික සාකච්ඡාව
127	2016.08.05	කුරුණෑගල - හිරියාල මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනේ පූර්ව සාකච්ඡාව

අනු. අංකය	දිනය	රැස්වීම /සාකච්ඡාව
128	2016.08.09	2016.05.30 දින පැවති වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්යසාධන බලකායේ සාකච්ඡා වූ කරුණුවල පසුවිපරම (ඊට අදාලව පැවරුණ කාර්යයන් පිළිබඳව හා අදාල රැස්වීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීමේ රැස්වීමක්)
129	2016.08.09	අභ්‍යාස පොත් මුද්‍රණකරුවන් සමඟ වකුගඩු රෝග නිවාරණය පිළිබඳ සාකච්ඡාව
130	2016.08.10	ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති සමාලෝචන රැස්වීම
131	2016.08.11	පුනරුදය පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහනට අදාල දත්ත සහ තොරතුරු ලබාගැනීම
132	2016.08.18	අතිරේක බෝග ආනයනය සීමා කිරීම පිළිබඳව පෞද්ගලික ව්‍යවසායකයින් සමඟ පැවැති සාකච්ඡාව
133	2016.08.18	"මතින් නිදහස් රටක්" පාගමන හා ජාතික සරුංගල් උත්සවය -මාධ්‍ය සාකච්ඡාව
134	2016.08.19	අම්පාර දිස්ත්‍රික් ගොවි සමුළුව සංවිධානය කිරීම පිළිබඳ සාකච්ඡාව
135	2016.08.19	පුනරුදය පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහනට අදාල ප්‍රගති සමාලෝචන රැස්වීම.(රු.මි.148)
136	2016.08.24	කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය පරිසර හිතකාමී අයුරින් පවත්වා ගැනීම.
137	2016.08.24	පොළොන්නරුවේ පැවැත්වීමට නියමිත තරුණ සමුළුව පිළිබඳ සාකච්ඡාව
138	2016.08.30	ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අජීවී බෙල්ලන්ගේ කවච කැණීම් කිරීම සහ ප්‍රවාහනය කිරීම සඳහා නිකුත් කරන්නා වූ බලපත්‍ර
139	2016.08.31	කසළ කළමනාකරණය පිළිබඳ බස්නාහිර පළාත් වෛද්‍ය ආයතනවල ක්‍රියාත්මක වැඩසටහන් අනෙකුත් ආයතනවලට පුළුල් කිරීම පිළිබඳ සාකච්ඡාව
140	2016.08.04	අනගාරික ධර්මපාලතුමන්ගේ ගුණානුස්මරණ උත්සවය පිළිබඳ ප්‍රගති සමාලෝචන සාකච්ඡාව
141	2016.08.30	අනගාරික ධර්මපාලතුමන්ගේ ගුණානුස්මරණ උත්සවය පිළිබඳ ප්‍රගති සමාලෝචන සාකච්ඡාව
142	2016.10.03	5 වන ආසියා ශාන්තිකර කලාපීය දේශගුණ විපර්යාස පිළිබඳ අනුහුරුවීමේ සමුළුව පිළිබඳ මාධ්‍ය දැනුවත් කිරීමේ රැස්වීම
143	2016.10.03	වකුගඩු රෝගීන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා මහනුවර මහරෝහලට යාබදව ඉදිකිරීමට නියමිත නවාතැන් සංකීර්ණය ඉදිකිරීම් ව්‍යාපෘතියේ සාකච්ඡාව
144	2016.10.10	ප්‍රගති සමාලෝචන රැස්වීම
145	2016.10.10	ව්‍යාපෘති වෙත වෙන්කර ඇති ප්‍රතිපාදන වැයකිරීම පිළිබඳව පැවැත්වෙන ප්‍රගති සමාලෝචන රැස්වීම

අනු. අංකය	දිනය	රැස්වීම /සාකච්ඡාව
146	2016.10.25	අතිරේක බෝග ආනයනය සීමා කිරීම සම්බන්ධව පෞද්ගලික අංශයේ ව්‍යවසායකයින් සමඟ පැවැත්වෙන දෙවන සාකච්ඡාව
147	2016.10.31	ප්‍රගති සමාලෝචන රැස්වීම
148	2016.10.31	අමාත්‍යාංශවලට ප්‍රතිපාදන වෙන්කිරීම පිළිබඳ සාකච්ඡාව
149	2016.11.02	ජනාධිපති කාර්යාලය තුළ කසළ බැහැර කිරීම විධිමත් කිරීම
150	2016.11.04	මහවැලි ගඟ හරහා ඇති මිණිපේ වේල්ල උස් කිරීමෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට සිදුවෙතැයි සඳහන් අභිතකර බලපෑම සම්බන්ධ සාකච්ඡාව
151	2016.11.15	ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සඳහා වූ සාකච්ඡාව
152	2016.11.15	ජනපති පදවිප්‍රාප්තිය සම්බන්ධයෙන් සිදුකරන වැඩසටහන් පිළිබඳ සාකච්ඡාව
153	2016.11.16	ජනාධිපති කාර්යාලය තුළ කසළ බැහැර කිරීම පිළිබඳ දේශනය හා සාකච්ඡාව
154	2016.11.17	ජනපති පදවිප්‍රාප්තිය සම්බන්ධයෙන් සිදුකරන වැඩසටහන් පිළිබඳ සාකච්ඡාව
155	2016.11.17	ජනපති පදවි ප්‍රාප්තිය පිළිබඳ වැඩසටහන් සංවිධානය කිරීම
156	2016.11.17	හරිත ගොඩනැගිලි මාර්ගෝපදේශ හඳුන්වාදීමේ උත්සවය පිළිබඳ සාකච්ඡාව
157	2016.11.21	“පුනරුදය” ප්‍රගති සමාලෝචන රැස්වීම
158	2016.11.29	පදවිප්‍රාප්තියට සමගාමීව ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන් පිළිබඳ සාකච්ඡාව
159	2016.12.06	පරිසර මිතුරු සිරිපා සමය පිළිබඳ සාකච්ඡාව
160	2016.12.06	බස්නාහිර පළාත තුළ මත්ද්‍රව්‍ය වැටලීම් පිළිබඳ සාකච්ඡාව
161	2016.12.07	ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන සඳහා රණවිරු අධිකාරියේ සහය ලබාගැනීම පිළිබඳව පැවති සාකච්ඡාව
162	2016.12.09	දිළිඳුකම පිටුදැකීම සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනක් සැකසීම (විශ්ව විද්‍යාල ආචාර්යවරුන් සමඟ පැවති වැඩමුළුව)
163	2016.12.15	තිරසර පාසල් වැඩසටහන පිළිබඳ සාකච්ඡාව
164	2016.12.16	තිරසර පාසල් වැඩසටහන පිළිබඳ සාකච්ඡාව
165	2016.12.21	විශ්ව විද්‍යාල සිසුන් වෙනුවෙන් පැවැත්වූ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන - කෑගල්ල දිස්ත්‍රික්කය
166	2016.12.21	මෙත්සිරි සෙවන ප්‍රගති සමාලෝචනය
167	2016.12.22	තිරසර පාසල් වැඩසටහන
168	2016.12.27	වකුගඩු රෝග නිවාරණ වැඩසටහනේ භෞතික හා මූල්‍ය ප්‍රගති සමාලෝචන රැස්වීම

මහජන සම්බන්ධතා අංශය

හැඳින්වීම

අතිගරු ජනාධිපතිතුමා වෙතට යොමුවන සියලුම මහජන හා රාජ්‍ය ආයතන වල සේවක ගැටලු හා ඉල්ලීම් අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතනවලට යොමු කර කඩිනම් සහන සැලසීම සඳහා ක්‍රියාත්මක වීම.

ප්‍රධාන කාර්යයන් / අරමුණු

- විද්‍යුත් තැපෑල, තැපැල හා දුරකථන ඇමතුම් හා ෆැක්ස් මඟින් ලැබෙන ලිපි මඟින් අතිගරු ජනාධිපතිතුමා වෙතට ඉදිරිපත් වන විවිධ ස්වරූපයේ මහජන ඉල්ලීම් සඳහා කඩිනම් ප්‍රතිචාර ලබාදෙමින් "ජනපතිට කියන්න"වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

- මහජන සම්බන්ධතා අංශයට සෘජුව පැමිණෙන මහජනතාවට කඩිනම් ප්‍රතිචාර ලබාදීම තුළින් ගැටලු විසඳීමට කටයුතු කිරීම.

- මහජන උද්ඝෝෂණ තුළින් අතිගරු ජනාධිපතිතුමාට ලබාදෙන සංදේශ සඳහා විසඳුම් ලබාදීමට රාජ්‍ය ආයතනවලට යොමු කර කඩිනම් ප්‍රතිචාර දැක්වීමට මැදිහත්වීම.

- සේවක ගැටලු කළමනාකරණය සඳහා සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කර ගනිමින් විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

- ජනපති ජංගම සේවය මඟින් ලැබෙන මහජන දුක්ගැනවිලි සඳහා කඩිනමින් ප්‍රතිචාර දැක්වීම.

2016 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම්

"ජනපතිට කියන්න" වැඩසටහන

පැමිණිලි ඉදිරිපත් වූ ආකාරය



පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය



- **මහජන සම්බන්ධතා අංශයට සෘජුව පැමිණෙන මහජනතාවගේ ගැටලු විසඳීමට කටයුතු කිරීම.**

මහජන සම්බන්ධතා අංශයට සෘජුව පැමිණෙන පුද්ගලයින් 4000 කට අධික සංඛ්‍යාවකගේ ගැටලු සඳහා ධනාත්මක ප්‍රතිචාර දැක්වීමට හැකිවිය.

- **මහජන උද්ඝෝෂණ තුළින් අතිගරු ජනාධිපතිතුමාට ලබාදෙන සංදේශ සඳහා විසඳුම් ලබාදීම**

2016 වසර තුළ වැටුප් වැඩිකර ගැනීම, බඳවා ගැනීම්, සේවයේ ස්ථීර කිරීම්, මුදල් තැන්පතු සම්බන්ධ ගැටලු, විශ්‍රාම සම්බන්ධ ගැටලු හා රණවිරු ගැටලු යන කාරණා සම්බන්ධයෙන් පැනනැගුණු මහජන උද්ඝෝෂණ සහ විරෝධතා 28 කට සාර්ථකව විසඳුම් ලබා දීමට කටයුතු කරන ලදී.

- **සේවක ගැටලු කළමනාකරණය සඳහා සියලුම අමාත්‍යාංශ/පළාත්සභා සම්බන්ධීකරණය කරමින් ක්‍රියාත්මක කරන විශේෂ වැඩසටහන**

සියලුම රාජ්‍ය ආයතන වල සේවක ප්‍රජාව සඳහා තම රාජකාරීමය ගැටලු හා දුක්ගැනවිලි සම්බන්ධයෙන් නොවිසඳී ඇති ඉල්ලීම් ඉදිරිපත් කිරීමට හා එම ඉල්ලීම් සම්බන්ධයෙන් ක්‍රියාකාරී වැඩපිළිවෙලක් මඟින් විසඳුම් ලබාදීම හෝ පැහැදිලි කිරීම් සඳහා අවස්ථාවක් ලබාදීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙහි ප්‍රථම පියවර ලෙස 2016.11.21 වන දින අතිගරු ජනාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවක ගැටලු විසඳීම සම්බන්ධ සේවක දිනයක් පවත්වන ලද අතර මෙහිදී සේවක ගැටලු විශාල ප්‍රමාණයක් ඉදිරිපත් විය. පළපුරුදු රාජ්‍ය නිලධාරීන්ගෙන් යුත් කමිටු 06 ක් යටතේ මෙම ගැටලු සඳහා විසඳුම් ලබාදීමට කටයුතු කරන ලදී.

- **ජනපති ජංගම සේවය මඟින් ලැබෙන මහජන දුක්ගැනවිලි සඳහා කඩිනමින් ප්‍රතිචාර දැක්වීම**

ජනාධිපති කාර්යාලය මඟින් පවත්වනු ලබන ජංගම සේවාවලදී අතිගරු ජනාධිපතිතුමා වෙත ලැබෙන මහජන ගැටලු හා ඉල්ලීම් අදාළ ආයතන වෙත යොමුකිරීමට මහජන සම්බන්ධතා අංශය මඟින් කටයුතු කරන ලදී.

මාධ්‍ය ඒකකය

හැඳින්වීම

අතිගරු ජනාධිපතිතුමාගේ/ජනාධිපති කාර්යාලයේ පැවැත්වෙන විශේෂ රැස්වීම් /සාකච්ඡා /උත්සව පිළිබඳ අනෙකුත් මාධ්‍ය ආයතන වෙත නිරවද්‍යතාවයෙන් හා වගකීමෙන් යුතුව තොරතුරු ලබා දීම

2016 වර්ෂයේදී සාක්ෂාත් කර ගැනීම්

අංශයේ / ඒකකයේ නම : කර්තෘ ඒකකය	
ක්‍රියාකාරකම / අයිතම	**ඉටු කරන කාර්යයන් පිළිබඳ විස්තර**
1. ජාතික වැඩසටහන් සංවිධානය කිරීම	• ජාතික පුවත්පත් හා විද්‍යුත් මාධ්‍ය ප්‍රධානීන් සමඟ සාකච්ඡාවක් සංවිධානය කිරීම. • පළාත් මට්ටමෙන් ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන් සමඟ සංවාදයක් ඇති කිරීමට කටයුතු කිරීම.
2. විශේෂ ව්‍යාපෘති -	• 2017 වසරට අදාළව ප්‍රකාශන 06 ක් සංස්කරණය කර ප්‍රකාශනයට පත්කිරීම.
3. දේශීය හා විදේශීය මාධ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම හා ප්‍රවෘත්ති නිවේදන නිකුත් කිරීම	• සියලු විදේශීය ප්‍රවෘත්ති ආයතන වෙත ගරු ජනාධිපතිතුමාගේ නිවේදන හා ප්‍රකාශන ලබාදීම හා විදේශීය ප්‍රවෘත්ති ආයතන මඟින් කරන ඉල්ලීම් පිළිබඳ ගරු ජනාධිපතිතුමා දැනුවත් කිරීම.
4. ගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිරූපය ගොඩනැංවෙන ආකාරයට ගරු ජනාධිපතිතුමා සහ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ විශේෂාංග ලිපි/ ප්‍රකාශන පළ කිරීම	• මොරගහකන්ද වැනි විශේෂ සංවර්ධන වැඩසටහන් පිළිබඳ ජනමාධ්‍යවේදීන් දැනුවත් කිරීම සඳහා ජනමාධ්‍යවේදීන් එම ස්ථාන වෙත නිරීක්ෂණ චාරිකා රැගෙන යාම හා ලිපි සකස් කිරීම.
5. දෛනික වාර්තාකරණය	• සියලුම රූපවාහිනී/ගුවන්විදුලි හා පුවත්පත් සඳහා ජනාධිපතිතුමා විසින් සිදුකරන කාර්යභාරය පිළිබඳ දැනුවත් කිරීම, අවශ්‍ය තොරතුරු ලබාදීම, නිවේදන නිකුත් කිරීම.

අංශයේ / ඒකකයේ නම : කර්තෘ ඒකකය	
ක්‍රියාකාරකම / අයිතම	**ඉටු කරන කාර්යයන් පිළිබඳ විස්තර**
6. වැඩමුළු / පුහුණු වැඩසටහන් (ධාරිතා සංවර්ධන)	• කර්තෘ ඒකකයේ මාධ්‍යවේදීන් ඇතුළු සෙසු නිලධාරීන්ගේ කාර්යසාධනය හා වෘත්තීය දැනුම වර්ධනය සඳහා විශේෂඥ මට්ටමේ පිරිස් කැඳවා සම්මන්ත්‍රණ පැවැත්වීම.
7. දෛනික දේශීය හා විදේශීය මාධ්‍ය මඟින් ශ්‍රී ලංකාව පිළිබඳව ප්‍රචාරය කර ඇති ප්‍රවෘත්ති පිළිබඳ ජනාධිපතිතුමා දැනුවත් කිරීම	• මේ පිළිබඳ වන විශේෂ වාර්තා සතිපතා හා අවශ්‍ය වන සෑම අවස්ථාවකදීම ගරු ජනාධිපතිතුමා වෙත යොමුකිරීම.
8. ගරු ජනාධිපතිතුමාගේ කථා සහ දේශන සඳහා අවශ්‍ය දත්ත රැස් කිරීම	• ජනාධිපතිතුමා සහභාගීවීමට නියමිත සෑම උත්සව අවස්ථාවක් සඳහාම ඊට අවශ්‍ය වියහැකි තොරතුරු හා පසුබිම් වාර්තා යොමුකිරීම.

අංශයේ / ඒකකයේ නම : වෙබ් අඩවි පරිපාලන ඒකකය	
ක්‍රියාකාරකම / අයිතම	**ඉටු කරන කාර්යයන් පිළිබඳ විස්තර**
1. ගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිරූපය ගොඩනැංවෙන ආකාරයට ගරු ජනාධිපතිතුමා සහ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ විශේෂාංග ලිපි/ ප්‍රකාශන පළ කිරීම	සෑම ව්‍යාපෘතියක් සඳහාම වෙබ් අඩවිවල ලිපි සහ ප්‍රවෘත්ති පළ කිරීම. ගරු ජනාධිපතිතුමාගේ විශේෂ උත්සව අන්තර්ජාල සජීවී විකාශනය ආරම්භ කිරීම.
2. විශේෂිත සම්මන්ත්‍රණ සහ සාකච්ඡා ආදිය පැවැත්වීම	අන්තර්ජාල භාවිතා කරන ශ්‍රීලනිප සාමාජිකයන් වෙනුවෙන් වැඩමුළු දෙකක් සංවිධානය කිරීම.
3. වෙනත්	ගරු ජනාධිපතිතුමා සමඟ සුහදත්වය වර්ධනයට මාධ්‍ය ආයතන සහ කර්තෘන් සමඟ සුහද හමු පැවැත්වීම හා රජයේ දූර්වලතැන් සොයා ගවේශන මාධ්‍යකරණයේ යෙදීම සිදු කිරීම.

අංශයේ / ඒකකයේ නම : ඡායාරූප අංශය	
ක්‍රියාකාරකම / අයිතම	**ඉටු කරන කාර්යයන් පිළිබඳ විස්තර**
1. දේශීය හා විදේශීය මාධ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම හා ප්‍රවෘත්ති නිවේදන නිකුත් කිරීම	ගරු ජනාධිපතිතුමා හා රටේ සංවර්ධනය පිළිබඳ ප්‍රවෘත්ති නිවේදන හා සම්බන්ධ ඡායාරූප යැවීම.
2. ගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිරූපය ගොඩනැංවෙන ආකාරයට ගරු ජනාධිපතිතුමා සහ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ විශේෂාංග ලිපි/ ප්‍රකාශන පළ කිරීම	ගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිරූපය ගොඩනැංවෙන අයුරින් දිවුරුම් දුන් අවස්ථාවේ සිට මේ දක්වා ඡායාරූප හා 2016 වර්ෂයේ ආරම්භ කරන ලද හා අවසන් කරනු ලැබූ ගරු ජනාධිපතිතුමා සහභාගී වූ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ විශේෂ ඡායාරූප පිටු පුවත්පත් සහ සඟරා වල පළ කිරීම හා වෙබ් අඩවි වලට ලබාදීම.
3. ප්‍රදර්ශන	ගරු ජනාධිපතිතුමා දිවුරුම් දුන් මොහොතේ සිට 2016 ජනවාරි 8 දක්වා වූ සියලු ඡායාරූප හා රටේ සංවර්ධනය පිළිබඳ සකස් කරන ලද ඡායාරූප එකතු කර ඡායාරූප ප්‍රදර්ශනයක් පැවැත්වීම.
4. වැඩමුළු / පුහුණු වැඩසටහන් (ධාරිතා සංවර්ධන)	ඡායාරූප ශිල්පීන්, සංස්කරණ ශිල්පීන් හා සහය ශිල්පීන් වෙනුවෙන් විශේෂ පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

අංශයේ / ඒකකයේ නම : ජාත්‍යන්තර මාධ්‍ය හා පර්යේෂණ අංශය	
ක්‍රියාකාරකම / අයිතම	**ඉටු කරන කාර්යයන් පිළිබඳ විස්තර**
1. ජාතික වැඩසටහන් සංවිධානය කිරීම	• පෙබරවාරි 04 නිදහස් දින සියලුම සංවිධාන කටයුතු, සජීවී විකාශය ඇතුළු සියලුම මාධ්‍යය කටයුතු මෙහෙයවීම. • ජාත්‍යන්තර මාධ්‍යය හා තානාපති නිලධාරීන් සම්බන්ධීකරණය කිරීම. • BMICHහි පැවති **'තිරසර යුගයක තෙවසරක ඇරඹුම'** උළෙලේ ප්‍රධාන අමුත්තා ඇතුළු දේශකයින් සහ සංස්කෘතිකාංග පිළිබඳ සම්බන්ධීකරණය කිරීම.
2. විශේෂ ව්‍යාපෘති -	• ග්‍රාම ශක්ති වැඩසටහන රටපුරා ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම. • තිරසර සංවර්ධන පාසල් සමාජ පිහිටුවීම.
3. දේශීය හා විදේශීය මාධ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම හා ප්‍රවෘත්ති නිවේදන නිකුත් කිරීම	• සියලුම මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යය ආයතන සමඟ සෘජු සබඳතා පවත්වා ගැනීම. • දිනපතා ප්‍රවෘත්ති සහ වීඩියෝ පටි සම්පාදනය සහ මාධ්‍යය වෙත නිකුත් කිරීම. • ප්‍රවෘත්ති නිවේදන සම්පාදනය සහ බෙදාහැරීම සිදු කිරීම. • ජනාධිපතිතුමාගේ පණිවිඩ මාධ්‍යය ආයතන වෙත නිකුත් කිරීම.
4. ගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිරූපය ගොඩනැංවෙන ආකාරයට ගරු ජනාධිපතිතුමා සහ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ විශේෂාංග ලිපි/ ප්‍රකාශන පළ කිරීම	• ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති හා ඒවා ක්‍රියාවට නැංවෙන ආකාරය සම්බන්ධව පුවත්පත්වලට විශේෂාංග ලිපි සම්පාදනය කිරීම • මාධ්‍යය වෙත ඒවා නිකුත් කිරීම හා ඒවා මාධ්‍යයන්හි පළ කෙරෙන බවට සහතික කිරීම සම්බන්ධීකරණය.
5. විශේෂිත සම්මන්ත්‍රණ සහ සාකච්ඡා ආදිය පැවැත්වීම	• ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති වලට අනුකූල දේශපාලන, සමාජීය, ආර්ථික සහ තාක්ෂණික තේමාවන් තෝරා ගෙන මසකට වරක් බැගින් විශේෂිත සම්මන්ත්‍රණ හා වට මේස සාකච්ඡා පැවැත්වීම.
6. ප්‍රදර්ශන	• ජනපති පදවිප්‍රාප්ත උළෙල සඳහා ඡායාරූප ප්‍රදර්ශන සහ කාටූන් ප්‍රදර්ශන සංවිධානය • මෙවැනි ප්‍රදර්ශන ප්‍රාදේශීය වශයෙන් ද සංවිධානය කිරීම.
7. දෛනික වාර්තාකරණය	• ජනාධිපතිතුමා සහභාගී වන සියලු උත්සව, සාකච්ඡා, රැස්වීම් ආවරණය කර ඒ පිළිබඳ වාර්තා සම්පාදනය කිරීම සහ ඒවා මාධ්‍ය වෙත බෙදාහැරීම.
8. වැඩමුළු / පුහුණු වැඩසටහන් (ධාරිතා සංවර්ධන)	• මාධ්‍යය අංශයේ හැකියා වර්ධනය උදෙසා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සහ තානාපති කාර්යාල වල සහයෝගීතාව තුළින් වැඩමුළු හා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.

ක්‍රියාකාරකම / අයිතම	**ඉටු කරන කාර්යයන් පිළිබඳ විස්තර**
9. දෛනික දේශීය හා විදේශීය මාධ්‍ය මඟින් ශ්‍රී ලංකාව පිළිබඳව ප්‍රචාරය කර ඇති ප්‍රවෘත්ති පිළිබඳ ජනාධිපතිතුමා දැනුවත් කිරීම	• දිනපතා මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යය විමර්ශනය කර ශ්‍රී ලංකාව පිළිබඳ ප්‍රවෘත්ති විශ්ලේෂණයක් ජනාධිපතිතුමා වෙත යැවීම. • සති අන්ත පුවත්පත් විශ්ලේෂණය කර විශ්ලේෂණාත්මක ව සම්පාදනය කළ අංග සම්පූර්ණ වාර්තාවක් සෑම සඳුදා දිනකම යැවීම.
10. ගරු ජනාධිපතිතුමාගේ කථා සහ දේශන සඳහා අවශ්‍ය දත්ත රැස් කිරීම	• ජනාධිපතිතුමාගේ කථා සඳහා අවශ්‍ය තොරතුරු පිළිබඳ පර්යේෂණ පවත්වා සෑම කථාවකටම අවශ්‍ය සංක්ෂිප්ත තොරතුරු සහිත වාර්තාවක් දිනපතා සැපයීම.
11. වෙනත්	• ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති වලට අනුකූල ලෙස මැති ඇමතිවරුන් ඇතුළු කතිකයන් තෝරා ගෙන ශ්‍රී.ල.නි.ප. මාධ්‍යය සාකච්ඡා සංවිධානය කිරීම.

අංශයේ / ඒකකයේ නම : වීඩියෝ ඒකකය

ක්‍රියාකාරකම / අයිතම	**ඉටු කරන කාර්යයන් පිළිබඳ විස්තර**
1. විශේෂ ව්‍යාපෘති -	• ගරු ජනාධිපතිතුමන් සහභාගී වන සියලුම උත්සවවල මාධ්‍ය ආවරණයන් සිදු කර එහි දර්ශන සියලු නාලිකා වෙත (දේශීය හා විදේශීය) FTP හෝ කැසට්පට මාර්ගයෙන් ලබාදීම. • ගරු ජනාධිපතිතුමන් සහභාගී වූ උත්සවයන්හි වැදගත් වැඩසටහන් වාර්තා වැඩසටහන් වශයෙන් සකසා සියලු නාලිකාවන්ගේ ප්‍රචාරය කිරීම. • ගරු ජනාධිපතිතුමන් සහභාගී වන විදේශ සංචාරවලට අදාළ වාර්තා වැඩසටහන් නිර්මාණය කොට නාලිකාවන් හි ප්‍රචාරයට ලබාදීම. • ගරු ජනාධිපතිතුමන් යටතේ ඇති අමාත්‍යාංශවලට අදාළ වාර්තා වැඩසටහන් නිෂ්පාදනය කොට මාධ්‍ය නාලිකාවන් හි ප්‍රචාරය කිරීම. • සත් දින මතකය වාර්තා වැඩසටහන නිෂ්පාදනය කිරීම. • ගරු ජනාධිපතිතුමාගේ දර්ශන පුස්තකාලගත කිරීම හා ජාතික ලේඛනාගාර දෙපරේතමේන්තුවට යැවීම.

10 - CM 25284

ක්‍රියාකාරකම / අයිතම	**ඉටු කරන කාර්යයන් පිළිබඳ විස්තර**
විශේෂ ව්‍යාපෘති - (සම්බන්ධිතයි)	• ගරු ජනාධිපතිතුමා සහභාගීවන උත්සව වල O/B බසය සවිකරන්නේ නම් එම උත්සවයේ සියලු දර්ශන Face Book , You Tube සහ New Media වෙත ලබාදීම. • ගරු ජනාධිපතිතුමාගේ අවධානය යොමු විය යුතු ගැටලු රූපගත කොට ජනතාවගේ අදහස් සමඟින් වාර්තාමය වැඩසටහන් වශයෙන් සකස් කර ගරු ජනාධිපතිතුමාගේ අවධානයට යොමු කරවීම. • දිනපතා රූපගත කරන ගරු ජනාධිපතිතුමාගේ සහ මැති ඇමතිවරුන්ගේ දර්ශන වෙන වෙනම පුස්තකාලගත කිරීම. • ගරු ජනාධිපතිතුමා පිළිබඳ සැකසූ වාර්තා වැඩසටහන් මාධ්‍ය අංශයේ සවිකර ඇති අමුත්තන් පැමිණෙන ස්ථානයේ ඇති රූපවාහිනියේ විකාශනය කිරීම.
2. වැඩමුළු / පුහුණු වැඩසටහන් (ධාරිතා සංවර්ධන)	• මාධ්‍ය ක්ෂේත්‍රයේ සිටින ප්‍රවීන ශිල්පීන් මඟින් මාධ්‍ය අංශයේ වීඩියෝ කැමරා ශිල්පීන්, සංස්කරණ ශිල්පීන් සහ සහාය ශිල්පීන් නව තාක්ෂණය පිළිබඳ දැනුම්වත් කිරීම.
3. වෙනත්	• ඩ්‍රෝන යාත්‍රා මඟින් රූපගත කොට මොරගහකන්ද ජලාශය පිළිබඳව දර්ශන ලබා ගැනීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රයෝජනයට ගැනීම සඳහා ඒවා ගබඩා කොට තබා ගැනීම •

ප්‍රතිසන්ධාන අංශය

හැඳින්වීම

ප්‍රතිසන්ධාන අංශය ආරම්භ කරන ලද්දේ 2015 ජුනි මස සිට ක්‍රියාත්මක වන පරිදිය. සෑම පුරවැසියකුටම සමාන අවස්ථාවන් සැලසෙන, විවිධත්ව හා ජාතික අනන්‍යතාවයට ගරු කරන එකමුතුභාවයෙන් ජීවත් වියහැකි ස්ථාවර දේශයක් ගොඩනැගීමත්, මූලික මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කර ගනිමින් ජාතික සමගිය හා සංහිඳියාව ඇතිකිරීමේ ක්‍රියාවලියට අදාළව කටයුතු කිරීමට මූලික දායකත්වයක් ලබා දීම මෙම අංශයේ ප්‍රධාන කාර්ය භාරය වේ. මෙම අංශය ජනාධිපති කාර්යාලයේ මහ පෙන්වීම මත හිටපු ජනාධිපතිනි ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ මෙහෙයවීම හා මගපෙන්වීම යටතේ ක්‍රියාත්මක වේ.

ප්‍රධාන අරමුණු

- ජාතික සමගිය හා සංහිඳියාව ඇති කිරීම සඳහා විවිධ ජාතීන් හා ආගමික නායකයන් ,සිවිල් සමාජය නියෝජනය කරනු ලබන සංවිධාන සහ ජාතික, පළාත් සභා සහ ප්‍රාදේශීය දේශපාලන නායකයින් සමඟ සාකච්ඡා පවත්වා ඉහත කී කාර්යයන් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම

2016 වර්ෂයේ සාක්ෂාත් කරගැනීම්

- කැබිනට් අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් සභා සහ පළාත් පාලන ආයතන නියෝජිතයින්, සිවිල් සමාජය නියෝජනය කරන ආයතන, විවිධ ආගමික නායකයින්, ප්‍රජා මූලික සංවිධාන සමඟ හා විදේශ තානාපති නිලධාරීන්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිතයින්, ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව නියෝජිතයින් සහ වෙනත් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයින් සාකච්ඡා වට කිහිපයක් පවත්වා සාකච්ඡා කිරීම
- ශ්‍රී ලංකාවාසී පොදු මහජනතාවගෙන්ද, විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, හා වෙනත් ආයතනවලින් ලැබෙන ලිපිවලට ලබා දීම සහ අදාළ අමාත්‍යාංශ හා ආයතනවලට යොමු කිරීමත්, එමෙන්ම දුරකථන මාර්ගයෙන් ලැබෙන පණිවිඩවලට අදාළව එම පුද්ගලයින් හා ආයතන සමඟ සාකච්ඡා කර පිළිතුරු ලබා දීම
- 2016 ජනවාරි මස සිට දෙසැම්බර් දක්වා මෙම අංශය වෙත ලිපි 4000 කට අධික ප්‍රමාණයක් ලැබී ඇති අතර, එම ලිපිවලට පිළිතුරු නොපමාව සැපයීම

තොරතුරු තාක්ෂණ ඒකකය

හැඳින්වීම

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය, අභ්‍යන්තර පාලන අංශය යටතේ පවතින අතර ජනාධිපති කාර්යාලය හා ඊට අනුබද්ධිත සියලුම ස්ථානවල පරිගණක, දුරකථන සහ අනෙකුත් තාක්ෂණික උපකරණ නඩත්තු කටයුතු, වෙබ් අඩවි හා මෘදුකාංග නිර්මාණ කටයුතු , ජාලකරණ කටයුතු ආදිය සිදුකරනු ලබයි.

ජනාධිපති කාර්යාලයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය මඟින් 2016 වර්ෂයේ දී සිදු කිරීම ආරම්භ කර ඇති කාර්යයන් සහ ඒවායේ ප්‍රගතිය පහතින් දක්වා ඇත.

01. ජනාධිපති කාර්යාලයේ ජාලකරණ පද්ධතිය විධිමත් කිරීම.

2016 වර්ෂය අවසානයේ දී මෙම කාර්යයෙන් 90% ක් සම්පූර්ණ කළ අතර 2017 වසර මැද භාගය වන විට මෙය අවසන් කිරීමට බලාපොරොත්තු වේ.



02. ජනාධිපති කාර්යාලයේ ජාලකරණ පද්ධතිය පිළිබඳ සම්පූර්ණ වාර්තාගත කිරීම.

2016 වර්ෂයේ දී ජනාධිපති කාර්යාලයේ ආරම්භ කරන ලද"upgrading the infra-structure at the Presidential Secretariat"ව්‍යාපෘතිය මඟින් මෙම කාර්යය නිම කිරීමට බලාපොරොත්තු වූ අතර ඉන් 95%ක් පමණ 2016 වර්ෂයේ දී නිම කර ඇත. එහි අවසන් අදියරෙහි වැඩ කටයුතු 2017 වර්ෂයේ මැද භාගයේ දී සිදුවේ.



03. මෘදුකාංග පද්ධති සහ වෙබ් සර්වර් (Web Server) යන්ත්‍ර සඳහා උපස්ථ පද්ධති ස්ථාපිත කිරීම.

2016 වසරේ දී මෙම කාර්යය නිම කර ඇත.

04. Cloud Based සර්වර් යන්ත්‍රයක් චාර්ටර්ඩ් බැංකු ගොඩනැගිල්ලේ පිහිටි සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශයේ ස්ථාපිත කිරීම.

මෙම කාර්යය 2016 වර්ෂයේ දී සම්පූර්ණ කරන ලද අතර සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය විසින් මෙම පහසුකම දැනට භාවිතා කරනු ලැබේ.

එසේම ප්‍රතිපත්ති සම්බන්ධීකරණ හා ප්‍රගති සමාලෝචන අංශය සඳහා ද මෙම පහසුකම සලසා දී ඇත.

05. සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශයට Proxy සර්වර් යන්ත්‍රයක් ස්ථාපිත කිරීම.

2016 වර්ෂයේ දී මෙම කාර්යය සම්පූර්ණ කරන ලද අතර එම අංශය මඟින් මෙම සර්වර් යන්ත්‍රය තම එදිනෙදා කාර්යයන් සඳහා යොදා ගනු ලැබේ.

06. ජනාධිපති කාර්යාලයට අනුබද්ධිත සියලුම ස්ථානවල ජාලකරණ පද්ධතිය සම්පූර්ණ වාර්තාගත කිරීම.

ජනාධිපති කාර්යාලයේ සිදුකරනු ලබන"upgrading the infrastructure at the Presidential Secretariat"ව්‍යාපෘතිය මඟින් මෙම කාර්යයෙන් 60% ක් සම්පූර්ණ කර ඇත.



07. Cloud Based File සර්වර් යන්ත්‍රයක් ජනාධිපති කාර්යාලයේ ස්ථාපිත කිරීම.

මෙම වර්ගයේ සර්වර් යන්ත්‍ර සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශයේ සහ ප්‍රතිපත්ති සම්බන්ධීකරණ හා ප්‍රගති සමාලෝචන අංශය සඳහා ස්ථාපිත කර ඇත. දැනට මෙම අංශ විසින් උක්ත පහසුකම භාවිතා කරනු ලබයි.

08. ජනාධිපති කාර්යාලයේ මානව සම්පත් කළමනාකරණ පද්ධතිය විධිමත් කර යාවත්කාලීන කිරීම.

මෙම කාර්යයෙන් 95% ක් සම්පූර්ණ කරන ලදී. මෙම මෘදුකාංග පද්ධතිය සඳහා දත්ත ඇතුළත් කරමින් පවතින අතර 2017 වර්ෂය මැද භාගයේ දී මෙය නිම කිරීමට කටයුතු යොදා ඇත.



09. ජනාධිපති කාර්යාලයේ නිල වෙබ් අඩවිය නවීකරණය කර එහි දත්ත යාවත්කාලීන කිරීම.

මේ සඳහා නව වෙබ් අඩවියක් නිර්මාණය කිරීම ආරම්භ කළ අතර එහි කාර්යයන්ගෙන් 80% ක් සම්පූර්ණ කර ඇත.



10. මහජන සම්බන්ධතා අංශයේ ඇති ලිපි කලමනාකරණ පද්ධතිය යාවත්කාලීන කිරීම.

"ජනපතිට කියන්න" ව්‍යාපෘතිය යටතේ මහජන සම්බන්ධතා අංශය සඳහා නව ලිපි කලමනාකරණ පද්ධතියක් හඳුන්වා දී ඇති අතර පෙර පැවති ලිපි කලමනාකරණ පද්ධතිය සමඟ මෙම නව පද්ධතිය සම්බන්ධ කරමින් රාජකාරී කටයුතු වඩා කාර්යක්ෂම අයුරින් පවත්වාගෙන යනු ලැබේ.

තව ද "ජනපතිට කියන්න" වැඩසටහන සඳහා වෙනම දුරකථන හුවමාරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ලැබෙන දුරකථන ඇමතුම් සඳහා වඩා හොඳ සේවාවක් ලබා දීමට කටයුතු කර ඇත.

11. ජනාධිපති කාර්යාලය හා ඊට අනුබද්ධිත ස්ථානවල නියුතු නිලධාරීන් සඳහා පරිගණක පුහුණු වැඩසටහනක් ආරම්භ කිරීම.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය මඟින් ජනාධිපති කාර්යාලය හා ඊට අනුබද්ධිත ස්ථානවල නියුතු නිලධාරීන්ට පරිගණක ක්‍රියාකාරීත්වය පිළිබඳ මූලික පුහුණුවක් ලබාදීමට කටයුතු කරන ලද අතර ඉදිරියේ දී ඒ සඳහා අවශ්‍ය teaching materials Microsoft ආයතනයෙන් ලබාගෙන 2017 වසර මැදභාගයේ දී ජනාධිපති කාර්යාලය ඇතුළු සියළුම ස්ථානවල නිලධාරීන්ට පරිගණක පුහුණු පාඨමාලා පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇත.

12. පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයෙහි (ඔම්බුඩ්ස්මන්) පරිගණක පද්ධතිය සහ වෙබ් අඩවිය නිර්මාණය කිරීම.

ඔම්බුඩ්ස්මන් කාර්යාලය සඳහා වෙබ් අඩවිය නිර්මාණය කිරීම මේ වන විට සම්පූර්ණ කර ඇති අතර ඒ සඳහා පෙත්සම් කළමනාකරණ පද්ධතියක් සකස් කර එයට දත්ත ඇතුළත් කිරීම සඳහා එම කාර්යාලයට භාර දී ඇත.

13. ප්‍රවාහන අංශය සඳහා මෘදුකාංග පද්ධතියක් නිර්මාණය කිරීම.

ජනාධිපති කාර්යාලයේ ප්‍රවාහන අංශයේ සියළු තොරතුරු ඇතුළත් කිරීම සඳහා නව පරිගණක පද්ධතියක් නිර්මාණය කිරීමේ මූලික කටයුතු මේ වන විට අවසන් කර ඇති අතර 2017 වර්ෂය මැදභාගය වන විට මෙය සම්පූර්ණයෙන් අවසන් කිරීමට බලාපොරොත්තු වේ.

ප්‍රවාහන ඒකකය

හැඳින්වීම

ජනාධිපති කාර්යාලයේ ප්‍රවාහන ඒකකය සතු කාර්යයන් සම්බන්ධයෙන් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව කටයුතු කිරීම

ප්‍රධාන කාර්යයන් / අරමුණු

- ගරු ජනාධිපතිතුමන්ට අනුයුක්ත රථ වාහන වලට අදාළ සියලු කටයුතු සිදු කිරීම.
- දෛනික ප්‍රවාහන සේවාවන් සැපයීම.
- ජනාධිපති කාර්යාලයට අයත් සියලු රථවාහන නඩත්තු කිරීම.
- ජනාධිපති කාර්යාලය සතු රථවාහන වලට අදාළ රක්ෂණය, ආදායම් බලපත්‍ර, දුම් පරීක්ෂණ වාර්තා ලබා ගැනීම.
- රිය අනතුරු සඳහා රක්ෂණ වන්දි ලබා ගැනීම.
- ඉන්ධන ඇණවුම් නිකුත් කිරීම, ඉන්ධන ඇණවුම් ගෙවීම් කටයුතු සඳහා නිවැරදිතාවය පරීක්ෂා කර වවුචර් පිළියෙල කර ගිණුම් අංශයට ඉදිරිපත් කිරීම.
- වාහන අළුත්වැඩියාවන් සහ අදාළ සේවාවන් සඳහා වන බිල්පත් පරීක්ෂා කර ගෙවීම් කටයුතු වෙනුවෙන් ඉදිරිපත් කිරීම.
- ඉන්ධන නිකුත් කිරීම් වලට අදාළව ධාවන සටහන් පරීක්ෂා කිරීම සහ ඉන්ධන පිරිවැය නිසි කළමනාකරණයක් තුළින් පවත්වාගෙන යාම.
- රථවාහන වට්ටෝරු ලේඛණය පවත්වාගෙන යාම, පවරා ගැනීම, පවරා දීම, අපහරණය කිරීම.
- ජනාධිපති කාර්යාලය වෙත බඳවා ගනු ලබන නවක රියදුරන් පුරප්පාඩු පවතින අදාළ අංශ සඳහා ඉදිරිපත් කිරීම

01. කාර්යය මණ්ඩලය

- රාජ්‍ය සේවයට බැඳුණු නවක නිළධාරීන් හා වෙනත් රාජ්‍ය ආයතනවලින් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ස්ථාන මාරුවීම් ලැබ පැමිණි නිළධාරීන්ගෙන් සමන්විතය. ඒ අනුව දැනට කාර්යාලීය කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු දෙකක් හැර අනෙක් පුරප්පාඩු සම්පූර්ණ කර ඇති අතර, ඔවුනට අවශ්‍ය පුහුණුවීම් මානව සම්පත් සංවර්ධන අංශයෙන් සංවිධානය කරනු ලැබේ. රියදුරු කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු ගණනාවක් ඇතිවී තිබෙන අතර ඒ සඳහා නව බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු කරමින් පවතින බව සඳහන් කරමි.
- එසේම දැනට රියදුරු කාර්යය මණ්ඩලයද නවක රියදුරන් සහ රාජ්‍ය සේවයේ වෙනත් ස්ථාන වලින් ජනාධිපති ලේකම් කාර්යාලයට ස්ථාන මාරුවීම් ලැබ පැමිණි රියදුරන්ගෙන් සමන්විතය. සියලු රියදුරන් සඳහා ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස

ආයතනයේ සහ වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණු වැඩසටහන් පවත්වන ලදී. තාක්ෂණික හා මාර්ග නීති පිළිබඳ දැනුමට අමතරව ධනාත්මක චින්තනය හා මානසික ආතති පාලනය පිළිබඳ වැඩමුළු ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පවත්වන ලදී. මෙම සියලු පුහුණු සැසි අවසානයේ සහභාගි වූවන්ගෙන් ලැබූ ප්‍රතිචාර ඉතා යහපත් විය.

- රථවාහන හදිසි අනතුරු සඳහා වන්දි ලබාගැනීමේදී අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග පිළිබඳව රියදුරන් සහ අධීක්ෂණ කාර්යය මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩමුළු දෙකක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සහයෝගයෙන් 2016 අගෝස්තු 22 හා 23 දෙදින තුල පවත්වන ලදී. මීට අමතරව රිය අනතුරු සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම සඳහා ආරක්ෂක ලේකම්ගේ උපදෙස් යටතේ යුධ හමුදා නිළධාරීන්ගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් පත්කිරීමට කටයුතු කර ඇත.
- රාත්‍රී සේවය නිමකරන රියදුරන් සඳහා විවේක ගැනීමට ඇති ඉඩකඩ ප්‍රමාණවත් නොවූ අතර දහවල් කාලයේ රියදුරන්ට රැඳී සිටීමට සුදුසු ස්ථානයක් නොතිබිණි. ඒ සඳහා සුදුසු ආකාරයට සකස් කළ බහලුම් දෙකක් (Containers)ස්ථාපිත කරන ලදී.
- කාර්මික නිලධාරීන් දෙදෙනාටද රාජකාරි සඳහා බහලුමක ඉඩකඩ ලබා දී ඇත.

02. සේවා සැපයීම

- දැනට ප්‍රවාහන අංශය සතු භෞතික හා මානව සම්පත් උපයෝගී කොට ගෙන සතුටුදායක සේවාවක් ලබා දෙන අතර, 2016 මැයි මස රියදුරන් 86 දෙනකු ස්ථාන මාරුවීම් කරන ලද දිනයේ පමණක් සේවා සැපයීම අඩාල වූ නමුත්, එක් දිනයක් තුල හැකි උපරිමයෙන් සේවාව සැපයීමට අප කාර්යය මණ්ඩලයට හැකි විය. දැනට කාර්යය මණ්ඩලයේ රියදුරන් 30ක පමණ පුරප්පාඩු පවතී. මෙම තත්ත්වය මත රියදුරු පුරප්පාඩු හේතුවෙන් දැනට අනුයුක්ත රියදුරන්ගේ නිවාඩු ඉල්ලීම් පාලනය කිරීමට සිදුවී ඇත.

03. කාර්යාලය නවීකරණය

- කාර්යාලය විධිමත් අයුරින් සැකසීමේ කටයුතු අවසන් කර ඇති අතර, එම කටයුතු අවසන් වූ පසු ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් නිර්මාණය කළ පරිගණක මෘදුකාංගයක් ජනාධිපති කාර්යාලයේ තොරතුරු සන්නිවේදන අංශයේ සහායෙන් ස්ථාපිත කර ඇත. එම පරිගණක මෘදුකාංගය සඳහා දත්ත ඇතුළත් කිරීම හා පරීක්ෂණ අදියරේ භාවිතය ආරම්භ කර ඇත. පරිගණක පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමෙන් කළමනාකරණ තීරණ ගැනීමට අවශ්‍ය වාර්තාවන් ලබා ගැනීම, කඩදාසි භාවිතය අඩුකිරීම හා දෛනික කාර්යයන් කාර්යක්ෂම කිරීමට අපේක්ෂා කෙරේ.

04. රථවාහන අලුත් වැඩියා කටයුතු

- රථවාහන අලුත්වැඩියා කටයුතු වලට යොමු කිරීමේදී වාහන තාක්ෂණික නිළධාරීන්ගේ පූර්ව අධීක්ෂණයකින් පසු යොමු කරන බැවින් අනවශ්‍ය අළුත්වැඩියාවන් සඳහා ඉල්ලීම් පාලනය කර ඇත. අළුත්වැඩියාවන් ඉටුකළ පසුවද වාහන පරීක්ෂාවන්ට ලක්කර ඉවත් කළ අමතර කොටස් නැවත භාරගෙන ගබඩා කිරීමට කටයුතු කර ඇත.

05. ඉන්ධන පරිභෝජනය

- වෙනත් වර්ෂ වලට සාපේක්ෂව ඉන්ධන පරිභෝජනය සතුටුදායක මට්ටමකට අඩුකර ගැනීමට හැකිවී ඇත. එම විස්තර පහත දක්වා ඇත.

වර්ෂය	ඉන්ධන වියදම (රු)
2014	350,000,000.00
2015	120,000,000.00
2016	140,000,000.00

(ඉහත ගෙවීම් මේ වනවිට ගෙවීම් කටයුතු සඳහා ගිණුම් අංශය වෙත ඉදිරිපත් කර ඇති බිල්පත් සහිත වවුචර් වලට අදාළව ආසන්නතම වශයෙන් ගණනය කර ඇත.)

- 2015 වර්ෂයට පෙර ජනාධිපති කාර්යාලය මිළට ගත් රුපියල් ලක්ෂ 16.5 ක් පමණ වටිනා කුපන්පත් ප්‍රයෝජනයට නොගෙන ඉතිරිව තිබිණ. එම කුපන්පත් 2016 වර්ෂය තුලදී සංචිතයේ වාහන සඳහා භාවිතා කරන ලදී.

06. රථවාහන හදිසි අනතුරු හා රක්ෂණ වන්දි ලබාගැනීමේ ප්‍රගතිය

- හදිසි අනතුරු වල වැඩිවීමක් දක්නට ඇති බැවින්, එම අනතුරු වලට අදාළව නිසි පරිදි පරීක්ෂණ කටයුතු සිදු කර, වග කිවයුතු රියදුරන්ට විරුද්ධව විනයානුකූලව පියවර ගැනීමට සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මඟින් නොමිලයේ සම්මන්ත්‍රණ සැසි 02 ක් කඩිනමින් පැවැත්වීමට පියවර ගෙන ඇත.
  රක්ෂණ වන්දි පහත පරිදි ලබා ගෙන ඇත. (දළ වශයෙන් ගණනය කර ඇත)

වර්ෂය	ලැබුණු මුදල (රු)
2016 වර්ෂයට පෙර සිදු වූ රිය අනතුරු වෙනුවෙන් 2016 වර්ෂයේදී ලද වන්දි	16,000,000.00
2016 වර්ෂය තුල සිදු වූ රිය අනතුරු වෙනුවෙන් 2016 වර්ෂයේදී ලද වන්දි	15,000,000,00

- පසුගිය වර්ෂවල (2014 සහ ඊට පෙර) ලබා නොගත් රක්ෂණ වන්දි සහ ජනාධිපති ලේකම් නමට චෙක්පත් ලැබී අදාළ ගරාජ වලට ගෙවා නිරවුල් නොකළ රක්ෂණ වන්දි විශාල සංඛ්‍යාවක් තිබූ බව හෙලි විය. එයින් ගැටළු සහගත කිහිපයක් හැර සියල්ලම පාහේ දැනට නිරවුල් කර ඇත.
- කාර්ය සාධන ඇගයීමේදී සහ වැටුප් වර්ධක ලබා දීමේදී නොසැලකිලිමත් රිය ධාවනය, නිර්ණායකයක් ලෙස සැලකීමට ජනාධිපති ලේකම්තුමා උපදෙස් දී ඇත.

07. අධි ආරක්ෂිත වාහන

- අධි ආරක්ෂිත රථ නවීකරණය කර සාමාන්‍ය භාවිතයට ගත නොහැකි බැවින්, විකිණීමට හෝ පෞද්ගලික පරිහරණයට පවරාදිය නොහැක. එම රථ විනාශ කිරීමට හෝ පිළිගත් ක්‍රමවේදයන්ට අනුකූලව සාගර පරිසරයට හානිය අවම ලෙස ගැඹුරු මුහුදේ ගිල්වීම මේ දක්වා පැවති ක්‍රමවේදයයි. මීට අමතරව මෙම රථ සම්බන්ධයෙන් සැපයුම් කරුවන්ට නැවත මිලදී ගැනීමට ඇති හැකියාව පිළිබඳව ද විමසන ලදී. අපනයනය කිරීමේ නැව් ගාස්තු සහ ප්‍රතිචක්‍රීය කිරීමේ වියදම රජය විසින් දරණු ලබන්නේ නම් රථ භාරගත හැකි බව බෙන්ස් මෝටර් රථ නිෂ්පාදන සමාගම දන්වා ඇත.
- එබැවින් පාවිච්චියට ගත නොහැකි තත්ත්වයේ හෝ භාවිතයෙන් ඉවත්කල වෙඩි නොවදින රථ 69ක් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට පවරා දීමට කටයුතු කොට ඇත.
- කාර්මික පුහුණු කටයුතු සඳහා ඔරුගොඩවත්ත කාර්මික පුහුණු ආයතනයට එක් රථයක්ද, ප්‍රභූ ආරක්ෂක පුහුණුවීම් සඳහා විශේෂ කාර්ය බලකාය සඳහා එක් රථයක්ද වශයෙන්ද ලබාදී ඇත.

08. වාහන පවරාදීම

- සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා ආගමන විගමන දෙපාර්තමේන්තුව ඇතුළු රාජ්‍ය ආයතන 16ක් සඳහා වාහන 95ක් පමණ පවරා දීමට කටයුතු කොට ඇත.
- කල්බදු ක්‍රමය යටතේ LOLCආයතනයෙන් ලබාගත් වාහන 76 ක ගිවිසුම් අවලංගු කොට නැවත භාරදී ඇත.
- නාවික හමුදාවේ යාපනය වැඩබිම සඳහා වාහන ලබාදී ඇත.
- ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් වාහන 07ක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් වාහන 14 ක්, ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශයෙන් වාහන 13 ක්, පළාත් පාලන අමාත්‍යාංශයෙන් වාහන 03 ක් හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවෙන් වාහන 03 ක් වශයෙන්, එම ආයතනවල අතිරික්ත වාහන 40ක් පවරාගෙන අලුත් වැඩියා කටයුතු නිම කිරීමෙන් පසුව සේවයට යොදවමින් පවතී.

09. නීති කටයුතු සඳහා උසාවි භාරයට පත්වූ වාහන නැවත ලබාගැනීම

- අස්ථානගතවීම, හදිසි අනතුරු, අවභාවිතය හා විවිධ හේතූන් මත උසාවිවල අත්අඩංගුවට පත් කර ගාල්කර තිබූ වාහනවල නීතිමය ගැටලු නිරාකරණය කර ගැනීමෙන් පසු නැවත සේවයට එකතු කර ගැනීමට හැකි විය.

10. නව මිලදී ගැනීම

- අධි ආරක්ෂිත රථ හා ආපදාවන්ට ලක්වන රථ ප්‍රවාහනය කිරීමට මාසිකව අධික මුදලක් වැය වූ බැවින් ජනාධිපති කාර්යාලය සඳහා Car Carriers 02 ක් මිලදී ගන්නා ලදී. ඒ අනුව පුද්ගලික අංශය වෙත කල ගෙවීම් නතර කර ඇත.
- භාණ්ඩාගාර කල්බදු ක්‍රමය යටතේ නව මිලදී ගැනීම් ලෙස ඩබල් කැබ් රථ 05 ක්, වෑන් රථ 01 හා මෝටර් කාර් රථ 04 ක් ලබා ගත් අතර, එම වාහන කාර්යාලයේ සහ විශේෂ ව්‍යාපෘති අංශයන්හි රාජකාරී වෙනුවෙන් යොදවා ඇත.
- පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය සඳහා වාහන 18 ක් හා යතුරු පැදි 10 ක් ලබා දී ඇත.

11. නව ව්‍යාපෘති සඳහා ප්‍රවාහන පහසුකම් සැලසීම.

- නව ව්‍යාපෘති ලෙස ජනාධිපති කාර්යාලය යටතේ පවතින පිබිදෙමු පොළොන්නරුව, සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති සහ ජාතික කෘෂිව්‍යාපාර සංවර්ධන වැඩසටහන (NADEP) සඳහා අවශ්‍යතා පරිදි රාජකාරී කටයුතු වෙනුවෙන් ප්‍රවාහන පහසුකම් සලසා දෙනු ලැබේ.
- මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසම, භාණ්ඩාගාර බැඳුම්කර පිළිබඳ ජනාධිපති විමර්ෂණ කොමිසම වැනි ආයතන සඳහා ද ප්‍රවාහන පහසුකම් ලබා දී ඇත.
- ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 01/2016 අනුව මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ජනාධිපති කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා වාහන ලබා ගැනීමට තීරණය කර ඇත. ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.

12. විගණන විමසුම් හා වාර්තා අනුව අවශ්‍ය ක්‍රියාමාර්ගයන් අනුගමනය කිරීම.

- විගණන හා කළමනාකරණ රැස්වීමේදී ප්‍රවාහන අංශයේ කටයුතු වඩාත් කාර්යක්ෂමව හා විධිමත්ව කිරීම පිළිබඳ වැදගත් කරුණු සාකච්ඡා කරනු ලැබේ. එම රැස්වීමේදී එළඹෙන තීරණ අනුව කටයුතු කර ප්‍රගතිය වාර්තා කරනු ලැබේ.

නීති අංශය

හැඳින්වීම

මෙම අංශය 2015 මාර්තු මස 18 වන දින පිහිටුවන ලද අතර, ජනාධිපති ලේකම් කාර්යාලය හා සම්බන්ධ සියලුම නීති කටයුතු මෙහෙයවීම හා උපදෙස් ලබා දීම සිදු කෙරේ.

ප්‍රධාන කාර්යයන් / අරමුණු

- අතිගරු ජනාධිපතිතුමන් වගඋත්තරකරු කරමින් ඉදිරිපත් කරනු ලබන මූලික අයිතිවාසිකම් නඩු සහ ජනාධිපති ලේකම් හෝ එම කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් අධිකරණයේ පවරා ඇති නඩු සම්බන්ධීකරණය සහ නියෝජනය කිරීම.
- මෙම ආයතනයේ සෑම අංශයකටම අදාළ නෛතික ගැටලු සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම.
- අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා නිර්දේශ අනුව ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තා සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කිරීම.
- ජනාධිපති කාර්යාලය විසින් වෙනත් පාර්ශ්වයන් සමඟ එළඹෙන්නා වූ ගිවිසුම් අධ්‍යයනය කර නිරීක්ෂණ හා නිර්දේශ ලබාදීම.
- අමාත්‍ය මණ්ඩල අනුකමිටු වෙත යොමු කරන නීති කෙටුම්පත් සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබාදීම.
- අතිගරු ජනාධිපතිතුමා විසින් යොමුකරනු ලබන ගොනු සම්බන්ධයෙන් අදාළ වාර්තා කැඳවා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.
- අමාත්‍ය මණ්ඩලය ජනාධිපති ලේකම් වෙත යොමු කරන නව අණපනත් සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථාවන්හි දී නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

2016 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම්

- 2015 වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ නඩු ගොනු සංඛ්‍යාව - 35
- 2016 වර්ෂයේදී ලැබුණු නඩු ගොනු සංඛ්‍යාව - 24
- මුළු නඩු ගොනු සංඛ්‍යාව - 59

මුළු නඩු ගොනු සංඛ්‍යාව	2015 හා 2016 වර්ෂ තුල අවසන් වූ නඩු ගොනු	තවදුරටත් විභාග වෙමින් පවතින නඩු ගොනු සංඛ්‍යාව
59	24	35



➢ **ජනාධිපති කාර්යාලය විසින් වෙනත් පාර්ශවයන් සමඟ අත්සන් කරන ලද හා අධ්‍යනය කරන ලද 2016 වර්ෂයට අදාළ ගිවිසුම් පිළිබඳ සංක්ෂිප්ත සටහන.**

- චීන තාක්ෂණික කණ්ඩායම වෙත ලබාදී ඇති පැලියගොඩ ගබඩා සංකීර්ණයේ නව ගිවිසුම.
- ජනාධිපති ආරක්ෂක අංශයේ නේවාසික පහසුකම් සඳහා නො. 1, මුදලිගේ මාවතේ අංක 07 ගොඩනැගිල්ලට අදාළ බදු ගිවිසුම.
- කොළඹ 01 ජනාධිපති මාවත අංක 17 දරන ගොඩනැගිල්ල සඳහා ආරක්ෂක සේවාවට අදාළ ගිවිසුම.
- කොළඹ 01 චැතැම් වීදියේ අංක 21 දරන ගොඩනැගිල්ලට අදාළ බදු ගිවිසුම.
- කොළඹ 01 සර් බාරෝන් ජයතිලක මාවතේ අංක 6 දරණ ගොඩනැගිල්ලට අදාළ බදු ගිවිසුම.
- කොළඹ 01 චැතැම් වීදියේ අංක 93 දරන ගොඩනැගිල්ලට අදාළ බදු ගිවිසුම.
- කොළඹ 03 ආර්.ඒ.ද මෙල් මාවතේ පිහිටි වරිපනම් අංක 10/සී දරන ගොඩනැගිල්ලට අදාළ බදු ගිවිසුම.
- කොළඹ 01 ජනාධිපති මාවතේ අංක 41 දරන ගොඩනැගිල්ලට අදාල බදු ගිවිසුම.
- පැජට් පාරේ ජනාධිපති නිල නිවස අසල සනීපාරක්ෂක සේවා සැපයීමේ ගිවිසුම.
- කොළඹ 07 ලොන්ඩන් පෙදෙස අංක 30/75A දරන ගොඩනැගිල්ලට අදාල බදු ගිවිසුම.
- කොළඹ 01 චැතැම් වීදියේ අංක 61 දරන ගොඩනැගිල්ලට අදාළ බදු ගිවිසුම.
- බණ්ඩාරණායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ 5 වන කොටස පළමු මහල සඳහා වන ගිවිසුම.

- ජනාධිපති ලේකම් හා Hayleys Agriculture Holdings Ltd ආයතනය සමඟ අත්සන් කරන ලද ගිවිසුම.
- ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන යටතේ ඇතිකර ගත් ගිවිසුම්
  - නෙල්නා ෆාම් පුද්ගලික සමාගම හා ජනාධිපති කාර්යාලය අත්සන් කරන ලද බඩඉරිඟු ව්‍යාපෘතිය
  - හේලීස් ඇක්වඇග්‍රි පුද්ගලික සමාගම හා ජනාධිපති කාර්යාලය අත්සන් කරන ලද මුහුදු පැළෑටි ව්‍යාපෘතිය
  - සන්ෆ්‍රොස්ට් පුද්ගලික සමාගම හා ජනාධිපති කාර්යාලය අත්සන් කරන ලද බිඟු පාලන ව්‍යාපෘතිය
  - ෆොන්ටෙරා බ්‍රැන්ඩ්ස් ශ්‍රී ලංකා හා වෙලෝ ඩේරි ප්‍රඩක්ට්ස් පුද්ගලික සමාගම හා ජනාධිපති කාර්යාලය අත්සන් කිරීමට නියමිත දියර කිරි ව්‍යාපෘතිය
  - හේලීස් ඇග්‍රෝ ෆාම් පුද්ගලික සමාගම හා ජනාධිපති කාර්යාලය අත්සන් කිරීමට නියමිත බී ළූණු වගා ව්‍යාපෘතිය
  - CIC Grains පුද්ගලික සමාගම හා ජනාධිපති කාර්යාලය අත්සන් කිරීමට නියමිත බඩඉරිඟු ව්‍යාපෘතිය
  - CIC Agri Produce Export (private) Limited හා ජනාධිපති කාර්යාලය අත්සන් කිරීමට නියමිත සෞඛය ආරක්ෂිත වගා ව්‍යාපෘතිය
  - HJS Condiments (Pvt) Limited හා ජනාධිපති කාර්යාලය අත්සන් කිරීමට නියමිත පැෂන් ෆෘට් වගා ව්‍යාපෘතිය
  - ලංකා ඉකෝ ප්‍රඩක්ට්ස් සමාගම හා ජනාධිපති කාර්යාලය අත්සන් කිරීමට නියමිත කිතුල් පැණි හා කිතුල් හකුරු ව්‍යාපෘතිය
  - සී/ස ලංකා පෝල්ට්‍රි ඩිවලොප්මන්ට් සමාගම කුකුළු පාලනය සංවර්ධන ව්‍යාපෘතිය

➢ රේගු දෙපාර්තමේන්තුව විසින් විශේෂ රේගු බද්දක් පනවා ටොයටා ප්‍රාඩෝ (Toyota Prado) වර්ගයේ ජීප් රථ 212 නිදහස් කිරීමෙන් රජයට අලාභයක් සිදුවී ඇත්ද යන්න සොයා බැලීමට අතිගරු ජනාධිපතිතුමාගේ තීරණය පරිදි කමිටුවක් පත් කරන ලදී. එම කමිටුවේ සභාපතිත්වය ජනාධිපති අතිරේක ලේකම් (නීති) ලක්ෂ්මී ජයවික්‍රම මහත්මිය දැරූ අතර සෙසු සාමාජිකයන් ලෙස ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් නාලක කලුවැව මහතා හා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අනුලා හරස්ගම මහත්මිය හා හිටපු නියෝජ්‍ය විගණකාධිපති කේ.ඒ.බී.එස්.නානායක්කාර මහතා පත් කරන ලදී. එම කමිටුව විසින් සියලු සාක්ෂි කැඳවා විශේෂ විමර්ශනයක් පවත්වා එකී විමර්ශනයේ අවසන් වාර්තාව 2016.12.09 වන දින අතිගරු ජනාධිපතිතුමා වෙත භාර දෙන ලදී.



- අධිකරණ සේවයේ විනිශ්චකාරවරුන් සම්බන්ධයෙන් ඔවුන්ගේ ගැටලු සාකච්ඡා කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පවත් වන ලදී. තවද ඔවුන්ගේ ගැටලු සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇත.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

වෛද්‍ය සේවා ඒකකය

හැඳින්වීම

ජනාධිපති ලේකම් කාර්යාලය තුළ පවත්නා වෛද්‍ය සේවා ඒකකය ජනාධිපති ලේකම්තුමා යටතේ ක්‍රියාත්මක වන අතර ගරු ජනාධිපතිතුමාගේ සහ සමීප ඥාතීන්ගේ මෙන්ම ජනාධිපති ලේකම් කාර්යාලයේ නිලධාරීන්ගේ සෞඛ්‍ය යහපත් මට්ටමක පවත්වාගෙන යාමට අවශ්‍ය උපදෙස් සහ ප්‍රතිකාර ලබා දෙනු ලබයි.

තවද,

එයට අමතරව ආර්ථික දුෂ්කරතා සහිත පුරවැසියන්ගේ සෞඛ්‍ය තත්ත්වය නගාසිටුවීමට අවශ්‍ය සහන කටයුතු සැලසුම් කිරීම ද මෙම ඒකකය මඟින් සිදු කරනු ලැබේ.

ප්‍රධාන කාර්යයන් / අරමුණු

- ගරු ජනාධිපතිතුමාගේ රථපෙළ සමඟ ගමන් ගන්නා ගිලන් රථය සක්‍රීය තත්ත්වයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රියාකාරී වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක තත්ත්වයෙන් පවත්වාගෙන යාම.
- එම ගිලන් රථයේ නඩත්තු කටයුතු සහ සැපයුම් පිළිබඳව නිරන්තරයෙන් සොයා බලා අවශ්‍ය කටයුතුවලදී ඒ සඳහා මැදිහත්ව ක්‍රියාකිරීම.
- ගරු ජනාධිපතිතුමාගේ සෞඛ්‍ය කටයුතු මෙරටේ දී මෙන්ම පිටරට තුළදී ද සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා එතුමා සමඟ ගමන් කිරීම.
- කාර්යාලීය නිලධාරීන්ට යහපත් සෞඛ්‍ය තත්වයක් පවත්වාගෙන යාමට අවශ්‍ය දැනුම ලබා දීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කාර්යාලයේ නිලධාරීන්ට වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමට උපදෙස් ලබාදීමටත්, ප්‍රතිකාර කිරීමටත් වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
- කාර්යාලයේ නිලධාරීන්ට විශේෂඥ වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී සෙසු ප්‍රධාන සෞඛ්‍ය ආයතන වෙත යොමු කිරීම.
- කාර්යාලය මඟින් පොදු මහජනතාවගේ සුභසාධනය සඳහා වරින් වර සැලසුම් කර දුෂ්කර ප්‍රදේශවලදී පවත්වනු ලබන සෞඛ්‍ය වැඩසටහන් ගුණාත්මකව පැවැත්වීම සඳහා උපදෙස් හා ක්‍රියාකාරී දායකත්වයන් අවශ්‍ය අවස්ථාවලදී ලබා දීම.
- රටේ අවශ්‍යතාවය අනුව කාලානුරූපීව ඇතිවිය හැකි ඕනෑම සෞඛ්‍ය කටයුත්තක් සඳහා අවශ්‍ය වැඩසටහන් සැලසුම් කර ක්‍රියාවට නැංවීම.

2016 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම්

- අඩු වයස් විවාහ සහ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ ගැටලු සාකච්ඡා කෙරෙන පවුල් උපදේශන වැඩසටහනක් කොටවෙහෙරමංකඩ මහා විද්‍යාලයේ සහ හම්බෙගමුව මහා විද්‍යාලයේ 2016.04.30 වන දින පවත්වන ලදී. (බලංගොඩ වෙලිඔය ප්‍රදේශයේ)





බලංගොඩ වේලිඹය ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නඟාසිටුවීම සඳහා 2016.05.07 වන දින වෛද්‍ය සායන කඳවුරක් පැවැත්වූ අතර එයට සමගාමීව එම ප්‍රදේශයේ ජනතාවට පිරිසිදු පානීය ජලය ලබා දීමේ ව්‍යාපෘතියක් ද ක්‍රියාත්මක කරන ලදී.







ඇසේ සුදු මතුවීමේ රෝගී තත්වයෙන් පීඩා විඳින ආර්ථික දුෂ්කරතාවලින් පෙළෙන ජනතාව සඳහා මුළු දිවයින ම ආවරණය වන පරිදි තෝරාගත් රෝහල් 19ක දී ඇසේ සුදු ඉවත් කිරීමේ ශල්‍යකර්ම දහසක් සිදුකිරීම - 2016.09.02





ජාතික සමගිය හා සංහිඳියා කාර්යාංශය

හැඳින්වීම

ජාතික සමගි කාර්යාලය (ONU) අතිගරු ජනාධිපතිතුමන් යටතේ ස්ථාපිත කොට ඇත්තේ 2015 අප්‍රේල් මස 08 වන දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව, ගරු අග්‍රාමාත්‍යතුමන් විසින් ඉදිරිපත් කරන ලද 2015 ක් වූ මාර්තු මස 25 වන දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය පදනම් කර ගනිමිනි.

ජාතික සමගිය හා සංහිඳියාව පිළිබඳ කාර්යාලය (ONUR) සැලසුම් කොට ඇත්තේ 2015.12.18 වන දින අංක 1945 /41 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ජාතික ඒකාබද්ධතා සහ සංහිඳියාව පිළිබඳ අමාත්‍යාංශය යටතේ ය

සංවිධානාත්මක පරමාර්ථ

(i) විවිධ ප්‍රජාවන් තුළ හා ඒවා අතර පවත්නා පීඩනකාරී ස්වභාවයන් සහ ගැටුම් ඇතිකරන ගැටලු විසඳීමට පියවර ගැනීමට රජයට නිර්දේශ කිරීම හා මෙහෙයවීම.

(ii) අවබෝධය, සමගිය සහ එකමුතු බව සියලු ප්‍රජාවන් අතර ගොඩනංවන සංහිඳියාව සඳහා අවැසි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රජයට අවශ්‍ය සම්පාදනය ලබාදීම සහ නිර්දේශ කිරීම සහ අනතුරුව මෙහෙයවීම.

කාර්ය මණ්ඩල තොරතුරු

තනතුර	**කාර්ය මණ්ඩලය**	**තත්‍ය**	**පුරප්පාඩු**
අධ්‍යක්ෂ ජනරාල්	01	01	-
අධ්‍යක්ෂ / උපදේශක	03	03	
නියෝජ්‍ය අධ්‍යක්ෂ	03	03	
සහකාර අධ්‍යක්ෂ	08	08	
පරිපාලන නිලධාරි	01	01	
ගිණුම් නිලධාරි	01	01	
කළමනාකරණ සහකාර	06	06	-
කාර්යාල කාර්ය සහායක	03	03	-
රියදුරන්	05	03	02
එකතුව	**31**	**29**	**02**

සංවර්ධන ව්‍යාපෘතීන් හි කාර්යසාධනය

2016 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන

අනු. අංකය	මූල්‍යන මූලාශ්‍රය	අගය (රු. මිලියන)
01	මහා භාණ්ඩාගාරය	249.00
02	ඥානම් පදනම	20.78
03	එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP)	19.88
04	බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචිකිරීම් සහ හින්දූ ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය	10.00
එකතුව		**289.66**

ජාතික සමගිය හා සංහිඳියා කාර්යාංශය විසින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

01. ව්‍යාපෘති : ප්‍රතිපත්තිය සහ පර්යේෂණ

අපේක්ෂිත ප්‍රතිඵලය: සංහිඳියාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

කාර්යසාධන දර්ශක: ජාතික සංහිඳියාව පිළිබඳ ප්‍රතිපත්තිය

භෞතික ප්‍රගතිය

- විමර්ශන වාර්තා, උගත් පාඩම් හා සංහිඳියාව පිළිබඳ කොමිසම් සභා වාර්තාව, 2011 - 2016 ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම,
- රජයේ ආයතන හා දෙපාර්තමේන්තු ද ඇතුළුව ප්‍රධාන හා අදාළ පුළුල් - පරාසයක පාර්ශ්වකරුවන් සහ අංශ; සංහිඳියාව පිළිබඳ යාන්ත්‍රණය සම්බන්ධීකරණය කිරීම සඳහා වන ලේකම් කාර්යාලය, සංහිඳියාව පිළිබඳ යාන්ත්‍රණයන් සම්බන්ධීකරණය කරන, ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ මහජන නියෝජන කොමිසම් සභාව, සංහිඳියාව පිළිබඳ උපදේශන කාර්යසාධන බලකාය, ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය, ජාතික සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය, විද්‍යාර්ථීන්, පර්යේෂකයන්, සිවිල් සමාජයීය සාමාජිකයන්, දේශීය හා ජාත්‍යන්තර විශේෂඥයන්, ප්‍රතිපත්ති වැඩමුළු හරහා එක්සත් ජාතීන් හා ජාත්‍යන්තර සංවිධාන වල හානියට පත්වූවන්ගේ නියෝජිතයන්, ඉලක්ක කණ්ඩායම් රැස්වීම් සහ පුද්ගල ප්‍රධාන පුද්ගලයන්ගේ සම්මුඛ සාකච්ඡා සමඟ සබැඳිව සිදු කරන ලද උපදේශනයන්.
- 2017 - 2021 කාලය සඳහා වන ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්මෙහි රජයේ නියමු කමිටුවට සහ රජයේ සම්බන්ධීකරණ කමිටුවට කරන ලද නියෝජනයන්.
- අමාත්‍ය මණ්ඩලය වෙත අතිගරු ජනාධිපතිතුමා විසින් සංහිඳියාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කළ අතර වැඩිදුර සාකච්ඡා පැවැත්වීම සඳහා තීරණය දෙන ලදී.

2016 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදනය: රු. මිලියන 0.28

මූල්‍ය ප්‍රගතිය: රු. මිලියන 0.28





ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා වූ උපදේශාත්මක වැඩමුළුව

02. ව්‍යාපෘති නාමය: සමාජ ඒකාබද්ධතාව සඳහා වන අධ්‍යාපනය

අපේක්ෂිත ප්‍රතිඵලය: සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය හරහා සංහිඳියාව සහ සමාජ ඒකාබද්ධතාව ඒකාත්මක කිරීම සඳහා වන ජාතික හා පළාත් මට්ටමේ ඒකාබද්ධ ප්‍රතිපත්තිය

කාර්යසාධන දර්ශක

(අ) මූලික අධ්‍යනයන් සිදුකර ඇත
(ආ) ප්‍රතිපත්ති රාමුව සම්පූර්ණ කර ඇත
(ඇ)සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන
(ඈ) සම්බන්ධ වූ ශිෂ්‍යයන් ගණන

භෞතික ප්‍රගතිය

- සාමාන්‍ය අධ්‍යාපනය හරහා සමාජ ඒකාබද්ධතාව සහ සංහිඳියාව ඒකාත්මික කිරීම සඳහා අන්තර් - අමාත්‍ය නියමු කමිටුවක් ස්ථාපිත කොට ඇත.
- සමාජ ඒකාබද්ධතාව ක්‍රියාත්මක කිරීම සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම සම්පූර්ණ කොට ඇත.
- උතුරු, නැගෙනහිර, දකුණු, මධ්‍යම, බස්නාහිර සහ සබරගමු පළාත්වල අධ්‍යාපන නිලධාරීන් 160 දෙනෙකු සඳහා සමාජ ඒකාබද්ධතාව පිළිබඳ දින තුනක (3) සංවේදීකරණය (Sensitization) වැඩමුළුවක් පවත්වන ලදී.
- පාසල්වල සමාජ ඒකාබද්ධතාව පිළිබඳ ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම පිළිබඳව පළාත් ප්‍රධාන අමාත්‍යවරුන් සමඟ රැස්වීමක් පවත්වන ලදී.
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේදී (SLIIDA) පාසල්වල සමාජ ඒකාබද්ධතාව සම්බන්ධයෙන් කටයුතු කරන සිවිල් සමාජයීය සංවිධාන සඳහා සංවේදීකරණ වැඩමුළුවක් පැවැත්වීය.
- සිවිල් සමාජයීය සංවිධාන සඳහා සුපුරුදුකරණ වැඩමුළුවක් පවත්වන ලදී.

- ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් 80 ක් සහ ශිෂ්‍යයන් 400 දෙනෙකුගේ සහභාගීත්වයෙන් යුතුව මධ්‍යම, දකුණු සහ නැගෙනහිර පළාත්වල සහෝදර පාසල් වැඩසටහන පැවැත්වීම.

2016 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදනය: රු. මිලියන11.75
මූල්‍ය ප්‍රගතිය: රු. මිලියන 11.71




අධ්‍යාපන නිලධාරීන් සඳහා වූ සංවේදීකරණ වැඩමුළුව

03. ව්‍යාපෘති නාමය: ගැටුම් පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය (අන්තර් විශ්වාසී සංවාදය)

අපේක්ෂිත ප්‍රතිඵලය: ගැටුම් පරිවර්තනය කිරීම හරහා ජාතික එකමුතුව සහ සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම සඳහා අන්තර් විශ්වාසී සංවාද, අන්තර් - වාර්ගික සහ බුද්ධිමය සංවාද ප්‍රවර්ධනය කිරීම.

කාර්යසාධන දර්ශක

(අ) පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව
(ආ) පුහුණු කරන ලද පුහුණුකරුවන් සංඛ්‍යාව
(ඇ) පුහුණු කරන ලද නිලධාරීන් සංඛ්‍යාව
(ඈ) පවත්වන ලද අන්තර් සංස්කෘතික සංවාද සංඛ්‍යාව
(ඉ) බිම් මට්ටමෙන් පවත්වන ලද වැඩමුළු සංඛ්‍යාව

භෞතික ප්‍රගතිය:

- පුහුණුකරුවන් 33 දෙනෙකු පුහුණු කිරීමේ (ToT) දින පහේ වැඩසටහන් 02ක් සම්පූර්ණ කිරීම.
- යාපනය, රත්නපුර සහ අනුරාධපුරයෙහි නියමුකරණ(Orientation) වැඩසටහන් 03ක් පැවැත්වීම.
- පුහුණු කිරීම සඳහා උපාය මාර්ගික සැලසුම සංවර්ධනය කිරීම සඳහා දෙදින වැඩමුළුවක් පවත්වන ලදී.

- බහු ආගමිකයින් 8000ක් සඳහා යාපනය, අනුරාධපුර සහ රත්නපුර දිස්ත්‍රික්කයන්හි එක් දින වැඩමුළු 220ක් සම්පූර්ණ කරන ලදී.
- පුහුණුකරුවන් 28ක් සඳහා දෙදින (2) සමාලෝචන වැඩමුළු පවත්වන ලදී.
- උසස් අධ්‍යාපනය සඳහා සංහිඳියාව පිළිබඳ වැඩසටහන කොළඹ දී දියත් කරන ලදී.

2016 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදනය:රු. මිලියන18.55

මූල්‍ය ප්‍රගතිය: රු. මිලියන18.55





බහු ආගමික නියෝජිතයන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ (ToT) වැඩමුළුව

04 ව්‍යාපෘති නාමය: බහු ආගමික උත්සව

අපේක්ෂිත ප්‍රතිඵලය: බහු - ආගමික හා බහු සංස්කෘතික ශිෂ්‍යයින්ගේ සහභාගීත්වය සහිතව සෑම ආගමකටම අයත් ප්‍රධාන උත්සව සැමරීම.

කාර්යසාධන දර්ශක

(අ) දියත් කරන ලද වැඩසටහන් ගණන
(ආ) සහභාගී වූ ශිෂ්‍යයන් ගණන
(ඇ) සහභාගී වූ පාසල් ගණන

භෞතික ප්‍රගතිය

- දිවයිනේ දිස්ත්‍රික්ක 21 ක පාසල් 1009ක ශිෂ්‍යයන් 47,514ක සහභාගීත්වයෙන් යුතුව තෛපොංගල්, සිංහල දමිළ නව අවුරුද්ද, පොසොන්, රාමදාන් සහ නත්තල් උත්සවය සඳහා බහු - සංස්කෘතික සැමරුම් වැඩසටහන් 133ක් පවත්වන ලදී.

2016 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදනය: රු. මිලියන14.94

මූල්‍ය ප්‍රගතිය:රු. මිලියන14.94






රාමදාන්, සිංහල දමිළ නව වසර සහ පොසොන් උත්සවය සැමරුම සඳහා බහු - ආගමික වැඩසටහන

05. ව්‍යාපෘති නාමය: මනෝ සමාජයීය (Psychosocial) සහාය

අපේක්ෂිත ප්‍රතිඵල

(අ) කඩිනම් මනෝ - සමාජයීය සහාය ලබා දීම සම්බන්ධීකරණය කිරීම සඳහා කාර්යසාධන බලකායක් ස්ථාපිත කිරීම හරහා අර්බුදයෙන් බලපෑමට ලක් වූ ප්‍රජාවන්ට හදිසි මනෝ - සමාජයීය සේවා සැපයීම සඳහා පහසුකම් සැලසීම.

(ආ) මනෝ - සමාජයීය අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා දීර්ඝ කාලීන උපාය මාර්ග වර්ධනය කිරීම.

කාර්යසාධන දර්ශක

(අ) කාර්යසාධන බලකාය ස්ථාපිත කොට මනාව ක්‍රියාකාරීව පවතී.
(ආ) මනෝ සමාජයීය උපදේශනය සඳහා දීර්ඝ කාලීන උපාය මාර්ග වර්ධනය කර ඇත.

භෞතික ප්‍රගතිය

- මනෝ - සමාජයීය සහාය සඳහා වන කාර්ය සාධන බලකාය සම්පූර්ණ කර ඇත.
- මානසික සෞඛ්‍යය සහ මනෝ - සමාජයීය සහාය සඳහා වන ජාතික හා දිස්ත්‍රික් මට්ටමේ සම්බන්ධීකරණ යාන්ත්‍රණ ස්ථාපිත කර ඇත.

- යාපනය දිස්ත්‍රික්කයෙහි උපදේශකයන් සහ වෛද්‍යවරුන් 65 දෙනෙකු සඳහා "ක්ෂතිය සඳහා මනෝ චිකිත්සනය(Trauma & Psychotherapy)" පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී.
- මුලතිවු දිස්ත්‍රික්කයෙහි මානසික සෞඛ්‍යය හා මනෝ සමාජයීය ක්‍රියාකාරීන් 543 දෙනෙකුගේ සහභාගීත්වයෙන් යුතුව "මූලික යොමුවීම සහ සන්නිවේදන නිපුනතා පිළිබඳ හඳුන්වාදීමේ සැසියක්" පවත්වන ලදී. (හෙදියන්, සෞඛ්‍ය සේවා සහායකයින්, පොලිස් නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය උපදේශන සහායකයින් සහ ප්‍රජා සහාය ක්‍රියාකාරීන්).

2016 සඳහා මුල්‍ය ප්‍රතිපාදනය: රු. මිලියන 1.10

මුල්‍ය ප්‍රගතිය:රු. මිලියන 1.10





06. ව්‍යාපෘති නාමය: සංහිඳියාව සඳහා වන කලාව හා සංස්කෘතිය

අපේක්ෂිත ප්‍රතිඵලය:පවත්නා සංහිඳියා ක්‍රියාවලිය සඳහා මෙවලමක් ලෙස කලාව හා සංස්කෘතිය භාවිතා කිරීම.

කාර්යසාධන දර්ශක

(අ) සිදුකරන ලද නිෂ්පාදන සංඛ්‍යාව (චිත්‍රපට, නාට්‍ය, රංග කලාව, චිත්‍ර, සහ කලාව හා සම්බන්ධ නිර්මාණකරණය

භෞතික ප්‍රගතිය

- අශෝක හඳගම මහතා, විමුක්ති ජයසුන්දර මහතා සහ ප්‍රසන්න විතානගේ මහතා විසින් වාර්තා චිත්‍රපට නිෂ්පාදනය කිරීම.
- කාටූන් තරඟයක් පවත්වා ඇති අතර එමඟින් තෝරාගන්නා ලද විශිෂ්ට නිර්මාණ ප්‍රදර්ශනය සඳහා සූදානම් කොට ඇත.
- බහු - ආගමික සහ සංස්කෘතික උත්සව පිළිබඳ අත් පොතක් - මූලික වැඩමුළු විශේෂඥ මඩුල්ලකගේ සහභාගීත්වයෙන් අවසන් කර ඇත.

- උතුරු, නැගෙනහිර සහ බස්නාහිර පළාත් සඳහා WINGS කලාපීය උත්සව ආයතනික සමුළු, ආහාර උළෙල, සහ රංග කලා අංග සහිතව පවත්වන ලදී.
- වේදිකා නාට්‍යය " ආදරණීය සෙනෙහෙබර දරුවෝ" - පෙර දැක්ම පවත්වන ලදී.
- සංහිදියාව පිළිබඳ ගුවන් විදුලි නාට්‍ය මාලාවක් සඳහා වූ ගිවිසුම අවසන් කරන ලදී.

2016 සඳහා මුල්‍ය ප්‍රතිපාදනය: රු. මිලියන18.73

මුල්‍ය ප්‍රගතිය: රු. මිලියන 18.73





WING උත්සවය සඳහා කලාකරුවන් සමඟ සාකච්ඡා කිරීම සහ මාධ්‍ය හමුව

07 ව්‍යාපෘති නාමය: මහජන දැනුම්වත් භාවය සහ බලපෑම

අපේක්ෂිත ප්‍රතිඵලය: විවිධ අමාත්‍යාංශ හා ආයතන සමඟ එක්ව ජාතික සමගිය හා සංහිදියාව සඳහා භාවිතා කරන ලද සන්නිවේදන උපාය මාර්ග සහ මහජන යොමුවීම්.

කාර්යසාධන දර්ශක

(අ) අවබෝධාත්මක උපායමාර්ගික සන්නිවේදන සැලැස්ම ප්‍රවර්ධනය කිරීම
(ආ) උපාය මාර්ගය සමඟ සබැඳි අනෙකුත් අමාත්‍යාංශ ගණන
(ඇ) අන්තර් ක්‍රියාකාරී වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය වේදිකා ස්ථාපිත කිරීම
(ඈ) ජාතික සමගිය සහ සංහිදයාව ප්‍රවර්ධනය කිරීමට සම්පූර්ණ කරන ලද ක්‍රියාකාරකම් සහ වැඩසටහන් ගණන

භෞතික ප්‍රගතිය

- ජාතික සමගිය හා සංහිදියා **කාර්යාංශය** (ONUR) සඳහා වන නිල වෙබ් අඩවිය; www.onur.gov.lk දියත් කරන ලදී.
- ට්විටර් සහ ෆේස්බුක් සමාජ මාධ්‍ය ජාලයන්හි පර්යන්ත / ගිණුම් විධිමත් කරන ලදී.
- ජාතික සමගිය හා සංහිදියාව පිළිබඳ කාර්යාංශය විසින් සහතික කරන ලද වැඩසටහනක් ලෙස 'සික්කා ටීම්' නැමති (සමගිය සහ සංහිදියාව මත පදනම් වූ) සිංහල භාෂා ටෙලි නාට්‍ය මාලාව දියත් කිරීම.
- ''සංහිදියාව පිළිබඳ මාධ්‍ය එකමුතුව" ස්ථාපිත කරන ලදී.

- සන්නිවේදනය පිළිබඳ අන්තර් - අමාත්‍යාංශයීය නියමු කමිටුව දියත් කරන ලදී.
- ජාතික සමගිය හා සංහිඳියාව කාර්යාංශය මඟින් විශේෂිත රූපවාහිනී ඛණ්ඩ ලෙස නිශ්පාදිත තෙ පොංගල් පිළිබඳ වාර්තා වැඩසටහන (සියත රූපවාහිනී), ජාතික සමගිය හා සංහිඳියාව කාර්යාංශයට සම්බන්ධ සිංහල - දමිල නව වසර වැඩසටහන (ස්වාධීන රූපවාහිනිය), නැරඹීමට සැලැස්වීම සහ උතුරු පළාතෙහි පානීය අරමුණ සඳහා වැසි දිය එක්රැස් කිරීම සහ දිස්ත්‍රික් සංවර්ධන සැලසුම්කරණය (ශ්‍රී ලංකා රතු කුරුස සමාජය) පිළිබඳ වැඩසටහන්
- "සහෝදර පාසල් / සහෝදර පාඨසාලෙ'' වැඩසටහන සමඟ ආරම්භ කරන ලද ක්‍රියාකාරකම් වලට සම්බන්ධ වාර්තා කතා සහ සංහිඳියාව පිළිබඳ වාර්තාකරණය News.lk හරහා රජයේ තොරතුරු දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය වීම.
- ශ්‍රී ලාංකේය අගනාකම් පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීමේ ව්‍යාපාරයක් සකස් කිරීම මෙන්ම ආකල්ප වෙනස් කිරීමේ කර්තව්‍යයක් ලෙස ජාතික සමගිය හා සංහිඳියා කාර්යාංශය (ONUR) විසින් පහසුකම් සලසන ලද වැඩමුළුවක් සහ උපදේශන සැසියක් සම්පූර්ණ කරන ලදී.
- ජාතික සමගිය හා සංහිඳියා කාර්යාංශය හා සබැඳි මාධ්‍ය ප්‍රකාශ / නිවේදන ආවරණය කෙරෙන කටයුතු 23 ට අතිරේකව ප්‍රධාන පුවත්පත් සම්මේලන තුනක් සහ වෙනත් මාධ්‍ය සමුළු 06 ක් පවත්වන ලදී.
- ජාතික සමගිය හා සංහිඳියා කාර්යාංශයහි "සන්හිඳ" නිළ ප්‍රවෘත්ති ප්‍රකාශය ප්‍රකාශයට පත් කරන ලදී.
- 'සන්හිඳ' ෆේස්බුක් සංවාද කණ්ඩායමක් සකස් කොට යාවත්කාල කරන ලදී. (මේ වන විට සාමාජිකයන් සංඛ්‍යාව 1300කි).
- 'සන්හිඳ' ප්‍රවෘත්ති ප්‍රකාශය යාවත්කාල කරමින් සහ නඩත්තු කරමින්, ජාතික සමගිය හා සංහිඳියාව පිළිබඳ කාර්යාංශය සම්බන්ධ ප්‍රවෘත්ති අයිතම පතුරුවා හැරීමට සැලසුම් කිරීම, සාමාජිකයන් රැස් කිරීම, ෆේස්බුක් පිටුව සියලු දේශීය හා විදේශීය නිල ෆේස්බුක් පිටු සමඟ සම්බන්ධ කිරීම (රජයේ, රජයේ - නොවන, අන්තර්ජාතික රාජ්‍ය - නොවන සංවිධාන, සහ විද්වත් දූත කණ්ඩායම් සහ මාධ්‍ය ආයතන). (මේ වන විට සාමාජික සංඛ්‍යාව 400 කි)

2016 වර්ෂයට මුල්‍ය ප්‍රතිපාදනය: රු.මිලියන 1.18

මුල්‍ය ප්‍රගතිය: රු.මිලියන 1.18





රූපවාහිනී බාණ්ඩ



"සික්කා " රූපවාහිනී නාට්‍යය දියත් කිරීමේ වැඩසටහන



සංහිඳියාව පිළිබඳ මාධ්‍ය එකමුතුව



www.news.lk හරහා රජයේ තොරතුරු දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව



ජාතික සමගිය හා සංහිඳියාව පිළිබඳ කාර්යාලය (ONUR)මඟින් පහසුකම් සලසන ලද වැඩමුළුව සහ උපදේශන සැසිය

8. ව්‍යාපෘති නාමය: සංහිඳියාව සඳහා කාන්තාවෝ

අපේක්ෂිත ප්‍රතිඵල: අර්බුදයෙන් පීඩාවට පත් කාන්තාවන් සඳහා සමාජ ආරක්ෂාව සහතික කිරීමට සැලසුම් කරන ලද ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.

කාර්ය සාධන දර්ශක

(අ) සංහිඳියාව සඳහා කාන්තාවෝ යන මැයෙන් යුතු වැඩරාමුවක් සංවර්ධනය කරන ලදී.
(ආ) පරතර විශ්ලේෂණ (Gap Analysis) වාර්තාව
(ඇ) පවත්වන ලද ජංගම සේවා ප්‍රමාණය
(ඈ) පුද්ගල හා සමාජ ආරක්ෂණයට සම්බන්ධව සවන් දුන් ගැටළු ප්‍රමාණය
(ඉ) හඳුනාගන්නා ලද පුද්ගල සහ සමාජ ආරක්ෂණයට සම්බන්ධ අවශ්‍යතා ගණන

භෞතික ප්‍රගතිය

- සංහිඳියාව සඳහා කාන්තාවෝ යන මැයෙන් යුත් වැඩරාමුව වර්ධනය කිරීම සඳහා වැඩමුළුවක් පවත්වන ලදී.
- කාන්තා කටයුතු වල නියැලි ක්‍රියාකාරීන් වන සංවර්ධන පාර්ශවකරුවන් සමඟ රැස්වීමක් පැවැත්වීම.
- පරතර විශ්ලේශණය සම්පූර්ණ කොට කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය වෙත වාර්තාව ඉදිරිපත් කිරීම.
- කිලිනොච්චි දිස්ත්‍රික්කයෙහි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 ක කාන්තා බලගැන්වීමේ වැඩසටහන් (ජංගම සේවාවන්) 4ක් පවත්වන ලද අතර පුද්ගලයන් 2594 ට සිය මූලික ලිපි ලේඛන ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම (උප්පැන්න සහතික 1101ක්, පොලිස් වාර්තා 178 ක්, ආගමන කටයුතු 15 ක්, ජාතික හැඳුනුම්පත් 975 ක්) සහ අනෙකුත් පොදු සේවා (විශ්‍රාම කටයුතු හා සම්බන්ධ 59, ජීවනෝපාය සහාය අවශ්‍යතා 618) සමඟ සම්බන්ධ වීම සිදුකරන ලදී.
- ජංගම වැඩසටහන් මඟින් ඉල්ලුම් කරන ලද ජීවනෝපාය සහාය අවශ්‍ය පුද්ගලයින් 99 සඳහා කර්මාන්ත සංවර්ධන මණ්ඩලය මඟින් ව්‍යාපාරික සැලසුම් සැකසීම සඳහා කිලිනොච්චි දිස්ත්‍රික්කයෙහි වැඩසටහනක් පවත්වන ලදී. ඉන් ප්‍රතිලාභීන් 92 ක් විසින් සිය ව්‍යාපාරික සැලසුම් සම්පූර්ණ කොට ඒවා කර්මාන්ත සංවර්ධන මණ්ඩලය වෙත යොමු කරන ලදී.

2016 වර්ෂය සඳහා මුල්‍ය ප්‍රතිපාදනය: රු. මිලියන 1.18

මුල්‍ය ප්‍රගතිය: රු. මිලියන 1.18





කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පැවති ජංගම සේවය




පූනගරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවත්වන ලද ජංගම සේවය සඳහා සහභාගීවූවන්




ව්‍යාපාර සංවර්ධන සැලසුම් සකස් කිරීමේ වැඩසටහන

09. ව්‍යාපෘති නාමය: භාෂා වැඩසටහන

අපේක්ෂිත ප්‍රතිඵලය:ද්වි භාෂා හා ත්‍රෛභාෂා ශක්‍යතාවෙන් යුත් සම්පත් පුද්ගලයන්ගේ දිස්ත්‍රික් මට්ටමේ දත්ත පාදමක් (Data base) ස්ථාපිත කිරීම

කාර්යසාධන දර්ශක

(අ) ද්වි භාෂා හා ත්‍රෛභාෂා ශක්‍යතාවෙන් යුත් සම්පත් පුද්ගලයන්ගේ දිස්ත්‍රික් මට්ටමේ දත්ත පාදමක් ස්ථාපිත කරන ලදී.

භෞතික ප්‍රගතිය

- "ජාතික සමගිය සහ සංහිඳියාව සඳහා වන කාර්යාංශය මඟින් දිස්ත්‍රික් මට්ටමින් ද්වි භාෂා / ත්‍රෛ භාෂා නිපුනතා සහිත සම්පත් පුද්ගලයන්ගේ දත්ත පාදමක් ස්ථාපිත කිරීම" යන මැයෙන් යුතුව අතිගරු ජනාධිපතිතුමන් විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර මුදල් අමාත්‍යාංශය, සහ සහජීවනයෙන් ජීවත් වීම, සංවාදය සහ රාජ්‍ය භාෂා අමාත්‍යාංශය යන අමාත්‍යාංශයන් හි නිරීක්ෂණ සමඟ 2016 මාර්තු මස 30 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් එයට අනුමැතිය ලබා දෙන ලදී.

- දිවයිනේ දිස්ත්‍රික්ක 25 න්ම අයදුම්පත්‍ර 1426 ලද අතර ඉන් පුද්ගලයන් 301 දෙනෙකු ද්වි භාෂා / ත්‍රෙ භාෂා ශක්‍යතාවෙන් යුත් වූවන් ලෙස රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද ලිඛිත හා වාචික පරීක්ෂණයක් හරහා තෝරා ගන්නා ලදී.
- යෝග්‍ය භාෂා පරිවර්තයෙකු තෝරා ගැනීම සඳහා භාවිතා කළ හැකි වන පරිදි;www.bashawa.lkවෙබ් අඩවිය ආරම්භ කරන ලදී.
- 26 / 2016 අංක දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයක් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති අතර ඉන් වෙබ් අඩවියෙහි පහසුකම් ලබා දීම සම්බන්ධ තොරතුරු අන්තර්ගත වී ඇත.

2016 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදනය :රු. මිලියන 3.62

මූල්‍ය ප්‍රගතිය : රු. මිලියන 3.62



පවත්වන ලද ලිඛිත පරීක්ෂණය සඳහා ලියාපදිංචිය



ලිඛිත භාෂා වැඩසටහන



රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද වාචික පරීක්ෂණය



ද්වි භාෂා / ත්‍රෙ භාෂා පහසුකම් සපයන්නවුන්ගේ සංචිතයක් දියත් කිරීම



රාජ්‍ය භාෂා කොමසාරිස් සහ ONUR අතර පැවති සාකච්ඡාව



www.bashawa.lk වෙබ් අඩවිය

10. ව්‍යාපෘති නාමය: වැසි ජලය එක්රැස් කිරීමේ ව්‍යාපෘතිය (Rain Water Harvesting)

අපේක්ෂිත ප්‍රතිඵලය:

(අ) උතුරු ප්‍රදේශයෙහි පවත්නා උග්‍ර පානීය ජල හිඟය සඳහා අන්තර්කාලීන විසඳුමක් ලෙස කිලිනොච්චි හා යාපනය දිස්ත්‍රික්කයන් හි වැසි ජලය එක්රැස් කිරීමේ ඒකක 500ක් සම්පූර්ණ කිරීම.

කාර්යසාධන දර්ශක

(අ) සම්පූර්ණ කරන ලද වැසි ජල එක්රැස් කිරීමේ ඒකක ගණන

භෞතික ප්‍රගතිය:

- වැසි ජල එක්රැස් කිරීමේ ඒකක 491ක් සම්පූර්ණ කරන ලදී

2016 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදනය: රු. මිලියන 9.61

මූල්‍ය ප්‍රගතිය:රු. මිලියන 9.61





යාපනය සහ කිලිනොච්චි ප්‍රදේශයන් හි වැසිජල එක්රැස් කිරීමේ ඒකක ස්ථාපිත කිරීමට පෙර හා පසු

11. ව්‍යාපෘති නාමය: උතුරු හා නැගෙනහිර පළාත්වල ආර්ථිකයට යොමුවීමේ වැඩසටහන

අපේක්ෂිත ප්‍රතිඵල

(අ) උතුරු සහ නැගෙනහිර පළාත්වල දිස්ත්‍රික්ක 8 ක් සඳහා ඒකාබද්ධ දිස්ත්‍රික් සංවර්ධන සැලසුම් (DDPs) සකස් කිරීම

(ආ) ජීවනෝපාය සහ අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය හරහා දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම

කාර්යසාධන දර්ශක

(අ) සම්පූර්ණ කරන ලද දිස්ත්‍රික් සංවර්ධන සැලසුම් (DDPs) ගණන
(ආ) ක්‍රියාත්මක කරන ලද ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ගණන
(ඇ) සම්පූර්ණ කළ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ගණන
(ඈ) ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව

2016 වර්ෂය සඳහා මුල්‍ය ප්‍රතිපාදනය: රු. මිලියන199.00

මුල්‍ය ප්‍රගතිය: රු. මිලියන199.00





යාපනය දිස්ත්‍රික්කයෙහි අන්නාසි වගා කිරීමේ නියමු ව්‍යාපෘතිය සහ උතුරු පළාතෙහි ආර්ථික යොමුවීම ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධන නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන

ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

හැඳින්වීම

2015.03.06 දිනැති අංක 1904/57 අති විශෙෂ ගැසට් පත්‍රයෙන් බරපතල වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය සහ අධිකාරිය අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා මෙම කොමිෂන් සභාව පිහිටුවන ලදී.

2016 මාර්තු 24 දින වන විට පෙත්සම් 1,599 ක් කොමිෂම වෙත ලැබී තිබූ අතර 2016 මාර්තු 24 වන දිනෙන් පසු අලුතින් පෙත්සම් භාර ගැනීම අත්හිටුවීමට කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී.

2015.03.06 දිනැති අංක 1904/57 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ සඳහන් නියෝගයට අනුව මෙම පෙත්සම් විග්‍රහ කරන ලදී.

- කොමිෂන් සභාවේ විධි නියෝගයට අනුව රාජ්‍ය වත්කම් හා ආදායමට අලාභ හෝ හානි සිදුවීමක් අනාවරණය නොවන හෙයින් පෙත්සම් 1180 ක් සම්බන්ධව වැඩිදුරටත් කටයුතු නොකිරීමට තීරණය කර ඇත.
- කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් වෙත විමර්ශනය කිරීම සඳහා යොමු කරන ලද පැමිණිලි සංඛ්‍යාව 400 කි.
- කොමිෂන් සභාව විසින් සලකා බැලීමට තවත් පැමිණිලි 11 ක් ඇත.
- කොමිෂන් සභාව විසින් සලකා බලා නොමැති පෙත්සම් සංඛ්‍යාව 08 කි.